# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 අගෝස්තු මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 අගෝස්තු මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 252.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 45 දරන
# ආර්ථික පරිවර්තන පනත

[සහතිකය සටහන් කළේ 2024 අගෝස්තු මස 09 වන දින]

එල්.ඩී.-ඕ. 21/2024

**ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා විධිවිධාන සැලසීම සඳහා සහ ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව, සහ ශ්‍රී ලංකා ආයෝජන කලාප, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම සඳහා ද; ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

තාක්ෂණික වැඩිදියුණුවීම්, වෙනස්වන ජනවිකාසයන් සහ නැගී එන පාරිසරික අභියෝග මගින් සංලක්ෂිතව ගෝලීය ආර්ථික වටපිටාව කඩිනමින් විකාසනය වන බැවින් දඃ

පොදු ආර්ථික අභියෝගවලට පිළිතුරු සෙවීමේ දී ජාතික ආර්ථිකයන්හි අන්තර් සබඳතාවය සහ ජාත්‍යන්තර සහයෝගීතාවයෙහි වැදගත්කම පිළිගනු ලබන හෙයින් දඃ

තිරසර සංවර්ධනය අභිවර්ධන කිරීම, සශ්‍රීකත්වය වැඩි කිරීම, ඵලදායිතාවය නැංවීම, සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ සියලු පුරවැසියන්ට සමාන අවස්ථා සහතික කිරීම සඳහා ආර්ථික පරිවර්තනය වැදගත් වන හෙයින් දඃ

ඉලක්කගත මැදිහත්වීම්, යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම සහ අත්‍යවශ්‍ය පොදු සේවා සැපයීම ඇතුළු ආර්ථික පරිවර්තනය සඳහා ශක්‍යතාවය සහිත පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා ශ්‍රී ලංකා ආණ්ඩුවේ කාර්යභාරය තේරුම් ගෙන ඇති හෙයින් දඃ

ආර්ථික වර්ධනය මෙහෙයවීමේ දී, රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ දී සහ නවෝත්පාදනය සහ තාක්ෂණික දියුණුව වැඩිදියුණු කිරීමේ දී ආයෝජනයෙහි තීරණාත්මක කාර්යභාරය පිළිගන්නා හෙයින් දඃ

දේශීය හා විදේශීය යන දෙවර්ගයේ ම ආයෝජකයන්ට සාධාරණ සහ සමාන ලෙස සැලකීම ප්‍රවර්ධනය කරන විනිවිදභාවයෙන් යුතු, සම්පූර්ණ සහ රීති මත පදනම් වූ පද්ධතියක් අභිවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව කැප වී සිටින බවට සහතික වන හෙයින් දඃ

ආර්ථික වර්ධනය, තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකයන් ලෝක වෙළෙඳපොළට ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳාමෙහි ඇති වැදගත්කම පිළිගනු ලබන හෙයින් ද:

ආයෝජනය, පුළුල් වෙළෙඳ අවස්ථා සහ වෙළෙඳ ගිවිසුම් පිළිබඳ ගිවිසගැනීම් සඳහා හිතකර පරිසරයක් සපයනු ලබන සහ ආර්ථික වර්ධනය පුබුදු කිරීම පිණිස ආනයන-අපනයන ක්‍රියාකාරකම්වලට පහසුකම් සලසනු ලබන නීති සම්පාදනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව තේරුම් ගෙන ඇති හෙයින් ද:

ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභය සඳහා අවස්ථා ලබා දීම සඳහා වූ ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සහයෝගය පිණිස ශ්‍රී ලංකාව කැප වී සිටින බව නැවත තහවුරු කරනු ලබන හෙයින් ද:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධාන සලසා ඇති පරිදි ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සමාජයේ අරමුණු සැලකිල්ලට ගනිමින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) II වන කොටසේ, III වන කොටසේ සහ 193 වන වගන්තියේ විධිවධාන හැර මේ පනතේ අනෙකුත් විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාර මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) II වන කොටසේ, III වන කොටසේ සහ 193 වන වගන්තියේ විධිවිධාන, (2) වන උපවගන්තියේ සඳහන් පරිදි කථානායකවරයාගේ සහතිකයේ දින සිට මාස තුනක් ඇතුළත වන දිනයක් විය යුතු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී බලාත්මක විය යුතු ය.

I වන කොටස

I වන පරිච්ඡේදය

**ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අරමුණු

**2.** ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු යः-

(අ) ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස ද ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද, විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්ථා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයින්ට අත්කර දීම;

(ආ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාකාරකම්, රටේ සමාජ අරමුණු සහ පොදු අභිවෘද්ධිය අරභයා මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස යෝග්‍ය වන සැලසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් මුළු රටේ ම ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම; සහ

(ඇ) ආර්ථික අර්බුද ඇති වීම වැළැක්වීම.

ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**3.** (1) ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින්-

(අ) (i) දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ණය අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට අනූ පහකට වඩා අඩු වන පරිදි;

(ii) දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට දහතුනකට වඩා අඩු වන පරිදි; සහ

(iii) දළ දේශීය නිෂ්පාදිතයට විදේශ ව්‍යවහාර මුදලින් වන මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික ණය සේවාකරණ අනුපාතය 2027 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට හතරයි දශම පහකට වඩා අඩු වන පරිදි,

ආණ්ඩුව විසින් ගෙවිය යුතු ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා; සහ

(ආ) (i) තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා ජාතික ආර්ථිකය විවිධාංගීකරණය කිරීම සහ දැඩි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම;

(ii) 2050 වර්ෂය වන විට ශුද්ධ ශූන්‍යයක් (නෙට් සීරෝ) ළඟා කර ගැනීම;

(iii) ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම වර්ධනය කිරීම;

(iv) ස්ථාවර සාර්ව ආර්ථික තුලනයක් සහ තිරසර ණය සාක්ෂාත් කර ගැනීම;

(v) ගොවීන්ගේ ඵලදායීතාවය, ගොවීන්ගේ ආදායම සහ කෘෂිකාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා කෘෂිකර්මය නවීකරණය කිරීම; සහ

(vi) පූර්ණ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම,

ඇතුළත් ව, ශ්‍රී ලංකාව ඉහළ තරඟකාරිත්වයක් සහිත, අපනයනය වෙත යොමු වූ, ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා,

විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "ශුද්ධ ශූන්‍යය (නෙට් සීරෝ)" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන හරිතාගාර වායු ප්‍රමාණය සහ වායු ගෝලයෙන් ඉවත් කළ හරිතාගාර වායු ප්‍රමාණය අතර ශේෂය අදහස් වේ.

ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය සතු කාර්යය

**4.** පහත දැක්වෙන ඉලක්ක මත ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පදනම් කර ගැනීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ විධානය හා පාලනය භාරව සිටින අමාත්‍ය මණ්ඩලයේ කාර්යය විය යුතු යඃ-

(අ) දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය-

(i) 2027 වර්ෂය වන විට වාර්ෂිකව සියයට පහක් දක්වා ළඟා වීම; සහ

(ii) ඉන් පසුව වාර්ෂිකව සියයට පහකට වඩා ඉහළ මට්ටමකට ළඟා වීම;

*පැහැදිලි කිරීම*

2027 වර්ෂය, අර්බුදය ආරම්භ වී අවුරුදු පහක් ගත වීම සනිටුහන් කරනු ඇත. ශ්‍රී ලංකාවේ ධනාත්මක ප්‍රතිසාධනය 2027 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමක් ඇතුළත් විය යුතු ය. 2048 වර්ෂය වන විට උසස් ආර්ථික තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා, 2030 වර්ෂයට පසුව ආර්ථික වර්ධනය සියයට පහකට වඩා ඉහළ මට්ටමක් දක්වා වේගවත් කළ යුතු ය.

(ආ) 2025 වර්ෂයේ සිට විරැකියාව, ශ්‍රම බලකායෙන් සියයට පහකට වඩා අඩු මට්ටමකට ළඟා වීම;

*පැහැදිලි කිරීම*

ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය දර්ශීය වශයෙන් අඩු අගයක පවතින අතර සියයට පහක ඉලක්කගත අනුපාතය එය එම මට්ටමින් පවත්වාගෙන යනු ඇත.

(ඇ) කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය-

(i) 2030 වර්ෂය වන විට සියයට හතලිහකට නොඅඩු මට්ටමක් වෙත ළඟා වීම; සහ

(ii) 2040 වර්ෂය වන විට සියයට පනහකට නොඅඩු මට්ටමක් වෙත ළඟා වීම;

*පැහැදිලි කිරීම*

කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා වූ පියවර මගින් ශ්‍රම ඵලදායිතාව සහ ආර්ථිකයේ වර්ධනය සැලකිය යුතු ලෙස වැඩිකිරීමේ හැකියාව ඇත.

(ඈ) ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ හිඟය වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට එකක් නොඉක්මවිය යුතු වීම;

*පැහැදිලි කිරීම*

දිගටම පවතින ජංගම ගිණුම් අතිරික්ත මගින් තිරසර පදනමක් මත විදේශ ණය සේවාකරණයෙහි බැඳීම් කළමනාකරණය කර ගැනීමට ශ්‍රී ලංකාවට උපකාරී වනු ඇත. එසේ වුව ද, යම් වර්ෂයක දී ජංගම ගිණුමේ හිඟයක් ඇති වුවහොත් මේ හිඟය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට එකකට වඩා අඩු ප්‍රමාණයකට සීමා විය යුතු ය.

(ඉ) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයනය කිරීම-

(i) 2025 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට විසිපහකට නොඅඩු මට්ටමකට ළඟා වීම;

(ii) 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හතලිහකට නොඅඩු මට්ටමකට ළඟා වීම; සහ

(iii) 2040 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හැටක මට්ටමකට ළඟා වීම;

*පැහැදිලි කිරීම*

අභ්‍යන්තරය කෙරෙහි යොමු වූ ආර්ථිකයක සිට බාහිරට යොමු වූ ආර්ථිකයක් දක්වා ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හතලිහක ඉලක්කයක් අවශ්‍ය වේ.

(ඊ) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ ඍජු විදේශ ආයෝජන-

(i) 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහකට නොඅඩු මට්ටමකට ළඟා වීම; සහ

(ii) 2030 වර්ෂය වන විට ශුද්ධ ඍජු විදේශ ආයෝජනවලින් අවම වශයෙන් සියයට හතලිහක්වත් භාණ්ඩ අපනයනය හෝ සේවා අපනයනය මගින් වන මට්ටමකට ළඟා වීම; සහ

*පැහැදිලි කිරීම*

ආර්ථිකය වෙත ණය ඇති නොකරන මුදල් ලැබීමේ ප්‍රවාහයන් වර්ධනය කර ගැනීම සඳහා සහාය වීම පිණිස අපනයනය වෙත යොමු වූ ඍජු විදේශ ආයෝජනවලට මාරු විය යුතු ය.

(උ) 2032 වර්ෂය දක්වා ආණ්ඩුවේ අයවැයේ ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දෙකයි

දශම තුනක මට්ටමකට සහ 2032 වර්ෂයේ සිට ඉදිරියට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට දෙකක මට්ටමකට ළඟා වීම;

*පැහැදිලි කිරීම*

එවැනි ආර්ථික අර්බුදයක් නැවත ඇති වීම වැළැක්වීම සඳහා ආණ්ඩුවේ අයවැය තුළ දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට දෙකක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යන බවට සහතික වීම අත්‍යවශ්‍ය වේ.

(ඌ) 2027 වර්ෂයෙන් ඉදිරියට ආණ්ඩුවේ ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට පහළොවක මට්ටමකට ළඟා වීම; සහ

*පැහැදිලි කිරීම*

ශක්තිමත් දේශීය සම්පත් බලමුළු ගැන්වීමක් පවත්වාගෙන යාම.

(එ) 2027 වර්ෂය වන විට බහුමාන ජනගහන දරිද්‍රතා අනුපාතය සියයට පහළොවකට වඩා අඩු විය යුතු අතර, 2035 වර්ෂය වන විට එය සියයට දහයකට වඩා අඩු විය යුතු වීම.

*පැහැදිලි කිරීම*

ආර්ථික පරිවර්තනය හරහා පූර්ණ වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා (අධ්‍යාපනය, සෞඛ්‍යය සහ නිවාස සහ මූලික සේවා සඳහා ප්‍රවේශය ඇතුළුව) බහුමාන ජනගහන දරිද්‍රතාවය අඩු කිරීම.

ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රමෝපායයන් පිළිබඳ වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය විසින් පිළියෙල කළ යුතු බව

**5.** (1) 3 වන සහ 4 වන වගන්තිවල සඳහන් පරිදි වන ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා 2025 වර්ෂයෙන් ආරම්භ වී සෑම වසර පහකට වරක් අමාත්‍ය මණ්ඩලය විසින් (යෝජිත නීති ඇතුළුව) ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රමෝපායයන් පිළිබඳ වාර්තාවක් පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට ජනාධිපතිවරයා විසින් සහතික විය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලය විසින්, කලින් කල, ඒ වාර්තාව ප්‍රතිශෝධනය කර ඒ ප්‍රතිශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(3) ආර්ථික ප්‍රතිපත්තිය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, ස්ථාවර නියෝගවලට අනුකූලව ඒ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පළමු වාර්තාව 2025 වර්ෂයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ ප්‍රතිපත්ති, ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූල විය යුතු බව

**6.** ආණ්ඩුවේ සියලු ප්‍රතිපත්ති, වැඩසටහන්, නියෝග, චක්‍රලේඛ සහ විධාන, ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.

ප්‍රතිපත්තියේ ප්‍රධාන ඉලක්ක ඉටුකර ගැනීම සඳහා වූ කැපවීම සහ ඉලක්කවලින් වෙනස්ව කටයුතු කිරීම සඳහා ගනු ලබන ප්‍රතිකර්ම පියවර

**7.** (1) ආණ්ඩුව විසින්, ආර්ථික ප්‍රතිපත්තිය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා මගින්, ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ එක් එක් ඉලක්ක ඉටුකර ගැනීම සඳහා ගනු ලැබ ඇති පියවර, එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි පළමු වාර්තාව, මේ කොටස ආරම්භ වන දිනයේ සිට වර්ෂයක් ඉකුත් වීමෙන් ඉක්බිතිව ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉලක්කය සපුරා නොමැති අවස්ථාවක දී, ඒ තත්ත්වය සඳහා ප්‍රතිකර්ම යෙදීම පිණිස ගනු ලැබූ පියවර පිළිබඳව ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු අතර, ඉලක්කය සපුරා ගනු ලබන්නේ කවදා ද යන්න පිළිබඳව පෙන්වා දිය යුතු ය. ඉලක්ක සපුරාලීම සඳහා ප්‍රබල කැපවීමක් ඇති බව සහ සම්පූර්ණ ක්‍රමෝපායයක් ඇති බව ප්‍රතිකර්ම පියවරවලින් පිළිඹිබු කළ යුතු අතර එය අනුගම්‍ය කොන්දේසියක් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ අධීක්ෂණ පාලනය

**8.** අමාත්‍ය මණ්ඩලය විසින් මේ පනත යටතේ ස්වකීය බලතල සහ වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍ය මණ්ඩලයේ අධීක්ෂණ පාලනය, 43 වන ව්‍යවස්ථාව සහ 148 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පාර්ලිමේන්තුව සතු විය යුතු ය.

නියෝජ්‍යායතන විසින් ආණ්ඩුවට සහාය විය යුතු බව

**9.** ජාතික ආර්ථික පරිවර්තනය සඳහා වූ කඩිනම් වර්ධනය පිළිබඳ අරමුණු ඉටු කර ගැනීමේ දී පහත දැක්වෙන නියෝජ්‍යායතන ආණ්ඩුවට සහාය දැක්විය යුතු ය:-

(අ) 11 වන වගන්තිය මගින් පිහිටුවන ලද ආර්ථික කොමිෂන් සභාව;

(ආ) 61 වන වගන්තිය මගින් පිහිටුවන ලද සෝන්ස් එස්එල්;

(ඇ) 99 වන වගන්තිය මගින් පිහිටුවන ලද ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය;

(ඈ) 132 වන වගන්තිය මගින් පිහිටුවන ලද ජාතික ඵලදායිතා කොමිෂන් සභාව; සහ

(ඉ) 162 වගන්තිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය.

## II වන කොටස

### II වන පරිච්ඡේදය

### මේ කොටස අදාළ වීම

මේ කොටස අදාළ වීම

**10.** (1) මේ කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාවේ ආයෝජනවලට සහ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ විය යුතු ය.

(2) මේ කොටසේ විධිවිධාන, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපයට අදාළ නොවිය යුතු ය.

### III වන පරිච්ඡේදය

### ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම

ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම

**11.** (1) (මේ පනතේ "ආර්ථික කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආර්ථික කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය යටතේ එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ තිබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් යම් ශාඛා කාර්යාලයක් හෝ වෙනත් නියෝජනයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවනු ලැබිය හැකි ය.

ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු

**12.** ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු යː-

(අ) ශක්තිමත් ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා, අපනයන වැඩි කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳාම දිරිමත් කරනු ලබන තිරසර ඍජු විදේශ ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා දායක වීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ආයෝජන කලාප සඳහා ඇති අවශ්‍යතාව ඇගයීම සහ සෝන්ස් එස්එල් හෝ III වන කොටස මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද වෙනත් යම් අස්ථිත්වයක් වෙත එවැනි ආයෝජන කලාප ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මාර්ගෝපදේශ සහ නියාමන අධීක්ෂණය සැපයීම;

(ඇ) ආයෝජකයන්, ආයෝජන සහ අපනයනකරුවන් සඳහා ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සහ එසේ කිරීමේ හැකියාව ඇති කිරීම;

(ඈ) ඍජු විදේශ ආයෝජන මගින්, භාණ්ඩ සහ සේවා අපනයනය කිරීම මගින් සහ ශ්‍රී ලංකාව තුළ මහා පරිමාණයේ රැකියා අවස්ථා ඇති කිරීම මගින් ශ්‍රී ලංකාව තුළට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ගලා ඒම ඇතුළත් වන සහ ආර්ථිකයේ සමස්ත වර්ධනය සඳහා සැලකිය යුතු ප්‍රතිලාභ අත්කර දෙන උපායමාර්ගික වැදගත්කමකින් යුතු ආයෝජන තීරණය කිරීම;

(ඉ) (ඈ) ඡේදය යටතේ උපායමාර්ගික වැදගත්කමකින් යුතු බවට ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වන දිරිගැන්වීම් සමාලෝචනය කර ඒ පිළිබඳව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඊ) ආයෝජන සිදු කිරීමට හැකියාව ඇති වනු පිණිස පහසු සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් සඳහා පහසුකම් සැලසීම;

(උ) ආයෝජන සඳහා පහසුකම් සැලසීම මගින් සහ අපනයන වැඩි කිරීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම දිරිමත් කරන ප්‍රතිපත්ති සකස් කර එමගින් විදේශ

විනිමය මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම සහ අපනයන ආදායම් වැඩි කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සහ ඒ ප්‍රතිපත්ති අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීම; සහ

(ඌ) ශ්‍රී ලංකාව තුළ කාර්මික සහ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම ධෛර්යමත් කිරීම සහ අභිවර්ධනය කිරීම.

ආර්ථික කොමිෂන් සභාවේ බලතල

13. ආර්ථික කොමිෂන් සභාව විසින්, ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කළ යුතු ය:-

(අ) ආයෝජන කලාප ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ සකස් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම;

(ඇ) ආයෝජන, ජාත්‍යන්තර වෙළෙඳාම සහ අපනයන වලට අදාළ ප්‍රතිපත්ති, නීති සහ නියෝග සමාලෝචනය කිරීම සහ නීති සහ නියෝග නිකුත් කිරීම මගින් හෝ ඒවා සංශෝධනය කිරීම මගින් ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යයි සලකනු ලබන පියවර පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම;

(ඈ) අපනයන වෙත යොමු වූ විශාල වර්ධනයක්, ආර්ථික විවිධාංගීකරණයක් සහ තාක්ෂණික අභිවෘද්ධියක් අත්පත් කර ගැනීම සඳහා දේශීය සහ විදේශ ආයෝජන සහ ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර ගැනීම;

(ඉ) ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා තනිව හෝ ආයෝජනයට සහ වෙළෙඳාමට අදාළ කාරණා සම්බන්ධයෙන් ක්‍රියාකරන ආණ්ඩුවේ ආයතන හෝ නියාමන ආයතන හෝ ජාත්‍යන්තර නියෝජ්‍යායතන හෝ සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹීම හෝ තනිව හෝ එවැනි ආණ්ඩුවේ ආයතන, නියාමන ආයතන හෝ ජාත්‍යන්තර නියෝජ්‍යායතන හෝ සංවිධාන සමඟ එකට එක් වී යම් ක්‍රියාකාරකමක නිරත වීම;

(ඊ) ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට එළඹීම;

(උ) මේ කොටසේ විධිවිධාන සලසා ඇති ආකාරයට, ආයෝජන හෝ ව්‍යවසායයන්, අවස්ථාවෝචිත පරිදි, අනුමත කිරීම හෝ ලියාපදිංචි කිරීම;

(ඌ) ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය කිසිවක් කරගෙන යාම සඳහා, ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය විය හැකි පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවනු ලබන තනි නෛතික අස්ථිත්ව ඇතුළු අස්ථිත්ව පිහිටුවීම හෝ නිර්මාණය කිරීම;

(එ) ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, (ඌ) ඡේදය යටතේ නිර්මාණය කරන ලද අස්ථිත්වවලට, යම් නියම සහ කොන්දේසිවලට යටත්ව බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරා දීම හෝ පැවරීම;

(ඒ) ස්වකීය අරමුණු සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද යම් අස්ථිත්වයකට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දීම;

(ඔ) කොමිෂන් සභාවට සිය කාර්යභාරය ඉටු කිරීමේ දී සහාය වීම පිණිස උපදේශක කමිටු පිහිටුවීම;

(ඕ) ආයෝජනය සහ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව වූ සහතික කිරීම් සහ සහතික කිරීමේ මණ්ඩල පිළිගැනීම;

(ක) ඊසී අරමුදල වෙත බැර කළ යුතු, III වන කොටස යටතේ වූ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සෝන්ස් එස්එල් විසින් අය කර ගනු ලබන ගාස්තු, සියයට දහයක ප්‍රමාණයක් දක්වා තීරණය කිරීම;

(ග) කොමිෂන් සභාව සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, අත්කර ගැනීම සහ දැරීම සහ එවැනි චංචල හෝ නිශ්චල දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, පවරා දීම, හිමිකර දීම, පැවරීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම;

(ච) කොටස්, ව්‍යාපාර වස්තු, ණයකර සහ ඒ හා සමාන වත්කම් මිල දී ගැනීම, දැරීම සහ විකිණීම;

(ජ) මේ කොටස යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමට හැකි වනු පිණිස උචිත බවට කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, උපදේශකවරුන් සහ අනුශාසකවරුන් ඇතුළු නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයෙහි නියුක්ත කරවීම;

(ට) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම ඇතුළු ආර්ථික කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකනු ලැබිය හැකි ආකාරයකට එහි අරමුදල් ආයෝජනය කිරීම;

(ඩ) මේ කොටස යටතේ වූ කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම; සහ

(ණ) මේ කොටස යටතේ ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ ඒ සඳහා උපකාරී විය හැකි වෙනත් යම් ක්‍රියා සිදු කිරීම.

ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය සහ තර්තව්‍ය

**14.** ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු යː-

(අ) ආයෝජන සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, නිර්දේශ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ ජාතික ආර්ථිකයෙහි වැදගත් අදියර ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර වෙළෙඳාම දිරිමත් කිරීම;

(ආ) දැනට සිටින ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන තවදුරටත් තබා ගනු ලබන බවට, ඔවුන් විසින් නැවත ආයෝජන සිදු කරනු ලබන බවට සහ තම ආයෝජන පුළුල් කරනු ලබන බවට සහතික වීම පිණිස ක්‍රියාපටිපාටි සහ පියවර සකස් කිරීම;

(ඇ) ආයෝජන ලියාපදිංචි කිරීම සහ අනුමත කිරීම සඳහා වූ ක්‍රියාවලියක් ඇතුළුව විනිවිදභාවයෙන් යුතු නියාමන සහ මෙහෙයුම් පරිසරයක් සුසංවිහිත කිරීම, ඩිජිටල්කරණය කිරීම සහ නිර්මාණය කිරීම මගින් ආයෝජන සඳහා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය පියවර ගැනීම;

(ඈ) වෙළෙඳ ගිවිසගැනීම්, ශ්‍රී ලංකාවේ උපායමාර්ගික අපනයන සහ ආයෝජන අරමුණු සමඟ ඍජුව ම

එකට බැඳෙන බවට සහතික වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ වෙළෙඳ-ආයෝජන සම්බන්ධයෙහි අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම;

(ඉ) පරිවර්තන ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සහ දිරිමත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි උපායමාර්ගික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අමාත්‍යවරයාට යෝජනා කිරීම;

(ඊ) ආයෝජන කලාප නිර්මාණය කිරීම සඳහා නිර්දේශ කිරීම;

(උ) ආයෝජන මෙන්ම ආයෝජන කලාපවලට ආයෝජන ගලා ඒම පිළිබඳව කලින් කල, කාර්යසාධන සමාලෝචන සිදු කිරීම;

(ඌ) ආණ්ඩුවේ ප්‍රතිපත්ති සකස් කිරීමෙහිලා සහාය වීම පිණිස වෙළෙඳාමෙහි සහ ආයෝජනයෙහි කාර්යසාධනය සහ අනාගතය පිළිබඳව පර්යේෂණ පැවැත්වීම;

(එ) ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සපුරා ගැනීම සඳහා ආණ්ඩුවේ අස්ථිත්ව අතර සම්බන්ධීකරණය සිදු කිරීම; සහ

(ඒ) ආර්ථික කොමිෂන් සභාවේ යම් අරමුණක් හෝ සියලු අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ ඒ සඳහා උපකාරී විය හැකි එවැනි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

අමාත්‍යවරයා විසින් ආයෝජන කලාප ප්‍රකාශයට පත් කළ යුතු බව

**15.** (1) ආයෝජන කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා 14 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ කරන ලද නිර්දේශ අමාත්‍යවරයා වෙත ලැබීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්-

(අ) ඒ ආයෝජන කලාපය තුළට වැටෙන ඉඩම් ප්‍රදේශයේ ඉම් සහ මායිම්; සහ

(ආ) ඒ කලාපය වැටෙන අංශය සහ (5) වන වගන්තියේ සඳහන් පරිදි එය තනි අංශ කලාපයක් ද බහු අංශ කලාපයක් ද යන වග,

නිශ්චිතව දක්වමින් ඒ ආයෝජන කලාපය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) ආයෝජන කලාපය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් පෞද්ගලික ඉඩමක් වන අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම, ඒ පෞද්ගලික ඉඩම සම්බන්ධයෙන් (450 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පෞද්ගලික ඉඩම සම්බන්ධයෙන් ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම සහිතව අදාළ විය යුතු ය

(3) ජනාධිපතිවරයා විසින්, යම් ආයෝජන කලාපයක් තුළ වූ යම් රජයේ ඉඩමක්, ඒ රජයේ ඉඩම, ඒ ආයෝජන කලාපය තුළ පිහිටුවන ලද සංවර්ධකයන්ට, ක්‍රියාකරුවන්ට හෝ ව්‍යවසායයන්ට හෝ වෙනත් පුද්ගල මණ්ඩලවලට හැර පෞද්ගලික භාවිතය සඳහා අන්සතු නොකළ යුතු බවට වූ කොන්දේසියට යටත් ව, සෝන්ස් එස්එල් වෙත ප්‍රදානය කිරීමක් හෝ වෙනත් යම් අනසතු කිරීමක් හෝ බැහැර කිරීමක් සිදුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කිරීමක්, අන්සතු කිරීමක් හෝ බැහැර කිරීමක් සිදු කිරීමෙන් හෝ ක්‍රියාත්මක කිරීමෙන් පසුව, සෝන්ස් එස්එල් විසින්, එහි නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව, ඒ ඉඩම භාවිත කිරීම සඳහා වගකියනු ලැබිය යුතු ය.

(5) යම් ආයෝජන කලාපයක්, තනි අංශ කලාපයක් ලෙස හෝ බහු අංශ කලාපයක් ලෙස නම් කරනු ලැබිය හැකි අතර ඊට පහත දැක්වෙන දේ ඇතුළත් විය හැකි නමුත් ඊට සීමා නොවිය යුතු ය:-

(අ) කර්මාන්ත;

(ආ) තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යවසායයන්;

(ඇ) විද්‍යා සහ තාක්ෂණ ව්‍යවසායයන්;

(ඈ) උසස් තාක්ෂණය සහිත කෘෂිකාර්මික ව්‍යවසායයන්;

(ඉ) සංචාරක සහ විනෝදාත්මක ව්‍යවසායයන්;

(ඊ) ව්‍යාපාර සේවා ව්‍යවසායයන්; හෝ

(උ) පශු සම්පත් ව්‍යවසායයන්.

(6) (අ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, II වන කොටස හෝ III වන කොටස යටතේ සාදනු ලබන

නියෝගවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාවේ හෝ සෝන්ස් එස්එල් හි ලියාපදිංචි වීමෙන් තොරව කලාපයක් තුළ තැනැත්තකු විසින්, කලාප සංවර්ධකයකු වශයෙන්, ක්‍රියාකරුවකු වශයෙන් හෝ ව්‍යවසායයක් වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හෝ කලාපයක් තුළ ක්‍රියාකාරකම් හෝ පහසුකම් සැපයීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(ආ) යම් කලාපයක්, ව්‍යාපාර කිරීමට හැකි වනු පිණිස සකසන ලද ප්‍රතිපත්ති, ඒකාබද්ධ ඉඩම් භාවිතයන් සහ ඒ අංශයට උචිත ලෙස පරිශ්‍රයේ දී හෝ පරිශ්‍රයෙන් පිටත ඇති යටිතල පහසුකම් සහ උපයෝගිතාවයන් සපයනු ලැබිය යුතු නම් කරන ලද භූගෝලීය ප්‍රදේශයක් විය යුතු ය; නැතහොත් එහි දී හඳුන්වා දෙනු ලබන භාණ්ඩ සහ සපයනු ලබන නිශ්චිතව දක්වනු ලබන සේවාවන්, ආනයන තීරු බදු සහ බදු සම්බන්ධයෙන් වන තාක් දුරට, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ සීමාවෙන් පිටතට වැටෙන බවට සැලකෙන, රාජ්‍ය, පෞද්ගලික-රාජ්‍ය හවුල් ව්‍යාපාර හෝ පෞද්ගලික පදනම මත සංවර්ධනය වීමේ හැකියාව පවතින නම් කරන ලද භූගෝලීය ප්‍රදේශයක් විය යුතු ය.

IV වන පරිච්ඡේදය

## ආර්ථික කොමිෂන් සභාව පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

ආර්ථික කොමිෂන් සභාව පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

**16.** (1) ආර්ථික කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මේ කොටසේ "ඊසී මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජික මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ආර්ථික කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, මේ කොටස මගින් ආර්ථික කොමිෂන් සභාව වෙත පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ඊසී මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(3) ඊසී මණ්ඩලය සාමාජිකයන් දස දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර, එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන්:-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරයට වඩා අඩු නොවන නිලයක නිලධරයකු විය යුතු ඔහුගේ නාමිකයා;

(ii) ආයෝජනය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම් ධුරයට වඩා අඩු නොවන නිලයක නිලධරයකු විය යුතු ඔහුගේ නාමිකයා;

(iii) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලයේ සභාපතිවරයා;

(iv) සෝන්ස් එස්එල් හි සභාපතිවරයා; සහ

(ආ) ආර්ථික විද්‍යාව, ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම, මුදල්, නීතිය, තොරතුරු තාක්ෂණය, සැපයුම් සංවිධානය, නිෂ්පාදනය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල දැනුම, විශේෂඥභාවය සහ පළපුරුද්ද ඇත්තා වූ ද, ඒ ක්ෂේත්‍රවල ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීමක් ඇත්තා වූ ද (මේ කොටසේ "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් හය දෙනකුට නොවැඩි සංඛ්‍යාවක්.

(4) ආර්ථික කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තන්ට හෝ ආර්ථික කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය හැකි අධිකාරියක ප්‍රධානයා වශයෙන් කටයුතු කිරීම සඳහා වෙනත් යම් නීතියක් යටතේ නම් කරනු ලැබ ඇති තැනැත්තන්ට හෝ ආයෝජන කලාප, අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය සම්බන්ධයෙන් වගකීම දරන යම් අධිකාරියක ප්‍රධානයා වශයෙන් කටයුතු කිරීම සඳහා වෙනත් යම් නීතියක් යටතේ නම් කරන ලද තැනැත්තන්ට ආර්ථික කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා ඊසී මණ්ඩලය විසින් ආරාධනා කරනු ලැබිය යුතු ය. නමුත් ඔවුන්ට ඒ රැස්වීම්වල දී ඡන්දය භාවිත කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

ඊසී මණ්ඩලයේ සභාපතිවරයා

**17.** (1) ජනාධිපතිවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතරින් එක් අයකු ඊසී මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් තත් කාර්යය සඳහා වූ හේතු දක්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඊසී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහු ධුරය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් වෙනත් යම් පත් කළ සාමාජිකයකු, ඔහුගේ සාමාන්‍ය කාර්යයන්ට අමතරව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

ඊසී මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්

18. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බූන්වත්භාවයට පත් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් නොකරන ලද වස්තු භංගත්වයට හෝ බූන්වත්භාවයට පත්වූවකු නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) ආර්ථික කොමිෂන් සභාව විසින් හෝ එය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්;

(ඌ) ඊසී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඊට අගතිදායක ලෙස බලපෑමට ඉඩ ඇති යම් ඍජු හෝ වක්‍ර මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඇත්නම්; හෝ

(ඌෟ) මීන් පෙර ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා ඊසී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

ධුර කාලය

**19.** ඊසී මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම මගින් කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයෙන් වූ තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**20.** (1) ඊසී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු කවර හෝ අවස්ථාවක දී, තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(2) ඊසී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු-

(අ) රෝගාතුර වීම හෝ අශක්නුතාවක් නිසා ධුරයේ කාර්ය ඵලදායී ලෙස කිරීමට ඒ තැනැත්තාට නොහැකි වන්නේ නම්, ජනාධිපතිවරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) ඒ තැනැත්තා වංචාවකට, බරපතළ විෂමාචාරයකට හෝ බරපතළ නොසැලකිල්ලකට වරදකරු වී ඇති බවට හෝ (රැස්වීම්වලට නිතිපතා නොපැමිණීම ඇතුළු) ඒ තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් නිසි පරිදි ඉටු කිරීමට ඔහුට නොහැකි බවට සහ ඒ තැනැත්තා

වහාම ධුරයෙන් ඉවත් කළ යුතු බව සාධාරණීකරණය කරමින් ලැබී ඇති නියෝජන සලකා බැලීමෙන් පසු ජනාධිපතිවරයා ඒ පිළිබඳ සෑහීමට පත් වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) ඊසී මණ්ඩලය විසින් එහි රැස්වීම්වලට පැමිණීමෙන් නිදහස් කිරීමකින් තොරව යම් පත්කළ සාමාජිකයකු ඊසී මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට හෝ යම් ලිත් වර්ෂයක දී පවත්වනු ලබන රැස්වීම් ප්‍රමාණයෙන් තුනෙන් එකකට සහභාගි නොවුවහොත් ඒ සාමාජිකයා ඊසී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(4) ඊසී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම මගින් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, 16 වන සහ 18 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු අතර ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) ඊසී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු රෝගාතුර වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් ඒ තැනැත්තාට තම ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, 16 වන සහ 18 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු නොමැති කාලය තුළ ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

සම්බන්ධතා ගැටුම්

**21.** (1) ආර්ථික කොමිෂන් සභාවේ අභිමතය ක්‍රියාත්මක කිරීම, එහි ඡන්දය හෝ එහි විධානය සම්බන්ධයෙන් යම් තැනැත්තකු, සමාගමක්, ආයෝජනයක්, අපනයනයක්, වෙළෙඳාමක් හෝ වෙනත් යම් කාරණයක් පිළිබඳ ඍජු හෝ වක්‍රාකාර සම්බන්ධතාවයක්

ඇති ඊසී මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ඒ සම්බන්ධතාවයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව, ආර්ථික කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වහාම ලිඛිතව දැනුම් දිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම පිළිබඳව ආර්ථික කොමිෂන් සභා මණ්ඩලයේ රැස්වීම්වල දී එවැනි කාරණා සාකච්ඡා කරන අවස්ථාවේ දී, යථා පරිදි වාර්තාගත කළ යුතු ය. එවැනි කාරණා සාකච්ඡා කරන යම් රැස්වීමකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු අතර, ඒ සම්බන්ධතාවයට සෘජුව හෝ වක්‍රව අදාළ වන යම් තීරණයක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා විසින් ඡන්දය භාවිත කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි සම්බන්ධතා ගැටුමක් ඇති බවට ප්‍රකාශ කිරීමට ඊසී මණ්ඩලයේ යම් සාමාජිකයකු අපොහොසත් වුවහොත් හෝ එසේ කිරීම නොසලකා හරිනු ලැබුවහොත් සාමාජිකයා ඊසී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුස්සකු වීමට යටත් විය යුතු ය.

ඊසී මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම්

**22.** (1) ඊසී මණ්ඩලයේ රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක් හෝ මේ කොටස මගින් ඊසී මණ්ඩලයට පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබිය යුතු ය.

(2) ඊසී මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) ඊසී මණ්ඩලයේ රැස්වීමක්-

(අ) රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින, ගණපූරණය සංස්ථාපනය කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) රැස්වීමට සහභාගි වන සහ ගණපූරණය සංස්ථාපනය කරන සියලු සාමාජිකයන්හට, රැස්වීම පවත්වනු ලබන කාලසීමාව තුළ රැස්වීමට සහභාගි වන එක් එක් සාමාජිකයා සමගාමීව දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන ක්‍රම මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) ඊසී මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න ඒ රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන බහුතර සාමාජිකයන්ගේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට, ස්වකීය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු ඊසී මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම මුලසුන දැරිය යුතු ය. ඊසී මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණියහොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන, යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව, ඊසී මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය, ඊසී මණ්ඩලය විසින් නියාමනය කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් ඊසී මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත වී ඇති ලෙස නොසැලකිය යුතු බව

**23.** ඊසී මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නොතකා කටයුතු කරනු ලැබිය යුතු අතර, ඊසී මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත් වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ඊසී මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය; නැතහොත් බල රහිත බවට සලකනු නොලැබිය යුතු ය.

ඊසී මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**24.** මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව ඊසී මණ්ඩලයේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව

**25.** (1) ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව, ඊසී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව-

(අ) ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) ආර්ථික කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

(3) ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව, ඊසී මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ තමන් සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු සභාපතිවරයා සහ ඊසී මණ්ඩලයේ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව තබන අවස්ථාවේ දී, සභාපතිවරයාට ඒ ස්ථානයට පැමිණීමට නොහැකි වන අවස්ථාවක දී, සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරනු ලැබ ඇති ඊසී මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ මීට ඉහතින් ම වූ විධිවිධානවලට අනුකූලව ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට නිසි බලය තිබිය යුතු ය.

(4) ආර්ථික කොමිෂන් සභාවේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් ඊසී මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

## V වන පරිච්ඡේදය

## ආර්ථික කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

**26.** (1) ඊසී මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු අතර ඔහු ආර්ථික කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා සහ ගණන් දීමේ නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා

(2) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තාගේ සුදුසුකම් හා පළපුරුද්ද සහ ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා, ඊසී මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළු ආර්ථික කොමිෂන් සභාවේ කටයුතුවල පරිපාලනය භාරව සිටිය යුතු ය ;

(ආ) ඊසී මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) ඊසී මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලබන සියලු කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(4) ඊසී මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීමට සහ එහි දී කථා කිරීමට ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකමක් තිබිය යුතු නමුත් ඒ රැස්වීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(5) ඊසී මණ්ඩලය විසින් මේ කොටස යටතේ වන තම බලතල, කාර්ය සහ කර්තව්‍ය, ඊසී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ආර්ථික කොමිෂන් සභාවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ආර්ථික කොමිෂන් සභාවේ යම් නිලධරයකු විසින් ආර්ථික කොමිෂන් සභාවේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව තමන් වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(6) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඊසී මණ්ඩලයේ අනුමතය ඇතිව, ආර්ථික කොමිෂන් සභාවේ පරිපාලන ඒකකයකට හෝ නිලධරයකුට හෝ සේවානියුක්තයකුට ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන පරිදි පවරනු ලැබිය හැකි අතර ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති ඒ පරිපාලන ඒකකය හෝ නිලධරයා හෝ සේවානියුක්තයා විසින් එවැනි යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහා වගකිව යුතු අතර ඊසී මණ්ඩලයේ හෝ ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(7) මේ කොටස යටතේ වූ ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊසී මණ්ඩලය වෙත වගකියනු සහ උත්තර දෙනු ලැබිය යුතු ය.

(8) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා-

(අ) ස්වකීය කාර්ය කිරීමට ස්ථිර වශයෙන් නොහැකි තත්ත්වයට පත් වන්නේ නම්;

(ආ) ඊසී මණ්ඩලයේ මතය අනුව ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ හෝ ආර්ථික කොමිෂන් සභාවේ යහපතට අගතිගාමී වන යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) ඊසී මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇත්නම්,

අමාත්‍යවරයා විසින්, ඊසී මණ්ඩලය විමසා සහ (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමට පෙර ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව නිදහසට කරුණු දක්වන ලෙසට වන ලිඛිත දැන්වීමක් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර ඔහුට විරුද්ධව නඟා ඇති චෝදනාවලට එරෙහිව කරුණු කියාපෑමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

(10) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා මියයාම, (8) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඒ ධුරය දරන්නා විසින් ඒ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් විය යුතු ය.

(11) ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් වුවහොත්, අමාත්‍යවරයා විසින්, ඊසී මණ්ඩලය විමසා, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් සිදු කරන තෙක් ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු

කිරීම සඳහා ඊසී මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(12) ඊසී මණ්ඩලය විසින්, අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**27.** (1) ආර්ථික කොමිෂන් සභාව විසින්, මේ කොටසේ විධිවිධාන යටතේ සිය කාර්ය සහ කර්තව්‍ය කරගෙන යාමේ කාර්ය සඳහා ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ආර්ථික කොමිෂන් සභාව අවශ්‍ය යයි සලකනු ලබන සේවක සංඛ්‍යා ආර්ථික කොමිෂන් සභාව විසින් නිර්මාණය කර නිලධරයන් සහ සේවානියුක්තයන් සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවයෙහි නියුක්ත කරනු ලබන නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන් ඊසී මණ්ඩලය විසින්-

(අ) ඒ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවා නියුක්තියට අදාළ නියම සහ කොන්දේසි තීරණය කිරීම;

(ආ) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අනුප්‍රමාණ නිශ්චය කිරීම;

(ඇ) ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම; සහ

(ඈ) ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට අදාළ විය යුතු චර්යා සංග්‍රහයන් ක්‍රියාත්මක කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ඊසී මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(4) ආයෝජනය, වෙළෙඳාම සහ වෙනත් අදාළ විෂයයන් පිළිබඳව ආර්ථික කොමිෂන් සභාව විසින් තාක්ෂණික නිලධරයන්

පුහුණු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීම කළ යුතු අතර, මේ කාර්යය සඳහා, ඒ නිලධරයන් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි සිදු කරන අධ්‍යයන කටයුතුවල වියදම් දැරීමට ආර්ථික කොමිෂන් සභාවට බලය ලබා දිය යුතු ය.

(5) යම් තැනැත්තකු-

(අ) සිවිල් අධිකරණයක් විසින් හෝ විනිශ්චය අධිකාරයක් විසින් අපරාධයකට හෝ බරපතළ විෂමාචාර ක්‍රියාවකට මින් පෙර වරදකරු කරනු ලැබ ඇත්නම් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක නියාමන අධිකාරියක් විසින් නියාමනයක් උල්ලංඝනය කිරීමක්, චර්යා සංග්‍රහයක් උල්ලංඝනය කිරීමක් හෝ ඒ හා සම්බන්ධ උල්ලංඝනය කිරීමක් පිළිබඳව නඩු කටයුතුවලට යටත්ව සිට ඇත්නම්; හෝ

(ආ) මේ කොටසේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇත්නම්,

ආර්ථික කොමිෂන් සභාව විසින්, එවැනි තැනැත්තකු ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

රජයේ නිලධරයන් ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම

**28.** (1) ආර්ථික කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආර්ථික කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාග

මන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වූ ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු ආර්ථික කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ආර්ථික කොමිෂන් සභාවේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සිදු කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## මුදල්

ආර්ථික කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණය

**29.** ආර්ථික කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණය සහ මේ පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලබන ඊසී අරමුදලේ නිසි ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය ඊසී මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

ආර්ථික කොමිෂන් සභාවේ අරමුදල

**30.** (1) ආර්ථික කොමිෂන් සභාවට (මින් මතු "ඊසී අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඊසී අරමුදලට-

(අ) ආර්ථික කොමිෂන් සභාවේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) ආර්ථික කොමිෂන් සභාව සෘජුව ම හෝ මේ කොටස යටතේ නිර්මාණය කරන ලද අස්ථිත්ව හරහා ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආර්ථික කොමිෂන් සභාවට ලැබිය හැකි සියලු මුදල්;

(ඇ) මේ කොටසේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) 13 වන වගන්තියේ (ක) ඡේදය යටතේ ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, III වන කොටස යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සෝන්ස් එස්එල් විසින් අය කරනු ලබන ගාස්තුවලින් සියයට දහයක් දක්වා,

ගෙවනු ලැබිය යුතු ය.

(3) ආර්ථික කොමිෂන් සභාව විසින් මේ කොටස යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආර්ථික කොමිෂන් සභාව විසින් දරන ලද සියලු වියදම් ගෙවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සහ ඊසී අරමුදලෙන් ගෙවීමට නියම කර ඇති සියලු මුදල් ඊසී අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(4) ඊසී අරමුදලට අයත් මුදල් ඊසී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට ආර්ථික කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ආර්ථික කොමිෂන් සභාවේ මුදල් වර්ෂය සහ එහි ගිණුම් විගණනය කිරීම

31. (1) ආර්ථික කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආර්ථික කොමිෂන් සභාවේ ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට ආර්ථික කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආර්ථික කොමිෂන් සභාවේ ගිණුම් විගණනයට අදාළ විය යුතු ය.

(4) ඊසී මණ්ඩලය විසින්, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය, විගණකවරයාගේ වාර්තාව ද සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

VII වන පරිච්ඡේදය

## ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති

ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති

**32.** (1) ආර්ථික කොමිෂන් සභාව විසින්, 3 වන සහ 4 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යථාර්ථයක් බවට පත් කර ගැනීමට හැකි වීම පිණිස ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයට ඒ පිළිබඳව නිර්දේශ කිරීම කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රතිපත්ති ජනාධිපතිවරයා වෙත සහ අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබීමෙන් පසු, ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ගැසට් පත්‍රයේ පළ කිරීමට සහ ඒ ජාතික ප්‍රතිපත්තිය අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සලසනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පාර්මේන්තුවේ අනුමතය ලැබීමෙන් පසු, එසේ අනුමත කරනු ලැබූ ජාතික ප්‍රතිපත්ති, ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති විය යුතු ය.

(4) ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කිරීම ආර්ථික කොමිෂන් සභාවේ සහ වෙනත් අදාළ ව්‍යවස්ථාපිත ආයතනවල, පළාත් සභාවල, පළාත් අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල සහ වෙනත් යම් පළාත් පාලන ආයතනවල කාර්යය විය යුතු ය.

(5) ආර්ථික කොමිෂන් සභාව විසින්, ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ආයෝජනය සහ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ කාරණා සඳහා වගකීම් දරන වෙනත් නියෝජ්‍යායතන විමසන බවට සහ ඒවා සමඟ සම්බන්ධීකරණය කරන බවට සහතික වනු ලැබිය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### විදේශ ආයෝජකයන්ගේ යෝග්‍යතාවය සහ විදේශ ආයෝජකයන් ලියාපදිංචි කිරීම

විදේශ ආයෝජකයන්ගේ යෝග්‍යතාවය සහ තහනම් කිරීම් සහ සීමා කිරීම්

33. (1)(අ) (1)(ඇ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අංශ හා ක්ෂේත්‍රවලට ඇතුළු වීමට විදේශ ආයෝජනවලට අවසර ලබා දිය යුතු ය. මේ කොටසේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ සාදන ලද නියෝග මගින් අන්‍යාකාරයකට තීරණය කරනු ලැබ ඇත්නම් මිස, ඒ අංශවල සහ ක්ෂේත්‍රවල නියැලී සිටින අස්ථිත්වවල කොටස්වලින් සියයට සියයක හිමිකම දැරීමට විදේශ ආයෝජකයන්ට අවසර ලබා දිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන සෘජු විදේශ ආයෝජන, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගම්වලට සිදු කරනු ලබන නව ආයෝජන හෝ දැනට පවතින දේශීය සමාගම්වල සිදු කරනු ලබන ආයෝජන ඇතුළු ශ්‍රී ලංකාවේ නීති මගින් පිළිගනු ලබන ඕනෑම නීතිමය ආකෘතියක් ගනු ලැබිය හැකි ය.

(ඇ) විදේශීය ආයෝජකයන් සඳහා තහනම් කර ඇති හෝ සීමා කර ඇති අංශ සහ කර්මාන්ත ඇතුළත් නිශේධනීය ලැයිස්තුවක් මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මෙහි පටහැනිව කුමක් අන්තර්ගත වුව ද, එය නොතකා, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ජාතික ආරක්ෂාව, මහජනතාවගේ හදිසි අවශ්‍යතා, මහජන ආරක්ෂාව සහ පාරිසරික ආරක්ෂාව සඳහා අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින් ශ්‍රී ලංකාව තුළට එන විදේශ ආයෝජන සඳහා නව ඇතුළු වීමේ අවශ්‍යතා හෝ සීමා කිරීම් හඳුන්වා දෙනු ලැබිය හැකි ය.

විදේශ ආයෝජන ලියාපදිංචි කිරීම

34. (1) 33 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ කොටස යටතේ විදේශ ආයෝජකයන්ට සහ ආයෝජනවලට ලබා දී ඇති ආරක්ෂාවන් සඳහා සුදුසුකම් ලැබීමට මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි විදේශ ආයෝජකයන් විසින්, තම විදේශ ආයෝජන ආර්ථික කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) සැක දුරු කිරීමේ කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වීම මගින් විදේශ ආයෝජකයන් සහ ඒ යටතේ කරන ලද විදේශ ආයෝජන, ශ්‍රී ලංකාව තුළ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පනවා ඇති නියමවලට හෝ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමෙන් සහ ඒවා පිළිපැදීමෙන් නිදහස් කරනු නොලැබේ.

(3) මේ කොටස යටතේ සහ එය ක්‍රියාත්මක කිරීමේ නියෝග යටතේ පහසුකම් සැලසීමේ සේවා ලබා ගැනීම සඳහා දේශීය ආයෝජකයන් විසින් තම ආයෝජන, ආර්ථික කොමිෂන් සභාව සමග ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

### ආයෝජන පිළිබඳව වන සහතික වීම්

මේ කොටසේ විධිවිධාන ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආයෝජන ගිවිසුම් ආදියට අදාළ නොවිය යුතු බව

**35.** මේ කොටසේ විධිවිධාන, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආයෝජන ගිවිසුම්වලට හෝ ශ්‍රී ලංකාව යම් ස්වෛරී රාජ්‍යයක් සමග එළඹ ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම්වල ආයෝජනය පිළිබඳ පරිච්ඡේදවලට අදාළ නොවිය යුතු ය.

සාධාරණ සහ සමාන ලෙස සැලකීම

**36.** (1) ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන සියලු ආයෝජනවලට සාධාරණ සහ සමාන සැලකිල්ලක් ලැබිය යුතු අතර, ඒ ආයෝජනවලට සම්පූර්ණ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය ලැබිය යුතු ය.

(2) මේ කොටසේ කාර්ය සඳහා-

"සාධාරණ සහ සමාන සැලකිල්ල" යන්නෙන්, නිසි ක්‍රියාපටිපාටියට සහ ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව යම් අපරාධ නඩු කටයුතුවල දී, සිවිල් නඩු කටයුතුවල දී හෝ පරිපාලන කටයුතුවල දී යුක්තිය ඉටු කිරීමට ප්‍රතික්ෂේප නොකිරීමට ඇති බැඳීම අදහස් වේ ; සහ

"සම්පූර්ණ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය" යන්නෙන් ශ්‍රී ලංකාවේ නීති යටතේ නියම කරනු ලැබ ඇති පරිදි ආයෝජනවල භෞතික සුරක්ෂිත භාවය සඳහා ආරක්ෂාව ලබා දීම අදහස් වේ.

ජාතිකත්ව සැලකීම සහ අධි අනුග්‍රාහිත ජාතියට කරන සැලකිල්ල

**37.** (1) (අ) අත්කර ගැනීම, පුළුල් කිරීම, කළමනාකරණය, ක්‍රියාකාරිත්වය, මෙහෙයවීම සහ විකිණුම් හෝ වෙනත් ආයෝජන බැහැර කිරීම්, සම්බන්ධයෙන්, සමාන අවස්ථානුගත කරුණුවල දී දේශීය අයෝජකයන්ට දක්වන සැලකිල්ලට වඩා අවාසිදායක නොවන සැලකිල්ලක් විදේශ ආයෝජනවලට සහ විදේශ ආයෝජකයන්ගේ ආයෝජන මත ලැබෙන ප්‍රතිලාභවලට ලබා දිය යුතු ය.

(ආ) වැඩි නිශ්චිත භාවයක් සඳහා "සමාන අවස්ථානුගත කරුණුවල දී'' යන්න ආයෝජනයට අදාළ අංශය, ආයෝජනය පිහිටි ස්ථානය, පැමිණිලි කර ඇති ක්‍රියාවේ හෝ පියවරෙහි අරමුණ සහ අදාළ ක්‍රියාවට හෝ පියවරට සාමාන්‍යයෙන් අදාළ වන නියාමන, පාලන හෝ නෛතික ක්‍රියාවලිය ඇතුළු එක් එක් සිද්ධිය මත පදනම් වූ වාස්තවික ඇගයීමක් මත පිහිටා තක්සේරු කළ යුතු ය. තක්සේරුව එක් සාධකයකට සීමා වීම හෝ එක් සාධකයකට පක්ෂග්‍රාහී වීම සිදු නොවිය යුතු ය.

(2) යම් විදේශ ආයෝජකයකුගේ පුරවැසිභාවය, පදිංචිය, ආගම, ලියාපදිංචි ස්ථානය හෝ ආයෝජනය ආරම්භ වූ රාජ්‍යය ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවී, සමාන අවස්ථානුගත කරුණුවල දී, කවර හෝ ආකාරයකින් විදේශ ආයෝජකයකුට වෙනස්කොට නොසැලකිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන මගින්-

(අ) දැනට පවතින හෝ අනාගතයේ දී ඇති විය හැකි සිරිත්වලින්, ආර්ථික හෝ මුදල් සංගම්වලින්, නිදහස් වෙළෙඳ ප්‍රදේශවලින් හෝ ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන හෝ අනාගතයේ දී ශ්‍රී ලංකාව පාර්ශ්වයක් විය හැකි ඒ හා සමාන ජාත්‍යන්තර ගිවිසුම්වලින්;

(ආ) සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් බදු අය කිරීමට අදාළ යම් ජාත්‍යන්තර ගිවිසුමකින් හෝ වැඩ පිළිවෙළකින් හෝ දේශීය නියෝගයකින්;

(ඇ) දැනට බලාත්මකව පවතින හෝ අනාගතයේ දී එළඹිය හැකි යම් ද්විපාර්ශ්වික ගිවිසුමකින්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ශ්‍රී ලාංකිකයන් සඳහා පමණක් වෙන් කර ඇති යම් අංශවලින් හෝ සේවාවලින්,

හටගන්නා සැලකිල්ලක, අනුග්‍රාහකත්වයක, වරප්‍රසාදයක ප්‍රතිලාභය විදේශ ආයෝජකයන්ට සහ විදේශ ආයෝජනවලට ලබා දීමට ශ්‍රී ලංකාව බැඳීමට යටත් කරන බවට තේරුම් නොගත යුතු ය.

විදේශ ආයෝජනවලට අදාළ ගෙවීම් බාධාවකින් තොරව මාරු කළ හැකි විය යුතු බව

38. (1) විදේශ ආයෝජනවලට අදාළ සියලු ගෙවීම් බලපවත්නා නීති හා නියෝගවලට අනුකූලව, ප්‍රමාදයකින් තොරව සහ බාධාවකින් තොරව මාරු කළ හැකි ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට නිදහසේ මාරු කළ හැකි විය යුතු ය. ඒ මාරු කිරීම්වලට විශේෂිතව ම-

(අ) යම් ආයෝජනයක් පවත්වාගෙන යාම සඳහා හෝ වැඩි කිරීම සඳහා වන ආරම්භක ප්‍රාග්ධනය සහ අතිරේක මුදල් ප්‍රමාණ;

(ආ) ආයෝජනය කරන ලද ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ;

(ඇ) ණය ගිවිසුමකට අදාළ නැවත ගෙවීම්, රාජ්‍යභාගය ගෙවීම් සහ ගාස්තු ගෙවීම් ඇතුළු ගිවිසුමක් යටතේ කරනු ලබන ගෙවීම්;

(ඈ) යම් ආයෝජනයක සියලු කොටස් හෝ එහි යම් කොටසක් විකිණීමෙන් හෝ ඈවර කිරීමෙන් ලැබෙන ඉපැයුම්;

(ඉ) 39 වන වගන්තිය යටතේ වන්දි ගෙවීම්;

(ඊ) ආයෝජන ආරාවුලක් සමථයකට පත් වීමෙන් උපචිත වන ගෙවීම්; සහ

(උ) ආයෝජනයක් සම්බන්ධයෙන් විදේශ රටක සිට සේවයේ යෙදී සිටින පුද්ගලයන් උපයන මුදල් සහ වෙනත් පාරිශ්‍රමික,

ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් මාරු කිරීම්, එවැනි නීති සහ නියෝග ප්‍රකාරව අය වීමට ඇති යම් ගෙවීම්වලට, ගෙවිය යුතු මුදල්වලට, ගාස්තුවලට, බදුවලට හෝ ඒ හා සමාන වෙනත් බැඳීමකට යටත් විය යුතු ය. මේ වගන්තිය යටතේ මාරු කිරීමට අවසර ඇති මුදල, මෙහි සඳහන් මූල්‍ය බැඳීම් අඩු කර ගැනීමෙන් පසුව ඇති ශේෂය විය යුතු ය.

(3) මුදල් මාරු කරන දිනයේ දී පවතින, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතය මේ වගන්තියේ කාර්යය සඳහා අදාළ විය යුතු අතර, විදේශ විනිමය සඳහා වෙළෙඳපොළක් නොතිබෙන අවස්ථාවක දී, අදාළ කරගත යුතු අනුපාතය, ව්‍යවහාර මුදල්, විශේෂ ආදාන අයිතීන්වලට හැරවීම සඳහා මෑතක දී ම පවතින විනිමය අනුපාතය විය යුතු ය.

(4) ඉහත කී කරුණුවලට අගති විරහිතව, ශ්‍රී ලංකාවෙන් පිටතට මුදල් මාරු කිරීම තාවකාලිකව සීමා කිරීම සඳහා සාධාරණ ලෙස, වෙනස්කමකින් තොරව සහ සද්භාවයෙන් යුතුව ගනු ලබන ක්‍රියාමාර්ග මගින් පහත දැක්වෙන සිදුවීම්වල දී මේ වගන්තිය උල්ලංඝනය කිරීමක් අදහස් වන ලෙස අර්ථ දැක්වීම නොකළ යුතු ය:-

(අ) බරපතළ ගෙවුම් ශේෂය පිළිබඳ දුෂ්කරතා;

(ආ) ප්‍රාග්ධන සංසරණය මගින් සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා බරපතළ දුෂ්කරතා ඇති වේ නම්;

(ඇ) බංකොලොත්භාවය, බුන්වත්භාවය හෝ ණයහිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ඈ) සුරැකුම්පත් නිකුත් කිරීම, වෙළෙඳාම් කිරීම හෝ ඒවා පිළිබඳව කටයුතු කිරීම;

(ඉ) අපරාධමය හෝ දණ්ඩන වැරදි සහ අපරාධවලින් ලද ඉපැයුම් නැවත ලබා ගැනීම; හෝ

(ඊ) නඩු කටයුතුවල දී නඩු තීන්දු ඉටු කරන බවට සහතික වීම.

(5) (4) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් ගෙවීම් මාරු කිරීමට අදාළ සීමා කිරීම්වල කාලසීමාව, ගෙවුම් ශේෂ තත්ත්වය සඳහා ප්‍රතිකර්ම යෙදීමට අත්‍යන්තයෙන් ම අවශ්‍ය කාල සීමාව සඳහා පමණක් අදාළ විය යුතු ය.

අපසර්ජනය

**39. (1)** (අ) වෙනස්කොට නොසැලකීමේ පදනම මත;

(ආ) අනුපාතය පිළිබඳ ප්‍රතිපත්තිය මත;

(ඇ) නීතියේ නිසි ක්‍රියාපටිපාටියට අනුකූලව; සහ

(ඈ) කඩිනමින් සිදු කරන ප්‍රමාණවත් සහ ඵලදායි වන්දි ගෙවීමක් සහිතව,

මහජන යහපත උදෙසා හැර, කිසිදු ආයෝජනයක් අපසර්ජනය හෝ ජනසතු කිරීම හෝ (මින්මතු "අපසර්ජනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනසතු කිරීමට හෝ අපසර්ජනයට සමාන ප්‍රතිඵලය ඇති කිසිදු පියවරක් ගැනීම නොකළ යුතු ය.

(2) අපසර්ජනයක් සිදුවන අවස්ථාවක දී-

(අ) අපසර්ජනයට පෙර දිනය හෝ ප්‍රත්‍යාසන්න අපසර්ජනයට පෙර දිනය හෝ අපසර්ජනය පිළිබඳව ප්‍රසිද්ධියේ දැන ගැනීමට ලැබෙන දිනයට පෙර දිනය යනාදියෙන් මුලින් ම එළඹෙන දිනයේ දී පැවති ඒ අපසර්ජනයට ලක් වූ ආයෝජනයේ සාධාරණ වෙළෙඳපොළ වටිනාකම ඒ සඳහා වූ වන්දි මුදල විය යුතු අතර, අදහස් කරන ලද අපසර්ජනය කලින් ප්‍රසිද්ධ වී තිබීම හේතුවෙන් වටිනාකම වෙනස්වීමක් ඉන් පිළිබිඹු නොවිය යුතු ය. තක්සේරුව පිළිබඳ නිර්ණායක, පවත්වාගෙන යන ව්‍යාපාරයක වටිනාකමේ පදනම මත, ස්පර්ශනීය දේපළෙහි ප්‍රකාශිත බදු ආදායම ඇතුළු වත්කම්වල වටිනාකම් පදනම මත සහ සාධාරණ වෙළෙඳපොළ වටිනාකම තීරණය කිරීමට උචිත වෙනත් උපමාන මත පදනම් විය යුතු ය;

(ආ) වෙළෙඳපොළ වටිනාකම නිර්ණය කර ගැනීමට නොහැකි නම්, ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය, ආයෝජනයේ ස්වභාවය සහ කාල සීමාව, ආදේශනය සහ පොත්ගත අගය වැනි අදාළ සියලු කරුණු

සැලකිල්ලට ගනිමින්, තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව වෙළෙඳපොළ වටිනාකමට අනුකූලව වන්දි මුදල තීරණය කළ යුතු ය;

(ඇ) වන්දි මුදල ප්‍රමාදයකින් තොරව ගෙවිය යුතු අතර එය කාර්යක්ෂම ලෙස මුදල් බවට පත්කර ගත හැකි සහ බාධාවකින් තොරව මාරු කළ හැකි විය යුතු ය. අපසර්ජනයේ දින සිට මාස හයක් ඇතුළත වන්දි මුදල ගෙවිය යුතු ය. වන්දි ගෙවීම සිදු කරන තුරු ආයෝජනයට ක්‍රියාත්මක විය හැකි ය.

(3) අපසර්ජනයක් මගින් බලපෑමක් සිදුවන ආයෝජකයකුට, මේ වගන්තියේ විධිවිධානවලට අනුව තම ආයෝජනය තක්සේරු කිරීම සහ වන්දි මුදල් ගෙවීම ඇතුළු තම පවරා ගැනීම පිළිබඳ කඩිනම් සමාලෝචනයක් ලබා ගැනීමේ අයිතිය ආයෝජකයාට තිබිය යුතු ය.

(4) සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසරය වැනි නීත්‍යනුකූල මහජන සුබසාධක අරමුණු ආරක්ෂා කර ගැනීමට නිර්මාණය කරන ලද සහ අදාළ කරගනු ලබන වෙනස්කම්වලින් තොර යම් පියවර, එවැනි පියවරක් හෝ පියවර මාලාවක් පැහැදිලි ලෙස අතික්‍රමික වන පරිදි එහි අරමුණට සාපේක්ෂව ඉතා දැඩි පියවරක් හෝ පියවර මාලාවක් වන අවස්ථාවක දී හැර, අපසර්ජනයක් හෝ ජනසතු කිරීමක් සංස්ථාපනය නොකළ යුතු ය.

(5) (450 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ වූ අපසර්ජන පිළිබඳ අවස්ථාවක දී, වන්දි මුදල් ගෙවීම ඒ පනතේ විධිවිධානවලට අනුව විය යුතු ය.

පූර්ව ප්‍රතිෂ්ඨාපිත අයිතිවාසිකම්

**40.** සැක දුරු කිරීමේ කාර්යය සඳහා 36 වන, 37 වන, 38 වන සහ 39 වන වගන්තිවල විධිවිධානවලින් යම් විදේශ ආයෝජකයකුට හෝ විදේශ ආයෝජනයකට පූර්ව ප්‍රතිෂ්ඨාපිත අයිතිවාසිකම් ප්‍රදානය කරන බවට සලකනු නොලැබිය යුතු ය.

විදේශීය ආයෝජකයන්ගේ බැඳීම්

**41.** (1) විදේශ ආයෝජන පිහිටුවීම, අත්කර ගැනීම, කළමනාකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලාත්මකව පවතින සියලු නීතිවලට,

නියෝගවලට, පරිපාලන මාර්ගෝපදේශවලට සහ ප්‍රතිපත්තිවලට විදේශ ආයෝජකයන් සහ ඔවුන්ගේ ආයෝජන අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(2) යම් ආයෝජනයක් පිහිටුවීමට පෙර හෝ ඉන් පසු විදේශ ආයෝජකයන් සහ ඔවුන්ගේ ආයෝජනවලින් සෘජුව හෝ වක්‍රාකාරව, ආයෝජනය භාරව සිටින නිලධරයකුට, රජයේ නිලධරයකුට හෝ සිය ආයෝජනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ හැකියාව සහිත නිලධරයකුට කුමන ආකාරයක හෝ යම් අයුතු මුදල්මය ප්‍රතිලාභයක්, තුටු පඬුරක් හෝ ත්‍යාගයක් ලබා දීමට ඉදිරිපත් වීම, ලබා දීමට පොරොන්දු වීම හෝ ලබා දීම හෝ යම් රාජකාරි කටයුත්තක් කිරීම සඳහා හෝ එවැන්නක් කිරීම වළක්වමින් හෝ වෙනත් අනිසි වාසියක් ලබා ගැනීමට හෝ පවත්වාගෙන යාමට පෙලඹවීමක් හෝ ප්‍රතිලාභයක් ලබා දීම නොකළ යුතු ය. තව ද එවැනි ක්‍රියාවක් කිරීම සඳහා උසි ගැන්වීමට, ආධාර දීමට, අනුබල දීමට හෝ කුමන්ත්‍රණය කිරීමට සහාය වීම නොකළ යුතු ය.

(3) විදේශ ආයෝජකයන් සහ ඔවුන්ගේ ආයෝජන විසින්, කලට වේලාවට බදු ගෙවීම ඇතුළු බදු ගෙවීමට අදාළ සියලු නීතිවලට ඒවා අදාළ වන තාක් දුරට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(4) විදේශ ආයෝජනයකට අදාළව තීරණ ගැනීමේ කාර්ය සඳහා හෝ සංඛ්‍යානමය කාර්ය සඳහා ඔවුන්ගේ ආයෝජනයට අදාළ තොරතුරු, බලධරයන් විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවල දී, ඒ තොරතුරු විදේශ ආයෝජකයන් විසින් සපයනු ලැබිය යුතු ය.

(5) විදේශ ආයෝජකයන් සහ ඔවුන්ගේ ආයෝජන විසින්, ඔවුන්ගේ පරිචයන් සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති තුළට සංස්ථා සමාජ වගකීම පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති ස්වෙච්ඡාවෙන් ඇතුළත් කර ගැනීමට උත්සාහ කළ යුතු ය. මේ ප්‍රතිපත්ති මගින් කම්කරු, පරිසර සහ මානව හිමිකම්, ප්‍රජා සබඳතා සහ දූෂණ විරෝධී ක්‍රියා වැනි ගැටලුවලට අවධානය යොමු කරනු ලැබිය හැකි ය.

## X වන පරිච්ඡේදය

### විනිවිදභාවය සහ ආරාවුල් සමථයකට පත් කිරීම

විනිවිදභාවය

**42.** (1) (අ) ආර්ථික කොමිෂන් සභාව විසින්, ආයෝජකයන්ට තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම පිණිස, සියලු නීති, නියෝග, නියම, රීති සහ නීත්‍යානුකූලව අවසර ලබා දී ඇති අවස්ථාවල දී නඩු තීන්දු සහ පරිපාලන රීති තනි වෙබ් අඩවියක පළ කිරීමට ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

(ආ) ආයෝජකයන් වශයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වලට බලපාන යෝජිත නියෝග, රීති, විධාන හෝ නියම සම්බන්ධයෙන් හැකියාව පවතින අවස්ථාවල දී, ආයෝජකයන් විමසීම සහ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නියෝජන ඉදිරිපත් කිරීමට ආයෝජකයන්ට අවස්ථාවක් ලබා දීම ආර්ථික කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) යම් ආයෝජකයකුට හෝ ආයෝජනයකට එරෙහිව පරිපාලන කටයුතු ආරම්භ කර ඇති අවස්ථාවක දී, ඒ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් නීතිය යටතේ යම් පුරවැසියකුට ලබා දී ඇති සියලු අයිතිවාසිකම්, කාර්යපටිපාටි සහ නිසි ක්‍රියාවලීන් ඒ ආයෝජකයාට ද ලබා දිය යුතු ය.

විදේශ ආයෝජකයන් සහ රජය අතර ආරාවුල් වැළැක්වීම

**43.** (1) ආර්ථික කොමිෂන් සභාව විසින්, එය මගින් ම හෝ එහි නියෝජ්‍යායතන මගින් (විදේශ ආයෝජනයට අදාළව) විදේශ ආයෝජකයා සහ රජය අතර ඇති යම් ආරාවුලක්, විසම්මුතියක් හෝ මතභේදයක් හෝ කාරණයක් හේතුවෙන් හටගන්නා දුක්ගැනවිල්ලක් සාකච්ඡා ක්‍රියාවලියක් හරහා සමථයකට පත් කර ගැනීම පිණිස විදේශ ආයෝජකයා විසින් එවැනි යම් දුක්ගැනවිල්ලක් යොමු කරනු ලැබිය හැකි දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය. ආර්ථික කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ සාදනු ලබන රීති මගින්, දුක්ගැනවිලි කමිටුවේ වගකීම් නියම කිරීම ඇතුළු ඒ කාර්ය සඳහා කමිටුව පිහිටුවීම සහ ක්‍රියාපටිපාටිය දැක්වීම සඳහා විධිවිධාන සකස් කළ යුතු ය.

(2) දුක්ගැනවිලි කමිටුව සහ බලධාරීන් විසින් සුහදශීලීව සහ සාකච්ඡා කිරීම මගින් විදේශ ආයෝජකයාගේ දුක්ගැනවිලි විසඳීමට තම උපරිම උත්සාහය යෙදිය යුතු ය.

(3) දුක්ගැනවිලි කමිටුව විසින්, තමන්ට අවශ්‍ය යයි පෙනෙන විමසුම් සඳහා පැහැදිලි කිරීම්, ලේඛන සහ පිළිතුරු ඉල්ලා සිටීම සඳහා ප්‍රශ්නගත පාර්ශ්වයන් සහ නිසි පරිපාලන බලධරයන්

සම්බන්ධ කරගනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ ඇති විවිධ විශේෂඥ දැනුම සහ විශේෂඥභාවය වෙත සහ වෙනත් පරිපාලන බලධරයන් වෙත යොමු විය හැකි ය.

ආරාවුල් විසඳීම

**44.** (1) මේ කොටස යටතේ වූ ආයෝජන ආරාවුල් පාර්ශ්වයන් අතර සාකච්ඡා සහ අදහස් හුවමාරු කර ගැනීම මගින් කඩිනමින් සහ සුහදශීලිව සමථයකට පත් කර ගත යුතු ය.

(2) සුහදශීලී විසඳුමකට ළඟා විය නොහැකි අවස්ථාවල දී, ශ්‍රී ලංකාවේ නීති යටතේ ඇති වෙනත් සියලු ප්‍රතිකර්ම භාවිත කිරීමේ අයිතිය යම් ආයෝජකයකුට තිබිය යුතු ය:

එසේ වුව ද, ආරාවුල, විදේශ ආයෝජකයකු සහ රජය අතර පවතින ආරාවුලක් වන අවස්ථාවක දී, අහඹු ලෙස පවත්වන බේරුම් කරණය සහ ආයතනික බේරුම්කරණය ඇතුළු ආරාවුල් සමථයකට පත් කිරීම සඳහා වන විකල්ප යාන්ත්‍රණ හරහා ආරාවුල් සමථයකට පත් කර ගැනීමට උත්සාහ කිරීම සඳහා පාර්ශ්වයන්ට එකඟ විය හැකි ය.

(3) විදේශ බේරුම් කිරීමේ විනිශ්චය අධිකාරයක් විසින් යම් ප්‍රදානයක් සිදු කරනු ලැබුවහොත්, 1995 අංක 11 දරන බේරුම්කරණ පනත ඇතුළු ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ඒ ප්‍රදානය ශ්‍රී ලංකාව තුළ පිළිගනු ලැබිය යුතු අතර එය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කළ හැකි විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, "පාර්ශ්වයන්" යන්නෙන් ආයෝජකයා සහ යම් ආයෝජකයකුට තම ආයෝජනය සම්බන්ධයෙන් සම්බන්ධතා පවතින යම් ආණ්ඩුවේ ආයතනයක් අදහස් වේ.

## XI වන පරිච්ඡේදය

### දිරිගැන්වීම්

දිරිගැන්වීම් සහ නිදහස් කිරීම්

**45.** ආර්ථික කොමිෂන් සභාව විසින්, කලින් කල, ආයෝජනවලට ප්‍රදානය කිරීම සඳහා දිරිගැන්වීම් සහ මේ කොටසේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නීතිවලින් නිදහස් කිරීම් නිර්දේශ කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් ඒ දිරිගැන්වීම් සහ නිදහස් කිරීමේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබූ විට, ඒ දිරිගැන්වීම් සහ නිදහස් කිරීම් අදාළ විය යුතු ය ඃ

එසේ වුව ද, වෙනත් අදාළ නීතියක් යටතේ සාමාන්‍යයෙන් දෙනු ලැබිය හැකි සියලු දිරිගැන්වීම් සහ නිදහස් කිරීම් ලබා ගැනීමට ආයෝජන තවදුරටත් සුදුසු විය යුතු ය.

## XII වන පරිච්ඡේදය

### ආර්ථික කොමිෂන් සභාවේ විශේෂ බලතල

අනුමතයන් කඩිනම් කිරීම සඳහා ආර්ථික කොමිෂන් සභාව සතු විශේෂ බලතල

**46.** (1) (මින්මතු "නිශ්චිතව සඳහන් ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් නම් කරනු ලබන සහ මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින් නිශ්චිතව දක්වනු ලබන අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, නියෝජිතායතන, සංස්ථා, නියාමන ආයතන හෝ මණ්ඩල වෙතින් යම් අනුමතයන්, බලය ලබා දීම් හෝ අවසර පත්‍ර ලබා ගැනීම සඳහා ආයෝජකයකු විසින් ආර්ථික කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී හෝ ආර්ථික කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි වී ඇති ආයෝජනයක් සඳහා එවැනි අනුමතයන්, බලය ලබා දීම් හෝ අවසර පත්‍ර අවශ්‍ය ඇති අවස්ථාවකදී, ඒ අනුමතයන්, බලය ලබා දීම් හෝ අවසර පත්‍ර සම්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීමට ආර්ථික කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් අනුමතයක්, බලය ලබා දීමක් හෝ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා ආර්ථික කොමිෂන් සභාව විසින් යම් විමසීමක් හෝ ඉල්ලීමක් නිශ්චිතව සඳහන් ආයතනයකට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ඒ විමසීම හෝ ඉල්ලීම සිදු කර දින පහළොවක් ඇතුළත ඒ විමසීමට හෝ ඉල්ලීමට කැමැත්ත පළ කරමින් හෝ විරෝධය පළ කරමින් ඒ විමසීමට හෝ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමට ඒ නිශ්චිතව සඳහන් ආයතනය බැඳී සිටිය යුතු ය. ඒ නිශ්චිතව සඳහන් ආයතනය විසින් ඒ විමසීමට ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඒ ඉල්ලීම ප්‍රතිෂේධනය කරන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිෂේධනය කිරීම සම්බන්ධයෙන් හේතු ඒ විමසීම හෝ ඉල්ලීම සිදු කර දින විසි එකක් ඇතුළත ලිඛිතව ලබා දෙනු ලැබිය යුතු ය.

(3) ආර්ථික කොමිෂන් සභාවට සිය කර්තව්‍ය ඉටු කිරීමට සහ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි ආර්ථික කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු බවට සියලු නිශ්චිතව සඳහන් ආයතනවලට නියම කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින්, එසේ සහයෝගයෙන් වැඩ කටයුතු පිළිබඳ කාර්යපටිපාටි නියම කරනු ලැබිය හැකි අතර, ආර්ථික කොමිෂන් සභාව විසින් සාකච්ඡාමය ක්‍රියාවලියක් මගින් සකස් කරන

ලද ආයෝජන ව්‍යාපෘති සඳහා අනුමතයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පවතින මෙහෙයුම් ක්‍රියාපටිපාටිවලට අනුව ඒ නිශ්චිතව සඳහන් ආයතනය විසින් ඒ කාර්යපටිපාටීන්ට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ සාදනු ලබන ලද නියෝග ප්‍රකාරව විමසීමකට හෝ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම නිශ්චිතව සඳහන් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් හෝ ප්‍රතිෂේධනය කරනු ලබන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම්, ආර්ථික කොමිෂන් සභාව විසින්, සුදුසු යයි සලකනු ලබන්නේ නම් ඒ ප්‍රතික්ෂේප කිරීම, ප්‍රතිෂේධනය කිරීම හෝ පැහැර හැරීම වහාම අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියා මාර්ගයක් ගැනීම පිණිස, අමාත්‍යවරයා විසින්, සති දෙකක් තුළ ඒ කාරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

තොරතුරු කැඳවීම සඳහා ඇති බලය

**47.** (1) මේ කොටස යටතේ සිය කාර්ය ඉටු කිරීමට අදාළ යම් කාරණා සම්බන්ධයෙන් ආර්ථික කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි තොරතුරු, විස්තර, ලේඛන සහ වැඩිදුර විස්තර සපයන ලෙස ආර්ථික කොමිෂන් සභාව විසින් යම් ආණ්ඩුවේ නියෝජ්‍යායතනයකින්, පළාත් පාලන ආයතනයකින්, මණ්ඩලයකින්, අධිකාරියකින් හෝ යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබ ඇති යම් ආණ්ඩුවේ ආයතනයක්, පළාත් පාලන ආයතනයක්, මණ්ඩලයක්, අධිකාරියක් හෝ පුද්ගලයකු විසින් ඒ තොරතුරු ප්‍රමාදයකින් තොරව ආර්ථික කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ විදේශ ආයෝජනවල තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා ආණ්ඩුවේ යම් නියෝජ්‍යායතනයක්, පළාත් පාලන ආයතනයක්, මණ්ඩලයක්, අධිකාරියක් හෝ යම් පුද්ගලයකු සමඟ සම්බන්ධීකරණය කිරීමට ආර්ථික කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

## XIII වන පරිච්ඡේදය

### ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම

ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම

**48.** (1) ආර්ථික කොමිෂන් සභාව විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කළ යුතු ඉන්වෙස්ට් ශ්‍රී ලංකා යනුවෙන් හඳුවන්වනු ලබන අස්තිත්වයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනය, ආර්ථික කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සහ පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

(3) ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ සභාපතිවරයා, ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ සාමාජිකයන් අතරින් ආර්ථික කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) (අ) ආර්ථික කොමිෂන් සභාව විසින්, ඉන්වෙස්ට් එස්එල් ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා පත් කරනු ලැබිය යුතු අතර ඔහු එහි ගණන් දීමේ නිලධරයා ද විය යුතු ය.

(ආ) ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනයේ දෛනික කළමනාකාරිත්වය ප්‍රධාන විධායක නිලධරයා වෙත පවරනු ලැබිය යුතු අතර, ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය මණ්ඩලය සහ සම්පත් කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු ය. ප්‍රධාන විධායක නිලධරයාගේ සුදුසුකම්, පාරිශ්‍රමිකය, දීමනා සහ සේවානියුක්තියට අදාළ නියම සහ කොන්දේසි, ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය විසින්, කලින් කල, තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(5) ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලයේ වැටුප් ඇතුළු සියලු වියදම් ආර්ථික කොමිෂන් සභාව විසින් වෙන් කර දෙනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්, ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශය මත, ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනය සඳහා වූ මෙහෙයුම් කාර්ය පටිපාටිය ඌනපූරණය කිරීම සඳහා කලින් කල අවශ්‍ය විය හැකි පරිදි නියෝග සාදනු ලැබිය හැකි ය.

ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ බලතල

**49.** ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු :-

(අ) යම් ආයෝජනයකට අදාළව හෝ ඒ සම්බන්ධයෙන් ඉන්වෙස්ට් ශ්‍රී ලංකාහට අවශ්‍ය තොරතුරු, විස්තර, ලේඛන සහ වැඩිදුර විස්තර යම් ආණ්ඩුවේ

නියෝජ්‍යායතනයකින්, පළාත් පාලන ආයතනයකින් හෝ වෙනත් යම් මණ්ඩලයකින් හෝ අධිකාරියකින් හෝ තැනැත්තකුගෙන් ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට බලය තිබිය යුතු අතර ඒ තොරතුරු, විස්තර, ලේඛන හෝ වැඩිදුර විස්තර ප්‍රමාදයකින් හෝ පැහැර හැරීමකින් තොරව ඒ ආණ්ඩුවේ නියෝජ්‍යායතනය, පළාත් පාලන ආයතනය හෝ මණ්ඩලය හෝ අධිකාරිය හෝ පුද්ගලයා විසින් ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) වැදගත් විදේශ ආයෝජන ව්‍යාපෘතිවල තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය පිළිබඳව සොයා බලා ඒවා එක් රැස් කිරීමට ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කිරීම;

(ඇ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයට සහාය දැක්වීම සඳහා සුදුසු යයි එය විසින් සලකනු ලබන උපදේශක සභා පිහිටුවීම ;

(ඈ) ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත කමිටු පත් කිරීමට සහ ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන බලතල පැවරීම. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සෑම කමිටුවක් ම ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය විසින් කලින් කල ලබා දෙන විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු අතර ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලය විසින් එසේ පත් කරනු ලබන යම් කමිටුවක් පිහිටුවීම ඕනෑම අවස්ථාවක වෙනස් කිරීම හෝ ඒ පත් කිරීම අවලංගු කරනු ලැබිය හැකි ය; සහ

(ඉ) ඉන්වෙස්ට් ශ්‍රී ලංකා හි කාර්ය සහ කර්තව්‍යය කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි එය විසින් සලකනු

ලබන නිපුණතාවයෙන් යුතු තැනැත්තන්, විශේෂඥයන් සහ උපදේශකවරුන් එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන තරඟකාරී වෙළෙඳපොළ අනුප්‍රමාණ අනුව පත් කිරීම; සහ

(ඊ) 50 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සහ කර්තව්‍ය, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් ක්‍රියා සිදු කිරීම සහ ශ්‍රී ලංකාව තුළ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම.

**50.** ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු යː- ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය

(අ) ශ්‍රී ලංකාව තුළ ආයෝජන අවස්ථා හඳුනා ගැනීම;

(ආ) ශ්‍රී ලංකාව ආයෝජන සඳහා සුදුසු ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ආයෝජනය සඳහා වූ වාතාවරණය, නීති සහ නියෝග සහ ව්‍යාපාරික අවස්ථා ආදිය ඇතුළු කාරණා සම්බන්ධයෙන් අනාගත ආයෝජකයන්ට තොරතුරු හා මාර්ගෝපදේශ ලබා දීම;

(ඈ) නියාමන අනුමතයන්, අවසරපත්‍ර සහ බලපත්‍ර ලබා ගැනීමට සහාය ලබා දීම මගින් ආයෝජන පිහිටුවීමට, රඳවා තබා ගැනීමට සහ ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම;

(ඉ) දේශීය ව්‍යාපාරිකයන් සහ හවුල්කරුවන් අනාගත ආයෝජකයන් සමග සම්බන්ධ කිරීම;

(ඊ) ජාත්‍යන්තර ආයෝජන සංසද සහ සම්මේලනවල දී ශ්‍රී ලංකාවේ අයිතීන් නියෝජනය කිරීම;

(උ) ආණ්ඩුව, පෞද්ගලික අංශය සහ ආයෝජන ප්‍රජාව අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම;

(ඌ) ජාතික ආයෝජන ප්‍රවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම; සහ

(එ) ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන ආණ්ඩුවේ වෙනත් නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණය කිරීම.

## XIV වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

ආර්ථික කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**51.** ඊසී මණ්ඩලයේ සියලු සාමාජිකයන්, ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සහ ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ සියලු සාමාජිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආර්ථික කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**52.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව ආර්ථික කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

මේ පනත යටතේ ගනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව

**53.** ඊසී මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයකු හෝ සේවානියුක්තකයකු හෝ ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, ඔහු සද්භාවයෙන් ක්‍රියා කළ බව සහ නිසි උද්යෝගයෙන්, සාධාරණ සැලකිල්ලෙන් සහ නිපුණතාවයෙන් යුතුව කටයුතු කළ බව ඔප්පු කරන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ ආර්ථික කොමිෂන් සභාවේ හෝ

ඊසී මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඊසී මණ්ඩලයේ සාමාජිකයාට, ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයාට හෝ සේවානියුක්තයාට හෝ ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ සාමාජිකයාට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

**54.** (1) ආර්ථික කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ දී පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආර්ථික කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් ඊසී අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආර්ථික කොමිෂන් සභාවට ගෙවන ලද හෝ ආර්ථික කොමිෂන් සභාව විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු ඊසී අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් ඊසී අරමුදලින් ගෙවිය යුතු බව

(2) ඊසී මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඊසී අධ්‍යක්ෂ ජනරල්වරයා ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු, ඉන්වෙස්ට් එස්එල් මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, මේ පනතේ විධිවිධාන යටතේ හෝ ආර්ථික කොමිෂන් සභාවේ විධානය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය තීරණය කරනු ලැබුවහොත් ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අය කර ගනු ලැබ ඇත්නම් මිස, එකී වියදම ඊසී අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**55.** (1) අමාත්‍යවරයා විසින්, ඊසී මණ්ඩලය විමසා, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) විශේෂිතව ම සහ (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවලට අගති විරහිතව අමාත්‍යවරයා විසින්, ඊසී මණ්ඩලය

විමසා, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ කොටසේ අරමුණු ඉටු කර ගැනීම සඳහා, විශේෂයෙන් ම සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය වන මේ කොටසේ උපලේඛනයේ සඳහන් යම් ලිඛිත නීතියක් අනුව වන යම් නිදහස් කිරීමක හෝ වෙනස් කිරීමක විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම;

(ආ) පහත දැක්වෙන කරුණු ඇතුළත්ව සහ ඒවාට සීමා නොවන පරිදි මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් කාරණයක් සඳහා විධිවිධාන සැලැස්වීම සම්බන්ධයෙන්:-

(i) නෛතික අස්තිත්වයන් නිර්මාණය කිරීම හරහා සහ අන්‍යාකාරයකට ආයෝජන ප්‍රවර්ධනය, පහසුකම් සැලසීම සහ පසු උපටැන් කටයුතු සඳහා කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ii) යම් ප්‍රකාශයට පත් කරන ලද ආයෝජන කලාපයක්, බලපත්‍රලත් ව්‍යවසායයක් හෝ ලියාපදිංචි කරන ලද ව්‍යවසායයක් තුළට හෝ ඉන් පිටතට භාණ්ඩ හා සේවා රැගෙන යාම සඳහා වූ ක්‍රමය සහ කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(iii) ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(iv) 48 වන වගන්තිය සම්බන්ධයෙන්, කාර්ය මණ්ඩලය සහ වෙනත් කාරණා සඳහා කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම:

එසේ වුව ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද බීඕඅයි හි නිලධරයන්

සහ සේවානියුක්තයන් විසින් හිමිකම් කියන ලද සේවානියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක වන නියම සහ කොන්දේසි සලසමින් මේ වගන්තිය යටතේ නියෝග සාදනු නොලැබිය යුතු ය;

(v) මේ කොටස යටතේ සපයනු ලබන සේවා සඳහා අය කළ යුතු ගාස්තු සහ වියදම් නිශ්චිතව දැක්වීම;

(vi) මේ කොටස යටතේ ලියාපදිංචි කිරීමට සහ බලපත්‍ර ලබා දීමට අදාළ වර්ග සහ උපමාන නිශ්චිතව දැක්වීම;

(vii) ආර්ථික කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලය වෙන් කර දීම සහ ඒ නියෝගයේ දින සිට බල පැවැත්වෙන පරිදි ඒ කාර්ය මණ්ඩලය ආර්ථික කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කර ඇති බවට සලකනු ලැබිය යුතු වීම; සහ

(viii) මේ වගන්තිය යටතේ සාදනු ලබන නියෝගවල නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් තුළ ඉවත් කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ වන සියලු විදේශ ආයෝජන ආර්ථික කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි විය යුතු බවට නියම කිරීම.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට ඒ නියෝග ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙසට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති

**56.** (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, ආර්ථික කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ රීති සෑදීමට බලය ලබා දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) ආර්ථික කොමිෂන් සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම

**57.** (1) මේ කොටසේ විධිවිධාන බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවයක් ඇති වුවහොත් අමාත්‍යවරයා විසින්, ඊසී මණ්ඩලය විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, මේ කොටසේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ ද, ඒ දුෂ්කරතාවය ඉවත් කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන්නා වූ ද, විධිවිධාන සාදනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයේ සිට අවුරුදු පහක කාලසීමාවක් ඉකුත් වීමෙන් පසු එවැනි නියෝග සාදනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම,

එය සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය ලැබීමෙන් පසුව පමණක් ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

මේ කොටස බලපැවැත්විය යුතු බව

**58.** මේ කොටසේ විධිවිධාන සහ ආයෝජන හෝ ජාත්‍යන්තර වෙළෙඳාම හෝ ආයෝජන කලාපවලට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

**59.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ-

"විදේශ ආයෝජනය" යන්නෙන්, මේ කොටස ප්‍රකාරව ආයෝජකයකු වශයෙන් විදේශ ආයෝජකයකු විසින් කරනු ලබන ආයෝජනයක් අදහස් වේ;

"විදේශ ආයෝජකයා" යන්නෙන්, මේ කොටස ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ආයෝජනයක් සිදු කර ඇති තැනැත්තකු හෝ යම් විදේශ රටක අදාළ නීතිවලට අනුව නෛතික අස්තිත්වයක් වශයෙන් පිළිගනු ලැබ ඇති ව්‍යවසායයක් අදහස් වේ;

"ආයෝජකයා" යන්නෙන්, මේ කොටස ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ආයෝජනයක් සිදු කර ඇති, අදාළ නීති මගින් නෛතික අස්තිත්වයක් බවට පිළිගනු ලැබ ඇති තැනැත්තකු හෝ ව්‍යවසායයක් අදහස් වේ;

"ආයෝජනය" යන්නෙන්, ප්‍රාග්ධනය සහ වෙනත් සම්පත් යම්කිසි කාලයක් සඳහා කැපකර තැබීම, ඉපැයුම් හෝ ලාභ පිළිබඳ අපේක්ෂාව හෝ අවදානම භාර ගැනීම ඇතුළු ආයෝජනයක ආවේණික ලක්ෂණ ඇති ඍජුව හෝ වක්‍රාකාරව ආයෝජකයාට අයත් වන හෝ ඔහු විසින් පාලනය කරනු ලබන සියලු ආකාරයේ වත්කම් අදහස් වන අතර-

(අ) යම් ව්‍යවසායයක්;

(ආ) සුරැකුම්පත් හෝ ව්‍යාපාර වස්තු හුවමාරුවක කරනු ලැබ ඇති ආයෝජනයක් හැර, යම් ව්‍යවසායයක ඇති කොටස්, ව්‍යාපාර වස්තු සහ වෙනත් ආකාරයක ව්‍යාපාර කොටස් අගය යෙදවීමක්;

(ඇ) ව්‍යවසායයක බැඳුම්කර, ණයකර, ණය සහ වෙනත් ණය සාධන පත්‍ර;

(ඈ) ටර්න්කී, ඉදිකිරීම්, කළමනාකරණය, නිෂ්පාදනය, සහන, ආදායම් බෙදා ගැනීම සහ වෙනත් ඒ හා සමාන ගිවිසුම්;

(ඉ) මුදල් සඳහා හෝ වෙනත් වත්කම් සඳහා හෝ ආයෝජනයක් හා බැඳුණු ආර්ථික වටිනාකමක් ඇති ගිවිසුම් ඉටු කිරීම සඳහා වූ හිමිකම්පෑම්;

(ඊ) අදාළ දේශීය නීතිවලට අනුකූලව බුද්ධිමය දේපළ අයිතිවාසිකම්;

(උ) අදාළ දේශීය නීතිය අනුව ලබා දී ඇති බලපත්‍ර, බලය ලබා දීම් අවසර පත්‍ර සහ ඒ හා සමාන අයිතිවාසිකම්;

(ඌ) වෙනත් ස්පර්ශනීය හෝ අස්පර්ශනීය, චංචල හෝ නිශ්චල දේපළ සහ බදු, උකස් කිරීම්, ලියම සහ ඔඩපනය වැනි දේපළ ආශ්‍රිත අයිතිවාසිකම්,

ඊට ඇතුළත් විය යුතු නමුත්-

(i) යම් ආයෝජනයක් විසින් ගනු ලබන ආකෘතිය නොසලකා, ආයෝජනයක ලක්ෂණ නොමැති වත්කමක්;

(ii) පරිත්‍යාගයක්; සහ

(iii) අධිකරණමය කටයුත්තක දී හෝ පරිපාලනමය ක්‍රියාවක දී ප්‍රකාශයට පත් කරන ලද ආඥාවක් හෝ නඩු තීන්දුවක්,

ඊට ඇතුළත් නොවේ;

"ආයෝජන කලාප" යන්නෙන් මේ පනත යටතේ හෝ මේ පනතේ සඳහන් කරනු ලැබ ඇති වෙනත් නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අපනයන පිරිසැකසුම් කලාප, කාර්මික ජනපද, විශේෂ ආර්ථික

කලාප සහ ආයෝජන පිහිටුවීම සඳහා වූ වෙනත් ඒ හා සමාන ප්‍රදේශ අදහස් වන අතර ඊට ඉවත් කරන ලද පනතේ සඳහන් බලපත්‍රලත් කලාප ද ඇතුළත් වේ;

"ලියාපදිංචි කරන ලද ව්‍යවසාය" යන්නෙන් 13 වන වගන්තියේ (උ) ඡේදය යටතේ, අවස්ථාවෝචිත පරිදි, අනුමත කරනු ලැබ ඇති හෝ ලියාපදිංචි කරනු ලැබ ඇති ව්‍යවසායයක් අදහස් වේ;

"ප්‍රතිලාභය" යන්නෙන් ලාභ, ලාභාංශ, පොළිය, ප්‍රාග්ධන ලාභ, රාජ්‍ය භාගය ගෙවීම්, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන ගෙවීම් සහ වෙනත් සියලු නීත්‍යනුකූල ආදායම් ඇතුළු ආයෝජනයකින් උපයාග නු ලබන හෝ ආයෝජනයකින් උපචිත වන මුදල් ප්‍රමාණ;

"නිශ්චිතව සඳහන් ආයතනය" යන්නෙන් 46 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් නම් කර ඇති අස්තිත්වවලින් යම් අස්තිත්වයක් අදහස් වේ.

(2) මේ කොටසේ කාර්ය සඳහා-

(අ) "ණය සහ වෙනත් ණය සාධන පත්‍ර" සහ "මුදල් සඳහා හෝ වෙනත් ගිවිසුම් ඉටු කිරීම සඳහා වූ හිමිකම්පෑම්" යන්නෙන් ආයෝජනයක් හා සම්බන්ධ ව්‍යාපාර කටයුත්තකට අදාළ වත්කමක් අදහස් කරනු ලබන අතර, ආයෝජනයක් හා සම්බන්ධ යම් ව්‍යාපාර කටයුත්තකට අදාළ නොවන පෞද්ගලික ස්වභාවයේ වත්කම් එමගින් අදහස් කරනු නොලැබේ;

(ආ) "මුදල් සඳහා වූ හිමිකම්පෑම්" යන්නට-

(i) භාණ්ඩ හෝ සේවා විකිණීම සඳහා වාණිජ ගිවිසුම්වලින් පමණක් උපචිත වන මුදල් සඳහා වූ හිමිකම්පෑම්;

(ii) ඒ ගිවිසුම්වලට දේශීය වශයෙන් මුදල් සැපයීම; හෝ

(iii) (i) වන හෝ (ii) වන අනුඡේදයට අදාළ යම් ආඥාවක්, නඩු තීන්දුවක් හෝ බේරුම්කරණ ප්‍රදානයක්,

ඇතුළත් නොවේ.

උපලේඛනය

(45 වන සහ 55 වන වගන්ති)

1. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත
2. 2007 අංක 07 දරන සමාගම් පනත
3. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
4. 2021 අංක 18 දරන මුදල් පනත
5. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත
6. 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත
7. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත
8. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත
9. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත
10. 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩල පනත
11. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත
12. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

## III වන කොටස

## XV වන පරිච්ඡේදය

### මේ කොටස අදාළ වීම

මේ කොටස අදාළ වීම

**60.** (1) මේ කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව තුළ ඇති ආයෝජන කලාපවලට අදාළ විය යුතු ය.

(2) මේ කොටසේ විධිවිධාන, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපයට අදාළ නොවිය යුතු ය.

## XVI වන පරිච්ඡේදය

### ශ්‍රී ලංකා ආයෝජන කලාප පිහිටුවීම

ශ්‍රී ලංකා ආයෝජන කලාප පිහිටුවීම

**61.** (1) (මේ පනතේ "සෝන්ස් එස්එල්" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආයෝජන කලාප නම් වූ අස්තිත්වයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සෝන්ස් එස්එල්, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ප්‍රධාන කාර්යාලය සහ සෝන්ස් එස්එල් යටතේ වන දෙපාර්තමේන්තු

**62.** (1) සෝන්ස් එස්එල් හි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටා තිබිය යුතු අතර එහි යම් කාර්යාලයක් හෝ වෙනත් යම් නියෝජනයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මේ කොටස ප්‍රකාරව ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සෝන්ස් එස්එල් තුළ යම් පරිපාලන ඒකක ප්‍රමාණයක් සෝන්ස් එස්එල් විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

සෝන්ස් එස්එල් හි බලතල

**63.** (1) සෝන්ස් එස්එල් විසින් ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යඃ-

(අ) ආයෝජන කලාප පිහිටුවීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳව තීරණය කිරීමට අවශ්‍ය යයි සෝන්ස් එස්එල් විසින් සලකනු ලබන අධ්‍යයන සිදු කිරීම;

(ආ) ආයෝජන කලාප පිහිටුවීම සඳහා හෝ ආයෝජන කලාප ව්‍යාප්ත කිරීම සඳහා වූ අවශ්‍යතාවය, ආර්ථික කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඇ) මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ආයෝජන කලාප පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සහ මාර්ග, විදුලි බලය, ජල සැපයුම, නිවාස සහ අවශ්‍ය පරිදි වන වෙනත් පහසුකම් සහ සුවපහසුකම් ඇතුළු කලාපය තුළ පිහිටි ආයෝජන සඳහා ඉතා නවීන පහසුකම් ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම සහ මේ පනත යටතේ ආර්ථික කොමිෂන් සභාව විසින් සෝන්ස් එස්එල් වෙත ලබා දී ඇති අනුග්‍රහයන් සහ පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම;

(ඈ) ආයෝජන කලාප හරහා ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සඳහා විස්තරාත්මක අධ්‍යයන සිදු කිරීම;

(ඉ) අධ්‍යයන පැවැත්මේ දී සහ ආයෝජන කලාප සහ විශේෂ සංවර්ධන ප්‍රදේශ ක්‍රියාත්මක කිරීමේ දී සෑම අමාත්‍යාංශයක ම, දෙපාර්තමේන්තුවක ම, පළාත් සභාවක ම, පළාත් අමාත්‍යාංශයක ම සහ දෙපාර්තමේන්තුවක ම සහ පළාත් පාලන ආයතනයක ම සහ වෙනත් තැනැත්තකුගේ හෝ වෙනත් පෞද්ගලික හෝ රාජ්‍ය පුද්ගල මණ්ඩලයක ම අන්තර් නියෝජ්‍යායතන අතර සහයෝගීතාවය ඇති කිරීම සහ සහයෝගීතාව පුළුල් කිරීම;

(ඊ) ආයෝජන කලාප කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම;

(උ) ආයෝජන කලාප අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳව නියෝග සෑදීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඌ) ආයෝජන කලාප තුළ හෝ විශේෂ සංවර්ධන ප්‍රදේශ තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, යෝජනා ක්‍රමවල වැඩසටහන් සම්බන්ධයෙන් පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් සූදානම් කිරීමට කටයුතු සැලැස්වීම;

(එ) මේ කොටස යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන සහ කළමනාකරණය කරනු ලබන ආයෝජන කලාප ප්‍රකාශයට පත් කිරීම, ඒවා සඳහා අනුමතය ලබා දීම හෝ ඒවා පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳව වූ සියලු පැතිකඩවල් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඒ) ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වූ පසුබිමක් සෑම ආයෝජන කලාපයක් විසින් ම පවත්වාගෙන යනු ලබන බවට සහ එමගින් රැකියා අවස්ථා වැඩි කරන බවට සහතික වීම;

(ඔ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා පිහිටුවන ලද රාජ්‍ය- පෞද්ගලික හවුල් ව්‍යාපාර අස්තිත්වයක කොටස් දැරීම;

(ඕ) නම් කරන ලද ආර්ථික කලාපය තුළ සෝන්ස් එස්එල් විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තුවක් පැනවීම හෝ අය කිරීම;

(ක) මේ කොටස යටතේ ප්‍රකාශයට පත් කරන ලද සෑම ආයෝජන කලාපයක් සඳහා ම ආයෝජන කලාප සංවර්ධකයකු පත් කිරීම සහ ඒවායෙහි පවතින අත්කරගනු ලැබූ ඉඩම් සහ විවිධ වර්ගයේ යටිතල පහසුකම් කළමනාකරණය කිරීම;

(ග) ආයෝජන කලාප පිහිටුවීම සඳහා ඉල්ලුම් කර ඇති ආයෝජකයන්ට සහ ආයෝජන කලාප තුළ සිටින සේවා සපයන්නන්ට නියම කරනු ලබන ආකාරයට

වාණිජ පදනමක් මත යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් වෙන්කර දීම;

(ච) ස්වකීය කටයුතු සහ ආර්ථික කලාප සංවර්ධකයන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම හරහා යම් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් තුළ ආයෝජන කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කරන බවට සහතික වීම;

(ජ) නිපුණතාවය සහිත ශ්‍රම බලකාය සංවර්ධනය කිරීම ඇතුළු දේශීය සහ විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම මගින් රැකියා සඳහා වූ අවස්ථා නිර්මාණය කිරීම;

(ට) පරිසරය සහ වෙනත් කාරණා පිළිබඳ ව කැපවීම ක්‍රියාත්මක කිරීම සඳහා වූ වැඩසටහන් වඩාත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම දිරිමත් කිරීම;

(ඩ) සෝන්ස් එස්එල් සතුවිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලදී ගැනීම, ලබා ගැනීම සහ දැරීම සහ ඒ චංචල හෝ නිශ්චල දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, පවරා දීම, හිමිකර දීම, පැවරීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම;

(ණ) ආයෝජන කලාප හෝ ඉන් යම් කොටසක් හෝ ආයෝජන කලාපය තුළ වූ පහසුකම්, පිහිටුවීමේ කාර්යය සඳහා සුදුසු යයි සෝන්ස් එස්එල් විසින් සලකනු ලබන යම් පාර්ශ්වයක් සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ත) ආයෝජන කලාපය තුළ ස්ථානගත වීම සඳහා අනුමතය ලැබී ඇති ආයෝජකයන් සමඟ බදු ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ද) ආයෝජන කලාප තුළ පිහිටි ආයෝජන ස්ථාන සම්බන්ධයෙන් විකිණීමේ ගිවිසුම්වලට, සැපයුම් ගිවිසුම්වලට හෝ බදු ගිවිසුම්වලට හෝ කළමනාකරණ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(න) කර්මාන්තය පිළිගත් ආරක්ෂක සහ පාරිසරික ප්‍රමිතිවලට යටත්ව, විදුලි බලය, ජලය, ඉන්ධන සහ වෙනත් බලශක්ති මූලාශ්‍ර ඇතුළු සියලු උපයෝගීතාවයන් තොග වශයෙන් ලබා ගැනීම, ගබඩා කිරීම, හිලව් කිරීම හෝ නැවත උත්පාදනය කිරීම සඳහා සහ විශේෂිතව සඳහන් ආයෝජන කලාප තුළ පිහිටි අස්තිත්වයන්ට ඒවා බෙදා හැරීම සහ උචිත පරිදි ඒ උපයෝගීතාවයන් සඳහා ගාස්තු අය කිරීම සඳහා වෙනත් ආයතන හෝ නියෝජ්‍යායතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ප) ආයෝජන කලාප තුළ සෝන්ස් එස්එල් මගින් ලබා දෙන බද්දට දීම්, කුලියට දීම් සහ වෙනත් පහසුකම් සම්බන්ධයෙන් ගාස්තු, අය කිරීම් හෝ වෙනත් ගෙවීම් අය කිරීම සහ නැවත අයකර ගැනීම;

(බ) මේ කොටස යටතේ සෝන්ස් එස්එල් හි කර්තව්‍ය ඉටු කිරීමට හැකිවනු පිණිස සෝන්ස් එස්එල් විසින් උචිත යයි සලකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව උපදේශකයන් සහ අනුශාසකයන් ඇතුළු නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කරවීම;

(ම) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම ඇතුළු සෝන්ස් එස්එල් විසින් අවශ්‍ය යයි සලකනු ලබන ආකාරයකට ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම;

(ය) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(අඅ) ඉහත සඳහන් කළ පරිදි වන සෝන්ස් එස්එල් හි අරමුණු සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තන්ට හෝ අස්තිත්වයකට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දීම;

(අආ) කලාප මට්ටමින් හෝ ආයෝජන කලාප කිහිපයක් ඒකාබද්ධ කිරීම මගින් විශේෂ කාර්ය ආයතන පිහිටුවීම සහ අවශ්‍ය නම් ආයෝජනය පෞද්ගලික අංශය වෙත පිට කිරීම;

(අඇ) ආයෝජන කලාපය තුළ සේවකයන් සඳහා වන නවාතැන් පහසුකම් ඇතුළු අවශ්‍ය සමාජ යටිතල පහසුකම් පිහිටුවීම;

(අඈ) ස්වකීය කර්තව්‍ය විචක්ෂණ ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන විශේෂඥයන් හෝ උපදේශකයන් පත් කිරීම; සහ

(අඉ) මේ කොටස යටතේ සෝන්ස් එස්එල් හි අරමුණු සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ වැදගත් විය හැකි වෙනත් යම් ක්‍රියා සිදු කිරීම.

(2) 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන යම් කලාපයක් තුළ වූ යම් ඉඩමක් සෝන්ස් එස්එල් හි අරමුණු ඉටු කර ගැනීම සඳහා සහ මේ කොටස යටතේ සාදන ලද යම් සැලසුමක්, වැඩසටහනක් හෝ යෝජනාක්‍රමයක් අනුව ආයෝජන කලාපයක් සංවර්ධනය කිරීම සඳහා යම් පුද්ගල මණ්ඩලයක් සතු කිරීම හෝ එවැන්නකට බද්දට දීම කළ හැකි ය.

(3) සෝන්ස් එස්එල් විසින්, යම් ලිඛිත නීතියකට යටත්ව, යම් නම් කරන ලද ආයෝජන කලාපයක පරාමිතිය දක්වා එහි සංවර්ධනය, ක්‍රියාකාරීත්වය සහ එය පවත්වාගෙන යාම සහ උචිත යටිතල පහසුකම් සඳහා මූල්‍යමය සහාය ලබා දීම සිදු කිරීම හෝ අනුමත කිරීම කළ හැකි ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "විශේෂ කාර්ය ආයතන" යන්නෙන් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් අදහස් වේ.

**64.** සෝන්ස් එස්එල් හි කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යඃ- සෝන්ස් එස්එල් හි කාර්ය සහ කර්තව්‍ය

(අ) ආර්ථික කොමිෂන් සභාව විසින් ක්‍රමවත්ව දක්වනු ලබන ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම, අපනයන සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීම පිණිස ආයෝජන කලාපවල අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යයන සිදු කිරීම;

(ආ) ආර්ථික කලාප පිහිටුවීම සඳහා ස්ථාන හඳුනා ගැනීම සහ තෝරා ගැනීම;

(ඇ) ආයෝජන කලාප පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීම පිණිස ඒ ආයෝජන කලාප පිළිබඳව ආර්ථික කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඈ) ආයෝජන කලාප සෘජුව ම හෝ අර්ථික කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද හවුල් ව්‍යාපාරයක්, බද්ධ ව්‍යාපාරයක් හෝ කළමනාකරණ ගිවිසුමක් හෝ වෙනත් යම් වැඩපිළිවෙළක් හරහා කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඉ) මෙහි විධිවිධාන සලසා ඇති නීති සහ නියෝග යටතේ අනුමතයන් සහ බලය ලබා දීම් ප්‍රදානය කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීම;

(ඊ) ආයෝජන කලාප ක්‍රියාත්මක කිරීම සඳහා සහ ආයෝජන කලාප තුළ ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය විය හැකි පරිදි යම් ආණ්ඩුවේ ආයතනයක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධව කටයුතු කිරීම; සහ

(උ) ඉහත අරමුණුවලින් යම් අරමුණක් හෝ ඒ අරමුණු සියල්ල ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි සියලු ක්‍රියා සිදු කිරීම.

## XVII වන පරිච්ඡේදය

### සෝන්ස් එස්එල් පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

සෝන්ස් එස්එල් මණ්ඩලයේ සංයුතිය

**65.** (1) සෝන්ස් එස්එල් හි කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මේ කොටසේ "සෝන්ස් එස්එල් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, සෝන්ස් එස්එල් හි කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, මේ කොටස යටතේ සෝන්ස් එස්එල් වෙත පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද හෝ සෝන්ස් එස්එල් හි කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා II වන කොටස යටතේ ආර්ථික කොමිෂන් සභාව විසින් සෝන්ස් එස්එල් වෙත පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) සෝන්ස් එස්එල් මණ්ඩලය, සාමාජිකයන් හත් දෙනෙකුට නොවැඩි පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) නිලබලයෙන් පත්වන පහත දැක්වෙන සාමාජිකයන්ː-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ධුරයට වඩා අඩු නොවන ධුරයක නිලධරයකු විය යුතු ඔහුගේ නාමිකයා;

(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ධුරයට වඩා අඩු නොවන ධුරයක නිලධරයකු විය යුතු ඔහුගේ නාමිකයා;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවක අධ්‍යක්ෂ ජනරාල් ධුරයට වඩා අඩු නොවන ධුරයක නිලධරයකු විය යුතු ඔහුගේ නාමිකයා; සහ

(iv) ආර්ථික කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා; සහ

(ආ) කළමනාකරණය, ආයෝජනය, මුදල්, නීතිය, තොරතුරු තාක්ෂණය, නිෂ්පාදනය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල දැනුම, විශේෂඥභාවය සහ පළපුරුද්ද සහ ජාතික හෝ

ජාත්‍යන්තර පිළිගැනීම ඇති ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් හතර දෙනෙකු.

සෝන්ස් එස්එල් හි සභාපතිවරයා

**66.** (1) අමාත්‍යවරයා විසින්, ආර්ථික කොමිෂන් සභාව විමසා, පත් කළ සාමාජිකයන් අතරින් එක් පත් කළ සාමාජිකයකු සෝන්ස් එස්එල් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින්, තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, තත්කාර්යය සඳහා දක්වනු ලබන හේතු අනුව සභාපතිවරයා, සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහු ධුරය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, සභාපතිවරයා ලෙස වැඩ බැලීම සඳහා වෙනත් පත් කළ සාමාජිකයකු, ඒ සාමාජිකයාගේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට ඇති නුසුදුසුකම්

**67.** සෝන්ස් එස්එල් මණ්ඩලයට පත් කරනු ලැබූ යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු බවට පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ ඔහු සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරන ලදුව නිදහස් නොකරන ලද වස්තු භංගත්වයට පත් වූවකු හෝ බුන්වත් වූවකු නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) සෝන්ස් එස්එල් විසින් හෝ එය වෙනුවෙන් එළඹෙන ලද ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්;

(උ) සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ඒ තැනැත්තා විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අගතිදායක ලෙස බලපෑමට ඉඩ ඇති ඍජු හෝ වක්‍ර මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඇත්නම්; හෝ

(ඌ) මින් පෙර ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

ධුර කාලය

**68.** සෝන්ස් එස්එල් මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයෙකු විසින් ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකට තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**69.** (1) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට, තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(2) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙකුෟ-

(අ) රෝගාතුර වීම හෝ යම් අශක්නුතාවක් නිසා තම ධුරයේ කටයුතු ඉටු කිරීමට ඒ තැනැත්තාට නොහැකි නම් ලිඛිත දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් ඒ පත් කළ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) ඒ තැනැත්තා වංචාවකට, බරපතළ විෂමාචාරයකට හෝ බරපතළ නොසැලකිල්ලකට වරදකරු වී ඇති බවට හෝ වහාම බලපැවැත්වෙන පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබීමට හේතු වන (නිතිපතා රැස්වීම්වලට නොපැමිණීම ඇතුළු) ඒ තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට ඒ තැනැත්තාට නොහැකි බවට ඉදිරිපත් කර ඇති නියෝජන සලකා බලා ඒ පිළිබඳව අමාත්‍යවරයා සෑහීමට පත්වන්නේ නම් අමාත්‍යවරයා විසින් ඒ පත්කළ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) යම් පත්කළ සාමාජිකයකු සෝන්ස් එස්එල් මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට හෝ යම් ලිත් වර්ෂයක මණ්ඩලයේ රැස්වීම්වලින් තුනෙන් එකකට, සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් එසේ නොපැමිණ සිටීමට අවසර ලබාදීමකින් තොරව නොපැමිණියහොත් සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තවදුරටත් කටයුතු කරගෙන යාමට ඒ සාමාජිකයා නුසුදුස්සකු විය යුතු ය.

(4) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම මගින් ධුරය අත්හරිනු ලැබුවහොත් අමාත්‍යවරයා විසින්, 65 වන සහ 67 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුරය කාලය සඳහා ධුර දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස අනුගාමී හෝ අන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

**70.** (1) සෝන්ස් එස්එල් මණ්ඩලයේ අභිමතය ක්‍රියාත්මක කිරීමට අදාළ හෝ එහි ඡන්දය ලබා දීමට අදාළ හෝ විධානවලට අදාළ යම් තැනැත්තකු, සමාගමක්, ආයෝජනයක් හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍රාකාර සම්බන්ධතාවයක් ඇති සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් සාමාජිකයෙකු විසින්, ඒ සම්බන්ධතාවයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයාට ලිඛිතව දන්වනු ලැබිය යුතු අතර ඒ හෙළිදරව් කිරීම, එවැනි කාරණා පිළිබඳව සාකච්ඡා කරනු ලබන සෝන්ස් එස්එල් මණ්ඩලයේ රැස්වීම්වල දී යථා පරිදි වාර්තාගත කරනු ලැබිය යුතු ය. ඒ සාමාජිකයා විසින්, එවැනි කාරණා පිළිබඳව සාකච්ඡා කරනු ලබන රැස්වීමකට සහභාගී වීම හෝ ඒ සම්බන්ධතාවයට සෘජු හෝ වක්‍රාකාර ලෙස අදාළ වන යම් තීරණයක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම කරනු නොලැබිය යුතු ය. සම්බන්ධතා ගැටුම්

(2) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි යම් සම්බන්ධතා ගැටුමක් පිළිබඳව හෙළිදරව් කිරීම පැහැර හරින්නේ නම් හෝ අතපසු කරන්නේ නම්, ඒ සාමාජිකයා සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකමකට යටත් විය යුතු ය.

**71.** (1) සෝන්ස් එස්එල් මණ්ඩලයේ රැස්වීම්, මාස තුනකට වරක් හෝ මේ කොටස මගින් සෝන්ස් එස්එල් මණ්ඩලයට පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබිය යුතු ය. රැස්වීම්වල කාර්යපටිපාටිය

(2) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(3) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් රැස්වීමක්-

(අ) රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින ගණපූරණය සංස්ථාපනය කරන සාමාජිකයන් විසින්; හෝ

(ආ) රැස්වීමට සහභාගී වන සහ ගණපූරණය සංස්ථාපනය කරන සියලු සාමාජිකයන්හට, රැස්වීම පවත්වනු ලබන කාලසීමාව තුළ රැස්වීමට සහභාගී වන එක්

එක් සාමාජිකයා සමගාමීව දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන ක්‍රම මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වන සියලු ප්‍රශ්න, ඒ රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන බහුතර සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු එම සෝන්ස් එස්එල් මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගනු ලබන යම් සාමාජිකයකු සෝන්ස් එස්එල් මණ්ඩලයේ ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, සෝන්ස් එස්එල් මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් නියාමනය කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව මත සෝන්ස් එස්එල් මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු බලරහිත නොවන බවට සැලකිය යුතු බව

**72.** සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම නොතකා කටයුතු කරනු ලැබිය හැකි ය. සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය; නැතහොත් බලරහිත බවට සලකනු නොලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**73.** අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ මත සභාපතිවරයාට සහ සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

**74.** (1) සෝන්ස් එස්එල් හි මුද්‍රාව සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය. සෝන්ස් එස්එල් හි මුද්‍රාව

(2) සෝන්ස් එස්එල් හි මුද්‍රාව-

(අ) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තබනු ලැබිය යුතු ය.

(3) සෝන්ස් එස්එල් හි මුද්‍රාව, සෝන්ස් එස්එල් මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට සෝන්ස් එස්එල් හි මුද්‍රාව තබන අවස්ථාවේ දී සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි අවස්ථාවක දී, සභාපතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් ලිඛිතව බලය දෙන ලද සෝන්ස් එස්එල් මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානයට අනුකූලව ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීම සඳහා නිසි බලය තිබිය යුතු ය.

(4) සෝන්ස් එස්එල් හි මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛනවල රෙජිස්ටරයක් සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

## XVIII වන පරිච්ඡේදය

### සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය

**75.** (1) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් ආර්ථික කොමිෂන් සභාව විමසා පත් කරනු ලබන (මෙහි මින්මතු "සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයා

සෝන්ස් එස්එල්හි ගණන් දීමේ නිලධරයා ද විය යුතු ප්‍රධාන විධායක නිලධරයකු සිටිය යුතු ය.

(2) සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයා ලෙස පත්කරනු ලැබිය යුතු තැනැත්තාගේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයාගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා, සෝන්ස් එස්එල් මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළු සෝන්ස් එස්එල් හි කටයුතු පරිපාලනය කිරීම භාරව සිටිය යුතු ය;

(ආ) සෝන්ස් එස්එල් මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(4) සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාට සෝන්ස් එස්එල් මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීමට සහ රැස්වීම්වල දී කථා කිරීමට හිමිකම් තිබිය යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය භාවිත කිරීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(5) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, එසේ කිරීම අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන පරිදි මේ කොටස යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාට හෝ සෝන්ස් එස්එල් හි යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා හෝ සෝන්ස් එස්එල් හි ඒ නිලධරයා විසින් සෝන්ස් එස්එල් හි විධානයට සහ අධීක්ෂණයට යටත්ව පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(6) සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා විසින්, සෝන්ස් එස්එල් මණ්ඩලයේ අනුමතය ඇතිව, කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන පරිදි සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් පරිපාලන ඒකකයකට හෝ යම් නිලධරයකුට

හෝ සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර එසේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරන ලද ඒ පරිපාලන ඒකකය හෝ නිලධරයා හෝ සේවානියුක්තයා විසින්, ඒ සඳහා වගකියනු ලැබිය යුතු අතර සෝන්ස් එස්එල් මණ්ඩලයේ හෝ සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාගේ විධානය සහ අධීක්ෂණය යටතේ ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(7) මේ කොටස යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා විසින් සෝන්ස් එස්එල් මණ්ඩලයට වගකියනු ලැබිය යුතු ය.

(8) සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා-

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමට ස්ථිරව ම නොහැකි තත්ත්වයට පත් වන්නේ නම්;

(ආ) සෝන්ස් එස්එල් මණ්ඩලයේ මතය අනුව වංචනික, නීති විරෝධී ස්වභාවයේ හෝ සෝන්ස් එස්එල් හි යහපතට අගතිගාමී වන යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී ඇත්නම්,

සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, ආර්ථික කොමිෂන් සභාව විමසා සහ (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා ඉවත් කරනු ලැබීමට පෙර, ඔහුව ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සඳහා නිදහසට කරුණු දක්වන ලෙසට වන ලිඛිත දැන්වීමක් සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර ඔහුට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබ ඇති යම් චෝදනා සම්බන්ධයෙන් කරුණු කියා පෑමට ඔහුට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

(10) මියයාම, (8) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඒ ධුරය දරන තැනැත්තා විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම

මත සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරය හිස් විය යුතු ය.

(11) සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් සිදු කරනු ලබන තෙක්, සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, ආර්ථික කොමිෂන් සභාව විමසා සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා සෝන්ස් එස්එල් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(12) සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, ආර්ථික කොමිෂන් සභාව විමසා තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාට ගෙවනු ලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් හි කාර්ය මණ්ඩලය

**76.** (1) සෝන්ස් එස්එල් විසින්, මේ කොටසේ විධිවිධාන යටතේ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි සෝන්ස් එස්එල් විසින් සලකනු ලබන සේවක සංඛ්‍යා පිහිටුවා නිලධරයන් සහ සේවානියුක්තයන් සේවයේ නියුක්ත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවයේ නියුක්ත කරන ලද නිලධරයන් හා සේවානියුක්තයන් සම්බන්ධයෙන් සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්-

(අ) ඒ නිලධරයන්ගේ හා සේවානියුක්තයන්ගේ සේවා නියුක්තියේ නියම හා කොන්දේසි තීරණය කිරීම;

(ආ) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා ඒ නිලධරයන් සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ නිශ්චය කිරීම;

(ඇ) ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම; සහ

(ඈ) ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට අදාළ විය යුතු චර්යා සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(4) සෝන්ස් එස්එල් විසින්, කලාප කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම සහ ඒ හා සම්බන්ධ විෂයයන් පිළිබඳව තාක්ෂණික නිලධරයන් පුහුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදු කළ යුතු අතර ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක දී ඒ නිලධරයන් විසින් සිදු කරනු ලබන අධ්‍යයනවල වියදම් ගෙවීම සඳහා සෝන්ස් එස්එල් වෙත නිසි බලය තිබිය යුතු ය.

(5) යම් තැනැත්තකු-

(අ) සිවිල් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් අපරාධ වරදකට හෝ බරපතළ විෂමාචාරයකට වරදකරු කරනු ලැබ ඇත්නම් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නියාමකයකු විසින් නියාමන උල්ලංඝනය කිරීමක්, චර්යා සංග්‍රහයක් උල්ලංඝනය කිරීමක් හෝ ඊට අදාළ වෙනත් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් නඩු කටයුතුවලට යටත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ආ) මේ කොටසේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන උල්ලංඝනය කිරීමක් සිදු කරනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා සෝන්ස් එස්එල් විසින් ස්වකීය කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් හි කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**77.** (1) සෝන්ස් එස්එල් හි ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව සෝන්ස් එස්එල් විසින් තීරණය කරනු ලැබිය හැකි කාල සීමාවක් සඳහා සෝන්ස් එස්එල් වෙත තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සෝන්ස් එස්එල් හි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 දී අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සෝන්ස් එස්එල් හි කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු සෝන්ස් එස්එල් විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් සෝන්ස් එස්එල් හි සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සිදු කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## XIX වන පරිච්ඡේදය

## මුදල්

සෝන්ස් එස්එල් හි මූල්‍ය කළමනාකරණය

**78.** සෝන්ස් එස්එල් මණ්ඩලය, සෝන්ස් එස්එල් හි මූල්‍ය කළමනාකරණය සහ 79 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද අරමුදල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම භාරව කටයුතු කළ යුතු ය.

සෝන්ස් එස්එල් හි අරමුදල

**79.** (1) සෝන්ස් එස්එල් හට (මේ කොටසේ "සෝන්ස් එස්එල් අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සෝන්ස් එස්එල් අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යः-

(අ) සෝන්ස් එස්එල් හි භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කර දෙනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) සෝන්ස් එස්එල් විසින් සෘජුව ම හෝ මේ කොටස යටතේ එය විසින් පිහිටුවන ලද අස්තිත්ව හරහා ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සෝන්ස් එස්එල් වෙත ලැබිය හැකි සියලු මුදල්;

(ඇ) මේ කොටසේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) විදේශ ආණ්ඩු හෝ නියෝජ්‍යායතන සහ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික නියෝජ්‍යායතන වෙතින් සංවර්ධන සහාය වශයෙන් ලැබෙන සියලු මුදල්:

එසේ වුව ද, මේ ඡේදය යටතේ ලැබෙන සියලු විදේශ සහාය සම්බන්ධයෙන් සෝන්ස් එස්එල් විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(3) පහත දැක්වෙන මුදල් සෝන්ස් එස්එල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු යඃ-

(අ) මේ කොටස යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සෝන්ස් එස්එල් විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ; සහ

(ආ) 13 වන වගන්තියේ (ක) ඡේදය යටතේ ආර්ථික කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, මේ කොටස යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සෝන්ස් එස්එල් විසින් අය කරනු ලබන ගාස්තුවලින් සියයට දහයක් දක්වා.

(4) සෝන්ස් එස්එල් අරමුදලට අයත් මුදල්, සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සෝන්ස් එස්එල් විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

මුදල් වර්ෂය සහ සෝන්ස් එස්එල් හි ගිණුම් විගණනය කිරීම

**80.** (1) සෝන්ස් එස්එල් හි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සෝන්ස් එස්එල් විසින් එහි ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ සෝන්ස් එස්එල් හි වෙනත් මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සෝන්ස් එස්එල් විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සෝන්ස් එස්එල් හි ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

(4) සෝන්ස් එස්එල් විසින්, එහි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## XX වන පරිච්ඡේදය

### ආයෝජන කලාප සඳහා ස්ථාන තෝරා ගැනීම ආදිය

ආයෝජන කලාප සඳහා ස්ථාන තෝරා ගැනීම සහ ආයෝජන කලාප පිහිටුවීම

81. (1) ආර්ථික කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම, අපනයන සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස ආයෝජන කලාප සඳහා ඇති අවශ්‍යතා පිළිබඳව සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් ආර්ථික කොමිෂන් සභාව විමසා අධ්‍යයන සිදු කළ යුතු ය.

(2) ස්වකීය අධ්‍යයනවල තීරණ මත ආයෝජන කලාප පිහිටුවීම සඳහා සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් ආර්ථික කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය. ඒ නිර්දේශවලට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) යම් ආයෝජන කලාප පිහිටුවීම සඳහා ව්‍යාපාරික සාධාරණීකරණය;

(ආ) ස්ථානය තෝරා ගැනීම සහ පිහිටීම;

(ඇ) ඒ ආයෝජන කලාප තුළ ඉලක්ක කරගනු ලැබිය යුතු, ප්‍රවර්ධනය කරනු ලැබිය යුතු සහ පිහිටුවනු ලැබිය යුතු යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ අංශ;

(ඈ) ඒ ආයෝජන කලාප තුළ ආයෝජන පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමතයන් සහ බලය ලබා දීම්;

(ඉ) ඒ ආයෝජන කලාප තුළ ආයෝජන පිහිටුවීම සඳහා ආයෝජකයන්ට ප්‍රදානය කරනු ලැබීමට අවශ්‍ය විය හැකි දිරිගැන්වීම් හෝ නිදහස් කිරීම්;

(ඊ) ඒ ආයෝජන කලාප සෞම්‍ය සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමට හැකිවනු පිණිස ආයතනික සැලැස්ම සහ භෞතික යටිතල පහසුකම් සපයා දීමේ කාර්යය සඳහා ආණ්ඩුවෙන් හෝ යම් පළාත් පාලන ආයතනවලින් හෝ නියෝජ්‍යායතනවලින් අවශ්‍ය විය හැකි යම් උපසේවී සහාය සේවා;

(උ) සෝන්ස් එස්එල් මගින් සෘජුව ම හෝ පෞද්ගලික පාර්ශ්ව ඇතුළු වෙනත් යම් පාර්ශ්වයක් සමඟ බද්ධ ව්‍යාපාර වශයෙන් හෝ කළමනාකරණ ගිවිසුම්වල පදනම මත ඒ ආයෝජන කලාප ක්‍රියාත්මක කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ක්‍රමවේදය;

(ඌ) ඒ ආයෝජන කලාප තුළ සිටින ඒවා භාවිත කරන අයගෙන් අය කරගනු ලබන හෝ පනවනු ලබන ගාස්තු හෝ අය කිරීම්; සහ

(එ) ඒ ආයෝජන කලාප පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම අදාළ විය හැකි වෙනත් යම් කාරණා.

(3) ආයෝජන කලාපයක් පිහිටුවීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු, අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත ව අවශ්‍ය විය හැකි පරිදි, (450 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ හෝ (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් පනත යටතේ එහි ප්‍රදානයක් හෝ බදු දීමක් වශයෙන් යෝජිත ස්ථානය අත්කර ගැනීමෙන් පසු, සෝන්ස් එස්එල් වෙත ඒ ස්ථානය පවරා දීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව සෝන්ස් එස්එල් වෙත පවරා දී ඇති යම් ඉඩමක් පොදු කාර්යයක් සඳහා වන බවට සලකනු ලැබිය යුතු ය.

**82.** වෙනත් කරුණු අතර, පහත දැක්වෙන කාරණා පිළිබඳව සහතික වෙමින් ආයෝජන කලාප පිහිටුවීම සඳහා සෝන්ස් එස්එල් වගකිව යුතු යː- ආයෝජන කලාප පිහිටුවීම

(අ) ස්ථානීය සැලසුම් පිළියෙල කිරීම, උපයෝගීතාවයන් සැපයීම සහ ආයෝජන කලාපය තුළ ස්ථානගත විය හැකි ආයෝජනවල ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීමේ කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යටිතල පහසුකම් ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී ආයෝජන කලාපය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය නියාමන, ආයතනික සහ භෞතික යටිතල පහසුකම් නිර්මාණය කිරීම සඳහා උචිත වැඩපිළිවෙළවල් සකස් කිරීම;

(ආ) ආයෝජන කලාපවල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දිගටම පවත්නා බලතල හිමි සියලු අදාළ බලධරයන්ගෙන් පූර්ව නිෂ්කාශන සහ අනුමතයන් ලබා ගැනීම;

(ඇ) අමාත්‍යවරයා විසින්, නියෝග මගින්, කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වූ රීති සහ කාර්යපටිපාටි නිසි පරිදි සකස් කරනු ලබන බවට සහතික වීම;

(ඈ) ඒ පාර්ශ්වයන් රජයේ පාර්ශ්වයන් හෝ පෞද්ගලික තැනැත්තන් හෝ අස්තිත්ව වුව ද, ආයෝජන කලාපය පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය බවට සලකනු ලැබිය හැකි පරිදි ගිවිසුම්වලට එළඹීම; සහ

(ඉ) ආයෝජන කලාප තුළ යම් තැනැත්තකුට ලබාදෙනු ලැබිය හැකි සේවා සඳහා ගාස්තු හෝ අය කිරීම් සඳහා යෝජනාක්‍රම සකස් කිරීම.

ආයෝජන කලාප ක්‍රියාත්මක කිරීම සහ කළමනා-කරණය කිරීම

**83.** සෝන්ස් එස්එල් මණ්ඩලය විසින්, ආර්ථික කොමිෂන් සභාව විමසා, එක් එක් ආයෝජන කලාපය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සහ කළමනාකරණය කරනු ලැබිය යුතු ව්‍යුහය තීරණය කරනු ලැබිය යුතු ය. සෝන්ස් එස්එල් මණ්ඩලයේ සහ ආර්ථික කොමිෂන් සභාවේ අභිමතය සීමා නොකර ඒ ආයෝජන කලාප, සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් හෝ (දේශීය වුව ද විදේශීය වුව ද) තෙවන පාර්ශ්වයන් සමඟ ඇතිකර ගනු ලබන බද්ධ ව්‍යාපාර මගින් හෝ කළමනාකරණ ගිවිසුම්වල පදනම මත කළමනාකරණය කරනු ලැබිය හැකි ය.

**84.** (1) ආයෝජන කලාප සංවර්ධකයකුට හෝ ක්‍රියාකරුවකුට පහත දැක්වෙන අයිතිවාසිකම් තිබිය යුතු යඃ- ආයෝජන කලාප සංවර්ධකයන්ගේ හෝ ක්‍රියාකරුවන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්

(අ) යම් නියෝග සහ නියම කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් බලපත්‍ර ලබා දීමේ අවශ්‍යතාවලට යටත්ව, ආයෝජන කලාපයෙහි කළමනාකාරීත්වය සහ පරිපාලනය භාරව ක්‍රියා කිරීමට හෝ සෝන්ස් එස්එල් හි එකඟත්වය ඇතිව තමන් වෙනුවෙන් එසේ ක්‍රියා කිරීමට ක්‍රියාකරුවකු පත් කිරීම;

(ආ) ඉඩම් හෝ ගොඩනැගිලි බලපත්‍රලත් ආයෝජන කලාප ක්‍රියාකරුවන්ට සහ ව්‍යවසායයන්ට බදු දීම හෝ අතුරු බදු දීම සහ ලබා දෙනු ලැබිය හැකි වෙනත් සේවා සඳහා කුලිය හෝ ගාස්තු අය කිරීම;

(ඇ) ආයෝජන කලාප ඉඩම් හෝ වෙනත් වත්කම් අත්කර ගැනීම;

(ඈ) අදාළ නියෝග සහ නීති සහ ස්වකීය බලපත්‍රවලට අනුකූලව ආයෝජන කලාප ඉඩම් සහ වෙනත් වත්කම් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සේවා සැපයීම;

(ඉ) ස්වකීය බලපත්‍රයට අනුකූලව ආයෝජන කලාපය තුළ උපයෝගීතා සහ වෙනත් සේවා සැපයීම සහ ඒ සේවා සඳහා ගාස්තු අය කිරීම;

(ඊ) අදාළ ලිඛිත නීතියට අනුකූලව ආයෝජන කලාපයෙන් පිටත උපයෝගීතා සහ වෙනත් සේවා ලබා දීම;

(උ) ආයෝජන කලාප ඉඩම් සහ ස්ථානය තුළ වූ යටිතල පහසුකම් සහ ස්ථානයෙන් පිටත යටිතල පහසුකම් ඇතුළු වෙනත් වත්කම් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සේවා සැපයීම පිණිස පෞද්ගලික තෙවන පාර්ශ්ව සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ඌ) අරමුදල්, ණය, ඇපකර සහ වෙනත් මූල්‍ය සම්පත් ලබා ගැනීම සඳහා යම් නෛතික බාධා හෝ සීමා කිරීම්වලින් තොරව, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවලට ඇතුළු වීම සහ ඒවාට නිදහසේ සහභාගි වීම ; සහ

(එ) අනාගත ආයෝජකයන් සහ සේවා සපයන්නන් සඳහා තමා බලපත්‍රය දරන ආයෝජන කලාපය ප්‍රචාරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(2) ආයෝජන කලාප සංවර්ධකයකු විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි -

(අ) ආයෝජන කලාපයට සහ එහි පහසුකම්වලට, සෝන්ස් එස්එල් විසින් අනුමත කරන ලද සැලසුම්වලට අනුකූලව, අවශ්‍ය විය හැකි පරිදි වූ භෞතික සංවර්ධන වැඩ ඉටු කිරීම හෝ එවැනි වැඩිදියුණු කිරීම් සිදු කිරීම;

(ආ) කලාපයට ඇතුළුවන සහ කලාපයෙන් පිටවන පුද්ගලයින්, වාහන, යාත්‍රා සහ භාණ්ඩවල සංචරණය සම්බන්ධයෙන් වූ සුදුසු විධිවිධාන සහිතව, අදායම් ආරක්ෂා කිරීම සඳහා කලාප ප්‍රදේශය සාමාන්‍ය භූමි ප්‍රදේශයෙන් වෙන් කිරීම පිණිස ප්‍රමාණවත් වෙන් කර වසා තැබීම් සිදු කිරීම;

(ඇ) සෝන්ස් එස්එල් විසින්, ස්වකීය බලපත්‍රයෙහි තීරණය කරනු ලැබිය හැකි පරිදි ආයෝජන ස්ථානයේ දී ප්‍රමාණවත් ආරක්ෂාවක් සැලසීම හෝ සැලසීමට කටයුතු කිරීම;

(ඈ) ආරක්ෂිත සහ කාර්යක්ෂම ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කරන නියෝග ආයෝජන කලාපය තුළ යොදා ගැනීම සහ ක්‍රියාවට නැංවීම;

(ඉ) ස්වකීය ක්‍රියාකාරකම්, සේවා නියුක්තියෙහි සංඛ්‍යාලේඛන, ව්‍යාපාර පිළිබඳ ප්‍රමාණවත් සහ නිසි ගිණුම් සහ වෙනත් වාර්තා පවත්වාගෙන යාම සහ කලාපයෙහි ක්‍රියාකාරකම්, කාර්යසාධනය සහ සංවර්ධනය පිළිබඳව කලින් කලට වූ පදනමක් මත හෝ සෝන්ස් එස්එල් විසින් නියම කරනු ලබන පරිදි වාර්තා කිරීම; සහ

(ඊ) සියලු බදු ගිවිසුම් සෝන්ස් එස්එල් සමඟ ලියාපදිංචි කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ නියම කර ඇති ගිණුම් සහ වාර්තා, කවර හෝ රාජ්‍ය භාෂාවකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය මගින් නියම කර ඇති පරිදි ප්‍රමාණවත් සහ නිසි පරිදි වූ ගිණුම් සහ වෙනත් වාර්තා පවත්වාගෙන යාම පැහැර හරින හෝ මේ කොටස යටතේ සාදනු ලබන රීති සහ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින ආයෝජන කලාප සංවර්ධකයකු හෝ ක්‍රියාකරුවකු විසින් වරදක් සිදු කරනු ලබන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනක් නොඉක්මවන හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් (ඇජඩො) දස දහසකට නොඅඩු මුදල් ප්‍රමාණයකට සමාන වන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

තාක්ෂණික කමිටු

**85.** ස්වකීය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍යයයි සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් සලකනු ලබන යම් තාක්ෂණික කමිටුවක් හෝ විශේෂඥයන් සෝන්ස් එස්එල් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

විනිවිද භාවය

**86.** (1) (අ) ආයෝජන කලාපයේ කටයුතු පිළිබඳව වන සියලු නීති, නියෝග, නියම, රීති සහ නීතිය මගින් අවසර දෙනු ලැබ ඇති අවස්ථාවල දී, නඩු තීන්දු සහ පරිපාලන රීති, ඒ තොරතුරුවලට සහ කරුණුවලට ආයෝජකයින්ට පහසු ප්‍රවේශය ලබා දීම පිණිස එක් වෙබ් අඩවියක පළ කිරීමට සෝන්ස් එස්එල් විසින් උත්සාහ කළ යුතු ය.

(ආ) ආයෝජන කලාප තුළ ආයෝජකයන් වශයෙන් ස්වකීය අයිතිවාසිකම්වලට බලපාන තීරණ ගැනීමට පෙර හෝ නීති, නියෝග, රීති, විධාන හෝ නියම පැනවීමට පෙර, සෝන්ස් එස්එල් විසින් ඒ සම්බන්ධයෙන් ආයෝජකයන් විමසනු ලැබිය යුතු අතර, නියෝජන ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් අවස්ථාවක් සෝන්ස් එස්එල් විසින් ආයෝජකයන්ට ලබා දෙනු ලැබිය යුතු ය.

(2) ආයෝජන කලාපයක් තුළ ආයෝජකයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් යම් ආයෝජකයකුට හෝ ආයෝජනයකට එරෙහිව පරිපාලන නඩු කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ නඩු කටයුතුවලට අදාළ නීතිය යටතේ යම් පුරවැසියකුට ලබා දී ඇති අයිතිවාසිකම්, කාර්යපටිපාටි සහ නිසි ක්‍රියාපිළිවෙළ ආයෝජකයාට සහ එවැනි ආයෝජනවලට ද ලබා දෙනු ලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් සහ ආයෝජකයන් අතර ආරාවුල් විසඳීම

**87.** (1) ආයෝජන කලාප තුළ සෝන්ස් එස්එල් සහ ආයෝජකයන් අතර ඇතිවන යම් ආරාවුලක් වහාම සහ සාමකාමීව සාකච්ඡා සහ ගිවිසගැනීම් මගින් විසඳා ගනු ලැබිය යුතු ය.

(2) සාමකාමී විසඳුමකට එළඹිය නොහැකි අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ නීති යටතේ පවතින සියලු ප්‍රතිකර්ම භාවිත කිරීමේ අයිතිය ඒ ආයෝජකයන් සතු විය යුතු ය.

කම්කරු ආරාවුල් විසඳා ගැනීම

**88.** සෝන්ස් එස්එල් විසින්, කාර්මික ආරාවුල් සහ ආයෝජකයන් සහ ආයෝජන කලාපවල සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සේවකයන් අතර ඇති ආරාවුල් සඳහා කඩිනම් විසඳුම් ලබා දෙනු ලැබිය යුතු ය. ඒ කාර්යය සඳහා ආරාවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම හෝ ආරාවුල් බේරුම් කිරීමේ වෙනත් යම් ක්‍රමවේද නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

දිරිගැන්වීම්

**89.** සෝන්ස් එස්එල් විසින් පරිපාලන දිරි දීමනා සහ මේ කොටසේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති නීතිවලින් නිදහස් කිරීම්, කලින් කලට ආයෝජන කලාප තුළ සිටින ආයෝජකයන්ට ප්‍රදානය කිරීම සඳහා ආර්ථික කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

## XXI වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

අනුමතයන් කඩිනම් කිරීම සඳහා වූ ආර්ථික කොමිෂන් සභාවේ විශේෂ බලතල

**90.** (1) ආයෝජන ප්‍රවර්ධන කලාපයක් තුළ ආයෝජනයක් කිරීම සඳහා සෝන්ස් එස්එල් වෙත ඉල්ලීමක් කරනු ලබන ආයෝජකයකුට, (මින් මතු ''නිශ්චිතව සඳහන් ආයතන'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් නම් කරනු ලබන සහ මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන, සෝන්ස් එස්එල්, නියාමන අධිකාරීන් හෝ මණ්ඩල වෙතින් යම් අනුමතයන්, බලය ලබා දීම්, හෝ අවසරපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ අනුමතයන්, බලය ලබා දීම් හෝ අවසරපත්‍ර සම්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීමට සෝන්ස් එස්එල් වෙත බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව අනුමතයන්, බලය ලබා දීම් හෝ අවසරපත්‍ර සඳහා සෝන්ස් එස්එල් විසින් යම් නිශ්චිතව සඳහන් ආයතනයකින් විමසීමක් කරනු ලබන හෝ ඉල්ලීමක්

කරනු ලබන අවස්ථාවක දී, ඒ විමසීම හෝ ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් දින පහළොවක් ඇතුළත ඒ විමසීමට හෝ ඉල්ලීමට කැමැත්ත පළ කරමින් හෝ ඊට විරෝධය පළ කරමින් ප්‍රතිචාර දැක්වීමට ඒ නිශ්චිතව සඳහන් ආයතනය බැඳී සිටිය යුතු ය. ඒ නිශ්චිතව සඳහන් ආයතනය විසින් ඒ විමසීමට ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් හෝ ඒ ඉල්ලීම ප්‍රතිෂේධනය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිෂේධනය කිරීම සඳහා වූ හේතු, දින විසි එකක කාලසීමාවක් ඇතුළත ලිඛිතව ලබා දෙන ලැබිය යුතු ය.

(3) සෝන්ස් එස්එල්ට තම කාර්ය ඉටු කිරීමට සහ අරමුණු ළඟා කර ගැනීමට හැකිවන පරිදි සියලු නිශ්චිතව සඳහන් ආයතන විසින් සෝන්ස් එස්එල් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, මේ කොටස යටතේ සාදනු ලබන නියෝග මගින්, එසේ සහයෝගය දැක්වීම සඳහා වූ කාර්යපටිපාටිය නියම කරනු ලැබිය හැකි අතර, සාකච්ඡාමය ක්‍රියාවලියක් හරහා සෝන්ස් එස්එල් විසින් පිහිටුවන ලද ආයෝජන ව්‍යාපෘතිවලට අනුමතයන් ලබා දීම පිළිබඳ පවතින මෙහෙයුම් ක්‍රියාපටිපාටියට අනුව නිශ්චිතව සඳහන් ආයතන විසින් ඒ කාර්යපටිපාටියට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාරව වන විමසීමකට හෝ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම, නිශ්චිතව සඳහන් ආයතනක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් හෝ ප්‍රතිෂේධනය කරනු ලබන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම්, සෝන්ස් එස්එල් විසින්, සුදුසු යයි සලකනු ලබන්නේ නම්, ඒ ප්‍රතික්ෂේප කිරීම, ප්‍රතිෂේධනය කිරීම හෝ පැහැර හැරීම වහාම අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අමාත්‍යවරයා විසින්, සති දෙකක් ඇතුළත, ඒ කාරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් හි සාමාජිකයන්, නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව

**91.** සෝන්ස් එස්එල් මණ්ඩලයේ සියලු සමාජිකයන්, සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා සහ සෝන්ස් එස්එල් හි සියලු නිලධරයන් සහ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සෝන්ස් එස්එල් උපලේඛනගත ආයතනයක් බවට සලකනු ලැබිය යුතු බව

**92.** සෝන්ස් එස්එල්, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

මේ පනත යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂාව

**93.** අවස්ථාවෝචිත පරිදි, මේ කොටස යටතේ හෝ සෝන්ස් එස්එල් මණ්ඩලයේ විධානය මත, සෝන්ස් එස්එල් මණ්ඩලයේ යම් සාමාජිකයකු, සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයා, සෝන්ස් එස්එල් හි නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, තමා සද්භාවයෙන් ක්‍රියා කළ බවට සහ නිසි උද්යෝගයෙන්, සාධාරණ සැලකිල්ලෙන් සහ නිපුණතාවයෙන් යුතුව ක්‍රියාකළ බවට ඔහු ඔප්පු කරන්නේ නම් සෝන්ස් එස්එල් මණ්ඩලයේ ඒ සාමාජිකයාට, සෝන්ස් එස්එල් ප්‍රධාන විධායක නිලධරයාට, සෝන්ස් එස්එල් හි නිලධරයාට හෝ සේවානියුක්තයාට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු කටයුතු ආරම්භ කරනු නොලැබිය යුතු ය.

නියෝග

**94.** (1) අමාත්‍යවරයා විසින්, සෝන්ස් එස්එල් මණ්ඩලය විමසා, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සෑදීමට බලය පවරනු ලැබ ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂිතව ම සහ (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවල පොදු බවට අගති විරහිතව, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) මේ කොටස යටතේ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි මේ කොටසේ උපලේඛනයේ සඳහන් ලිඛිත නීතිවල සඳහන් නිදහස් කිරීම්වල හෝ වෙනස් කිරීම්වල විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම;

(ආ) පහත දැක්වෙන කරුණු ඇතුළත්ව එහෙත් ඒවාට සීමා නොවී මේ කොටසේ විධිවිධාන ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් කරුණක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසː-

(i) ආයෝජන කලාප තුළ ස්ථාන වෙන් කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ කාර්යපටිපාටිය;

(ii) ආයෝජන කලාප තුළ ක්‍රියාත්මක වීම සඳහා වූ කාර්යපටිපාටිය;

(iii) රේගු කාර්යපටිපාටි, නිදහස් කිරීම් සහ පූර්ව නිෂ්කාශනය කිරීම් සහ ආයෝජන කලාප තුළ ප්‍රතිසැකසුම් සිදු කරන දෑ සඳහා කටයුතු කිරීම් ඇතුළු කාරණා සඳහා වූ කාර්යපටිපාටි;

(iv) මේ කොටස යටතේ හෝ වෙනත් යම් අදාළ නීති යටතේ අවශ්‍ය වන්නා වූ ලියාපදිංචි කිරීම්, අනුමතයන් සහ බලපත්‍ර ලබා දීම සඳහා වූ නිර්ණායක සහ ක්‍රියාපටිපාටි;

(v) කාර්ය මණ්ඩලයට අදාළ කාරණා සහ ඊට සම්බන්ධ වෙනත් සියලු කාරණාః

එසේ වුව ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද බීඕඅයි හි නිලධරයන් සහ සේවානියුක්තයන්, විසින් හිමිකම් කියන ලද සේවානියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක වන සේවානියුක්තියේ නියම සහ කොන්දේසි සඳහා විධිවිධාන සලසමින් මේ වගන්තිය යටතේ නියෝග සෑදීම නොකළ යුතු ය;

(vi) මේ කොටස යටතේ ලබාදෙන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සහ අයකිරීම්; සහ

(vii) ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කාලසීමාවන් තුළ දී සෝන්ස් එස්එල් සමඟ මේ කොටස යටතේ ලියාපදිංචි වීමට සියලු ආයෝජනවලට නියම කිරීම.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලබන දින සිට හෝ ඒ නියෝගයේ සඳහන් වෙනත් යම් පසු දිනයක සිට ඒ නියෝගය බලාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවන පරිදි, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති

**95.** (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, සෝන්ස් එස්එල් විසින්, මේ කොටස යටතේ රීති සෑදීම සඳහා බලය ලබා දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) සෝන්ස් එස්එල් විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම

**96.** (1) මේ කොටසේ විධිවිධාන බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවයක් මතු වුවහොත්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ දුෂ්කරතාවය ඉවත් කිරීම සඳහා අවශ්‍ය සහ යෝග්‍ය බවට අමාත්‍යවරයාට පෙනෙන පරිදි වූ, මේ කොටසේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ විධිවිධාන සලසනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු පහක කාලයක් ගතවීමෙන් පසු එවැනි නියමයක් කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, එය සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය ලැබීමෙන් පසුව පමණක් ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

**97.** මේ කොටසේ විධිවිධාන සහ (2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත හැර) ආයෝජන කලාපවලට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ කොටස බලපැවැත්විය යුතු බව

**98.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ -

අර්ථ නිරූපණය

"ආයෝජන මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"ආයෝජන කලාප" යන්නෙන්, මේ කොටස යටතේ හෝ මේ කොටසේ සඳහන් කරන ලද වෙනත් යම් නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරන ලද අපනයන පිරිසැකසුම් කලාප, කාර්මික කලාප, විශේෂ ආර්ථික කලාප, සේවා සැපයුම් කලාප හෝ යම් අංශයක් මත පදනම් වූ විශේෂ ආර්ථික කලාප සහ ආයෝජන පිහිටුවීම සඳහා වූ වෙනත් ඒ හා සමාන ප්‍රදේශ අදහස් වන අතර, ඊට ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ සඳහන් කරනු ලැබ ඇති පරිදි වූ බල ප්‍රදේශ සහ බලපත්‍රලත් කලාප ඇතුළත් විය යුතු ය;

"සමාජ යටිතල පහසුකම්" යන්නෙන්, ව්‍යවසායයන් හි සේවානියුක්තයන්ගේ යහපැවැත්ම සහ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අත්‍යවශ්‍ය පහසුකම් අදහස් වන අතර එයට දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වෛද්‍ය මධ්‍යස්ථාන, නවාතැන්, විනෝද පහසුකම් ඇතුළත් වේ.

## උපලේඛනය

(89 වන සහ 94 වන වගන්ති)

1. (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත
2. 2007 අංක 07 දරන සමාගම් පනත
3. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
4. 2021 අංක 18 දරන මුදල් පනත

5. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත
6. 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත
7. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත
8. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත
9. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත
10. 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩල පනත
11. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත
12. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

## IV වන කොටස

## XXII වන පරිච්ඡේදය

### ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය පිහිටුවීම

ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය පිහිටුවීම

**99.** (1) (මේ පනතේ "ඕඅයිටී"යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඕඅයිටී, (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් ඕඅයිටී විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ඕඅයිටී හි අරමුණු

**100.** ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, ඕඅයිටී හි අරමුණු පහත සඳහන් පරිදි විය යුතු යඃ-

(අ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(ඇ) ශ්‍රී ලාංකීය නිෂ්පාදන හා සේවා අපනයනය වර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) ශ්‍රී ලංකාව ඉන්දියානු සාගර කලාපයේ ප්‍රධාන වෙළෙඳ, ව්‍යාපාර සහ සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වන ප්‍රධාන නියෝජ්‍යායතනය ලෙස කටයුතු කිරීම.

ඕඅයිටී හි බලතල, කාර්ය සහ කර්තව්‍ය

**101.** (1) ඕඅයිටී හි බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු යः-

(අ) (i) වෙළෙඳපොළ පිවිසුම් බාධක ඉවත් කිරීම හෝ අඩු කිරීම සහ ශ්‍රී ලාංකීය භාණ්ඩවලට හා සේවාවලට ජාත්‍යන්තර වෙළෙඳපොළට ඇතුළු වීමට පහසුකම් සැලසීම;

(ii) පොදුවේ ශ්‍රී ලාංකීය භාණ්ඩ හා සේවා ද, විශේෂයෙන්, කාර්මික, කෘෂිකාර්මික සහ ධීවර නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සාධාරණ සැලකීමක් තහවුරු කිරීම; සහ

(iii) ශ්‍රී ලාංකීය භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම,

සඳහා වන පියවර ඇතුළුව ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳව අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආනයන සහ අපනයන ප්‍රතිපත්තිවල සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳව අවශ්‍ය අවස්ථාවල දී අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) (i) ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසගැනීම් ආරම්භ කිරීමට පෙරාතුව ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම; සහ

(ii) ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසගැනීම් සිදු කිරීමේ ක්‍රියාවලිය මුළුල්ලේ ම සම්බන්ධිත පාර්ශ්ව සමඟ අදහස් හුවමාරු කර ගැනීම;

(ඈ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර වෙළෙඳ ගිවිස ගැනීම් සිදු කිරීම සඳහා 114 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට සහාය වීම ;

(ඉ) පහත සඳහන් තැනැත්තන් විමසා යම් රටවල් සඳහා, යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව ජාත්‍යන්තර වෙළෙඳ නිලධරයකු පත් කිරීමඃ-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) විදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(iii) ආයෝජන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ

(iv) වෙළෙඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා:

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්, ඕඅයිටී මණ්ඩලය සහ (i) වන අනුඡේදයේ සිට (iv) වන අනුඡේදය දක්වා වූ අනුඡේදවල සඳහන් තැනැත්තන් විමසා ඒ ජාත්‍යන්තර වෙළෙඳ නිලධරයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(ඊ) ද්විපාර්ශ්වික වෙළෙඳාම සිදු කරනු ලබන රටවල් සංඛ්‍යාව පුළුල් කරමින් වෙනත් රටවල් සමඟ වූ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම;

(උ) මේ පනත යටතේ ඕඅයිටී හි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන්

පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම;

(ඍ) ඕඅයිටී හි කාර්ය සඳහා, යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම සහ දැරීම සහ ඕඅයිටී විසින් මිල දී ගන්නා ලද හෝ දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම;

(එ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන සියලු ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ඒ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන්ගෙන්, පුද්ගල මණ්ඩලවලින් හෝ බහු පාර්ශ්වීය නියෝජ්‍යායතනවලින් මුදල් හෝ අන්‍යාකාරයකින් වූ සංවර්ධන සහාය භාරගැනීම සහ ඒවා මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අදාළ කර ගැනීම:

එසේ වුව ද, මේ ඡේදය යටතේ ලැබෙන සියලු විදේශ සහාය සම්බන්ධයෙන්, ඕඅයිටී විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ඔ) ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පර්යේෂණ සහ ප්‍රකාශන සිදු කිරීම;

(ඕ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම සහ පවත්වාගෙන යාම; සහ

(ක) සාමාන්‍යයෙන්, ඕඅයිටී හි අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් ක්‍රියා හෝ දේ සිදු කිරීම.

(2) ඕඅයිටී විසින්, යම් නීතියක නිශ්චිතව සඳහන්ව ඇති ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

## XXIII වන පරිච්ඡේදය

### ඕඅයිටී පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

ඕඅයිටී හි කළමනාකරණ මණ්ඩලය සංස්ථාපනය කිරීම

**102.** (1) ඕඅයිටී හි කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මේ පනතේ "ඕඅයිටී මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ඕඅයිටී මණ්ඩලය විසින්, ඕඅයිටී හි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, මේ පනත මගින් ඕඅයිටී වෙත පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ඕඅයිටී මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) ඕඅයිටී මණ්ඩලයේ සභාපතිවරයා සහ ඕඅයිටී හි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු, 114 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා;

(ආ) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු; සහ

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇති ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මේ පනතේ "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර වෙළෙඳ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද සහිත වෙනත් තැනැත්තන් පස්දෙනෙකු.

ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්

**103.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු බවට පත්වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඇ) වෙනත් යම් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් හෝ එවැන්නකු බවට පත්වුවහොත්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරන ලදුව නිදහස් නොකරන ලද වස්තු භංගත්වයට පත්වූවකු හෝ බුන්වත්වූවකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(උ) ඕඅයිටී විසින් හෝ එය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඌ) ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අගතිදායක ලෙස බලපෑමට ඉඩ ඇති යම් ඍජු හෝ වක්‍ර මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්,

ඒ තැනැත්තා ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුසු විය යුතු ය.

ඕඅයිටී මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**104.** ඕඅයිටී මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔහුගේ පත් වීමේ දිනයේ සිට අවුරුදු හතරක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන්

ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අනන්‍යාකරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**105.** (1) ඕඅයිටී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, ඒ සඳහා වූ හේතු දක්වා යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරන ලද පත් කළ සාමාජිකයකු ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට හෝ ඕඅයිටී හි වෙනත් යම් තත්ත්වයක සේවය කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

(3) මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් යම් පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 102 වන සහ 103 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අනන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(4) ඕඅයිටී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට අසනීපයක් හෝ වෙනත් යම් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන්, තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 102 වන සහ 103 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා නොමැති කාලසීමාව තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) ඕඅයිටී මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, සිය නොපැමිණීම පිළිබඳ ව සභාපතිවරයා වෙත කල්තියා දැනුම් දීමකින් තොරව ඕඅයිටී මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට

සහභාගී වීමට අපොහොසත් වන අවස්ථාවක දී, ඒ සාමාජිකයා ඒ තෙවැනි රැස්වීම් දිනයේ සිට සිය ධුරය අතහැර ගියා සේ සලකනු ලැබිය යුතු අතර, එවිට, ජනාධිපතිවරයා විසින් 102 වන සහ 103 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයන්ගේ මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතා

**106.** (1) ජනාධිපතිවරයා විසින්, යම් තැනැත්තකු ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙරාතුව, ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කෙරෙහි අගතිදායක ලෙස බලපෑමට ඉඩ ඇති මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට හෝ ඔහුගේ පවුලේ කවර හෝ සාමාජිකයකුට ඕඅයිටී හි කටයුතු සම්බන්ධයෙන් නොමැති බවට ප්‍රකාශ කරන ලෙසට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු අතර, එසේ හෙළිදරව් කරන ලද කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සෑහීමට පත්විය යුතු ය.

(2) ඕඅයිටී මණ්ඩලයේ කිසිදු සාමාජිකයකු, ඕඅයිටී ට පත් කරන ලද දිනයේ සිට (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ඒ යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් අත්කර ගෙන නොමැති බවට ද ජනාධිපතිවරයා විසින් කලින් කලට සෑහීමට පත් විය යුතු ය.

(3) ඕඅයිටී විසින් සිදු කරන ලද හෝ සිදු කිරීමට යෝජිත යම් කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ ව්‍යාපාරයක් හෝ වෙනත් යම් කාරණයක් කෙරෙහි ඍජු හෝ වක්‍ර සම්බන්ධතාවක් ඇති ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු විසින් ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව වහාම ඕඅයිටී මණ්ඩලය වෙත සහ ජනාධිපතිවරයා වෙත හෙළිදරව් කළ යුතු අතර, එවැනි සෑම හෙළිදරව් කිරීමක් ම, ඕඅයිටී මණ්ඩලයේ කාර්ය සටහන්වල වාර්තාගත කරනු ලැබිය යුතු ය. ඉන්පසුව, ජනාධිපතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන තෙක් ඒ සාමාජිකයා ඕඅයිටී සම්බන්ධයෙන් වූ කවර හෝ කාරණයකට සහභාගී නොවිය යුතු ය.

(4) ඕඅයිටී මණ්ඩලය විසින් එක් එක් කාරණය මත පදනම්ව, සම්බන්ධතා ගැටුම් පිළිබඳ ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

සේවා නියුක්තිය පිළිබඳ සීමා කිරීම

**107.** ඕඅයිටී මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු -

(අ) ස්වකීය ධුර කාලය ඇතුළත, යම් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ස්වකීය ධුර කාලය අවසාන වූ දිනයේ සිට, හෝ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මත ඔහු ස්වකීය ධුරය හිස් කරන දිනයේ සිට අවුරුදු තුනක කාලසීමාවක් ඉක්ම යන තෙක්, ජාත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ යම් පෞද්ගලික ආයතනයක,

පාරිශ්‍රමිකයක් සහිත හෝ පාරිශ්‍රමිකයක් රහිත ජාත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ වෙනත් යම් ධුරයක් හෝ සේවානියුක්තියක් භාරගැනීම හෝ දැරීම නොකළ යුතු ය.

ගණපූරණය සහ ඕඅයිටී මණ්ඩලයේ රැස්වීම්

**108.** (1) මේ පනත මගින් ඕඅයිටී මණ්ඩලය වෙත පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා යටත් පිරිසෙයින් සෑම මසකම එක් වරක්වත් හෝ අවශ්‍ය වන පරිදි හෝ ඕඅයිටී මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(2) ඕඅයිටී මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) ඕඅයිටී මණ්ඩලයේ රැස්වීමක්-

(අ) රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින, ගණපූරණය සංස්ථාපනය කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) රැස්වීමට සහභාගී වන සහ ගණපූරණය සංස්ථාපනය කරන සියලු සාමාජිකයන්හට, රැස්වීම පවත්වනු ලබන කාලසීමාව තුළ රැස්වීමට සහභාගී වන එක් එක් සාමාජිකයා සමගාමීව දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන ක්‍රම මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) ඕඅයිටී මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වන සියලු ප්‍රශ්න, ඒ රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන බහුතර සාමාජිකයන්ගේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු ඕඅයිටී මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. ඕඅයිටී මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාපත් කරගනු ලබන යම් සාමාජිකයකු ඕඅයිටී මණ්ඩලයේ ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, ඕඅයිටී මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය ඕඅයිටී මණ්ඩලය විසින් නියාමනය කරනු ලැබිය හැකි ය.

**109.** ඕඅයිටී මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම නොතකා කටයුතු කරනු ලැබිය හැකි අතර, ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත් වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය; නැතහොත් බලරහිත බවට සලකනු නොලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් ඕඅයිටී මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු බලරහිත නොවන බවට සලකනු ලැබිය යුතු බව

**110.** ජනාධිපතිවරයා විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත වූ පාරිශ්‍රමික ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

ඕඅයිටී මණ්ඩලය විසින් විශේෂඥයන්ට රැස්වීම්වලට ආරාධනා කළ හැකි බව

**111.** (1) ඕඅයිටී හි කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා, ඕඅයිටී මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන කවර හෝ අවස්ථාවක දී, ඕඅයිටී මණ්ඩලයේ යම් රැස්වීමක දී කටයුතු කරනු ලබන යම් විෂයය කාරණයක් පිළිබඳ ප්‍රවීණතාවක් ඇති විශේෂඥයන්ගේ අදහස් ලබාගැනීමේ කාර්යය සඳහා, ඒ විෂයය කාරණය සම්බන්ධයෙන් ප්‍රවීණතාවක් ඇති විශේෂඥයන්ට ඕඅයිටී මණ්ඩලයේ ඒ රැස්වීම සඳහා ආරාධනා කරනු ලැබිය හැකි යː

එසේ වුව ද, ඒ විශේෂඥයන්ගේ අදහස් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය ඕඅයිටී මණ්ඩලය සතු විය යුතු ය.

(2) විශේෂඥයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් නොතිබිය යුතු ය.

(3) විශේෂඥයන්ට ඕඅයිටී මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් ඕඅයිටී මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ගෞරව දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(4) ඕඅයිටී මණ්ඩලය විසින් ආරාධනා කරනු ලබන සෑම විශේෂඥයකු විසින් ම, ඕඅයිටී මණ්ඩලය විසින් කාර්ය නියුක්ත කරවීමට පෙරාතුව, 124 වන වගන්තිය මගින් නියම කර ඇති ප්‍රකාශයක් කරනු ලැබිය යුතු අතර, ඕඅයිටී මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබන සියලු කාරණාවල සහ ඕඅයිටී සමඟ කාර්ය නියුක්ත වීම ප්‍රකාරව ඒ විශේෂඥයා විසින් අත්කර ගනු ලබන වෙනත් යම් තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු ය. ඒ සෑම විශේෂඥයකු විසින් ම, 106 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි, ඕඅයිටී හි කටයුතු සම්බන්ධයෙන් ඔහුට මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් නොමැති බවට ප්‍රකාශයක් ද කරනු ලැබිය යුතු ය.

ඕඅයිටී හි මුද්‍රාව

**112.** (1) ඕඅයිටී හි මුද්‍රාව ඕඅයිටී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) ඕඅයිටී හි මුද්‍රාව-

(අ) ඕඅයිටී මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) ඕඅයිටී මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තබනු ලැබිය යුතු ය.

(3) ඕඅයිටී හි මුද්‍රාව, ඕඅයිටී මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු සභාපතිවරයා සහ ඕඅයිටී මණ්ඩලයේ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතබනු ලැබිය යුතු යː

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට ඕඅයිටී හි මුද්‍රාව තබන විට සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක දී, සභාපතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් ලිඛිතව බලය දෙන ලද ඕඅයිටී මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීම සඳහා නිසි බලය තිබිය යුතු ය.

(4) ඕඅයිටී හි මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් ඕඅයිටී මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

ඕඅයිටී මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

113. (1) ඕඅයිටී මණ්ඩලය විසින්, තත්කාර්යය සඳහා මේ කොටස යටතේ සාදනු ලබන රීති මගින්, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍යවලින් කිසිවක්, අධ්‍යක්ෂවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක නිලධරයකු විය යුතු ඕඅයිටී හි යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබ ඇති නිලධරයකු විසින්, ඕඅයිටී මණ්ඩලය විසින් දෙනු ලැබිය හැකි යම් විධානයකට යටත්ව ඒ බලතලය, කාර්යය හෝ කර්තව්‍යය, ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

## XXIV වන පරිච්ඡේදය

### ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා

ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා

114. (1) ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව, ජාත්‍යන්තර වෙළෙඳ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද සහිත තැනැත්තකු-

(අ) ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසගැනීම් සඳහා ප්‍රධාන සාකච්ඡාකරු විය යුතු; සහ

(ආ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පවත්-වාගෙන යාමේ කාර්යය සඳහා විය යුතු,

ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) ලෝක වෙළෙඳ සංවිධානය (WTO), වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), යම් රටක් හෝ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කාරණා සහ ගිවිසගැනීම් පිළිබඳව වූ රටවල් කණ්ඩායම්, පොදු රාජ්‍ය මණ්ඩලය සහ වෙනත් ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසගැනීම් සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ කාරණා සහ ගිවිසගැනීම් සම්බන්ධීකරණය කිරීම, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා-

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමට ස්ථිරව ම නොහැකි තත්ත්වයට පත්වන්නේ නම්;

(ආ) ඕඅයිටී මණ්ඩලයේ අදහස අනුව, වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ හෝ ඕඅයිටී හි යහපතට අගතිගාමී වන යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) ඕඅයිටී මණ්ඩලය විසින් දෙන ලද යම් විධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇත්නම්,

ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔහුගේ පත් වීමේ දිනයේ සිට අවුරුදු හතරක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(6) මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාගේ ධුරය හිස්වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන තැනැත්තාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(7) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට අසනීපයක් හෝ වෙනත් යම් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන්, තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, (1) වන

උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒ සාමාජිකයා නොමැති කාලසීමාව තුළ දී ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා වශයෙන් තාවකාලිකව කටයුතු කිරීම සඳහා ඕඅයිටී මණ්ඩලයේ සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) ජනාධිපතිවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත වූ පාරිශ්‍රමිකයක් ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය.

සේවා නියුක්තිය පිළිබඳ සීමා කිරීම

**115.** ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා -

(අ) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා වශයෙන් වූ ස්වකීය ධුර කාලය ඇතුළත යම් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ස්වකීය ධුර කාලය අවසාන වූ දිනයේ සිට හෝ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මත ඔහු ස්වකීය ධුරය හිස් කරන දිනයේ සිට අවුරුදු තුනක කාලසීමාවක් ඉක්ම යන තෙක්, ජාත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ යම් පෞද්ගලික ආයතනයක,

පාරිශ්‍රමිකයක් සහිත හෝ පාරිශ්‍රමිකයක් රහිත වෙනත් යම් ධුරයක් හෝ සේවානියුක්තියක් භාරගැනීම හෝ දැරීම නොකළ යුතු ය.

ඕඅයිටී මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා වෙත පැවරීම

**116.** (1) ඕඅයිටී මණ්ඩලය විසින්, එහි යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඕඅයිටී මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඕඅයිටී මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ඕඅයිටී මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක දී, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය අවලංගු කරනු ලැබිය හැකි ය.

## XXV වන පරිච්ඡේදය

### ඕඅයිටී හි අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෙසු කාර්ය මණ්ඩලය

**117.** (1) අමාත්‍යවරයා විසින්, ඕඅයිටී මණ්ඩලය විමසා පත් කරනු ලබන (මේ පනතේ "ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඕඅයිටී හි අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු ය.

ඕඅයිටී හි අධ්‍යක්ෂ ජනරාල්වරයා

(2) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තාගේ සුදුසුකම් හා පළපුරුද්ද සහ ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවානියුක්තියේ නියම හා කොන්දේසි, නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ඕඅයිටී මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව, ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව ඕඅයිටී හි කටයුතු පරිපාලනය භාරව සිටිය යුතු ය;

(ආ) ඕඅයිටී මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිව යුතු ය;

(ඇ) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයාට මේ කොටස යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී සහාය විය යුතු ය; සහ

(ඈ) ඕඅයිටී මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ඉටු කළ යුතු ය.

(4) ඕඅයිටී මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීමට සහ කථා කිරීමට ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම තිබිය යුතු නමුදු, ඒ රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(5) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඕඅයිටී මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, එසේ කිරීම අවශ්‍ය යයි ඔහු සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී, මේ කොටස මගින් ඔහු වෙත පවරන ලද, පනවන ලද හෝ භාර කරන ලද යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඕඅයිටී හි යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවානියුක්තයා විසින් ඒ බලතලය, කාර්යය හෝ කර්තව්‍යය ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

(6) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සම්බන්ධයෙන් ඕඅයිටී මණ්ඩලයට වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(7) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා-

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමට ස්ථිරව ම නොහැකි තත්ත්වයට පත් වන්නේ නම්;

(ආ) ඕඅයිටී මණ්ඩලයේ මතය අනුව, වංචනික හෝ නීතිවිරෝධී ස්වභාවයේ හෝ ඕඅයිටී හි යහපතට අගතිගාමී වන යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) ඕඅයිටී මණ්ඩලය විසින් දෙන ලද යම් විධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇත්නම්,

අමාත්‍යවරයා විසින්, ඕඅයිටී මණ්ඩලය විමසා සහ (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කරනු ලැබීමට පෙරාතුව, ඔහුව ධුරයෙන් ඉවත් නොකළ යුත්තේ මන්ද යන්නට නිදහසට කරුණු දක්වන ලෙසට ලිඛිත දැන්වීමක් ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඔහුට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබ ඇති යම් චෝදනා සම්බන්ධයෙන් කරුණු කියා පෑමට ඔහුට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

(9) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය දරනු ලබන තැනැත්තා මියයාම, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් විය යුතු ය.

(10) ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් සිදු කරනු ලබන තෙක්, අමාත්‍යවරයා විසින්, ඕඅයිටී මණ්ඩලය විමසා, ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා ඕඅයිටී මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය

(11) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

ඕඅයිටී හි කාර්ය මණ්ඩලය

**118.** (1) ඕඅයිටී විසින්, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සංඛ්‍යාවක් ඕඅයිටී හි කාර්ය මණ්ඩලය ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) ඕඅයිටී මණ්ඩලය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඕඅයිටී වෙත පත් කරන ලද නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සම්බන්ධයෙන්-

(අ) ඒ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවානියුක්තියේ නියම හා කොන්දේසි තීරණය කිරීම;

(ආ) ආණ්ඩුවේ අදාළ මාර්ගෝපදේශවලට අනුකූලව සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ තීරණය කිරීම; සහ

(ඇ) ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) ඕඅයිටී මණ්ඩලය විසින්, (2) වන උපවගන්තියේ සඳහන් සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ දරන ලද යම් පෙර තනතුරකින් ඉවත් කරන ලද යම් තැනැත්තකු, ඕඅයිටී විසින්, ඕඅයිටී හි නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

ඕඅයිටී හි කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**119.** (1) ඕඅයිටී හි ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, ඕඅයිටී විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා ඕඅයිටී හි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඕඅයිටී හි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඕඅයිටී හි කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු, ඕඅයිටී විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඕඅයිටී හි සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සිදු කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## XXVI වන පරිච්ඡේදය

## මුදල්

**120.** (1) ඕඅයිටී හට ඊට ම අයත් අරමුදලක් තිබිය යුතු ය. ඕඅයිටී හි අරමුදල

(2) ඕඅයිටී හි අරමුදලට, ඕඅයිටී හි භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරදෙනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී ඕඅයිටී විසින් දරනු ලබන යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ ඕඅයිටී හි අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**121.** (1) ඕඅයිටී හි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ඕඅයිටී හි මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම

(2) ඕඅයිටී විසින්, එහි ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු මුදල් ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ඕඅයිටී හි ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## XXVII වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

කමිටු හෝ මූලමණ්ඩල පිහිටුවීම

**122.** (1) ඕඅයිටී මණ්ඩලය විසින්, මේ පනත යටතේ ඕඅයිටී මණ්ඩලය වෙත පැවරී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා ඊට සහාය වීම පිණිස කමිටු හෝ මූලමණ්ඩල පිහිටුවනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම කමිටුවක් ම හෝ මූලමණ්ඩලයක් ම, අදාළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ නිලයට පහළ නොවන නිලයක නිලධරයන් සහ ඒ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් හෝ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ඒ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් බලය පවරනු ලැබිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධරයන් විය යුතු, ඕඅයිටී මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද කමිටුවල හෝ මූලමණ්ඩලවල සාමාජිකයන්ගේ පත් කිරීම සඳහා වූ නුසුදුසුකම් සහ මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතා සම්බන්ධයෙන්, 103 වන සහ 106 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත වූ ගෞරව දීමනා, කමිටුවල හෝ මූලමණ්ඩලවල සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

වාර්ෂික වාර්තාව

**123.** (1) ඕඅයිටී විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් මාස හයක් ඇතුළත, ඒ මුදල් වර්ෂය තුළ ඕඅයිටී විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් සහ ද්වි පාර්ශ්වික වෙළෙඳ කටයුතු සිදු කරන ලද එක් එක් රට ඇතුළුව, ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ප්‍රගතිය සම්බන්ධයෙන් වූ වාර්ෂික වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාවට පහත සඳහන් ලේඛන අමුණනු ලැබිය යුතු යඃ-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟ අදාළ වර්ෂය සඳහා ඕඅයිටී හි විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) ඒ වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම වූ වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක්.

(2) ජනාධිපතිවරයා විසින්, ඒ වාර්ෂික වාර්තාව ලැබුණු දිනයේ සිට මාස තුනක් ඇතුළත, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමඟ ඒ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

**124.** ඕඅයිටී මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ඕඅයිටී හි සියලු ම නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් විසින්, ස්වකීය කාර්ය භාරගැනීමට පෙරාතුව, මේ පනත යටතේ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී ඔවුන්ට දැනගැනීමට ලැබෙන, ඕඅයිටී හි කටයුතු පිළිබඳ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය මගින් ඒ යම් කාරණයක්- රහස්‍යතා ප්‍රකාශය

(අ) අධිකරණයක් විසින් එසේ කිරීමට නියම කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ යම් විධිවිධාන සමඟ අනුකූලවීම පිණිස,

හැර, හෙළිදරව් නොකිරීමට ඔවුන් විසින් පොරොන්දු විය යුතු ය.

**125.** (1) අමාත්‍යවරයා විසින්, කලින් කල, ඕඅයිටී හි අරමුණුවලට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිසි ලෙස බලාත්මක කිරීම සහතික කිරීම සඳහා ඕඅයිටී හි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සම්බන්ධයෙන් වන සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව ඕඅයිටී වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ විධානවලට අනුකූලව කටයුතු කිරීම ඕඅයිටී හි කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ හැකි බව

(2) අමාත්‍යවරයා විසින්, කලින් කල, ඕඅයිටී හි දේපළ සහ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වාරවාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස ඕඅයිටී වෙත ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, ඒ විධානවලට අනුකූලව කටයුතු කිරීම ඕඅයිටී හි කාර්යය විය යුතු ය.

ඕඅයිටී හි සාමාජිකයන්, නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**126.** ඕඅයිටී මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ඕඅයිටී හි සියලුම නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඕඅයිටී, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**127.** ඕඅයිටී, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩුවක වියදම් ඕඅයිටී හි අරමුදලින් ගෙවිය යුතු බව

**128.** (1) ඕඅයිටී විසින් හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඕඅයිටී විසින් දරන ලද යම් වියදමක් ඕඅයිටී හි අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඕඅයිටී වෙත ගෙවන ලද හෝ ඕඅයිටී විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු ඕඅයිටී හි අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටසේ විධිවිධාන යටතේ හෝ ඕඅයිටී හි විධානය මත ඕඅයිටී මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඕඅයිටී අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් සිදු කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ වියදම ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ

අපරාධ නඩුවේ දී අය කරගෙන ඇත්නම් මිස, ඒ වියදම ඕඅයිටී හි අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**129.** (1) අමාත්‍යවරයා විසින්, ඕඅයිටී විමසා, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ කලින් නිසි පරිදි සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙසට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**130.** (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, ඕඅයිටී මණ්ඩලය විසින්, මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දී ඇති යම් කාරණයක් හෝ පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ- රීති

(අ) ඕඅයිටී මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නියාමනය කිරීම සම්බන්ධයෙන්; සහ

(ආ) ඕඅයිටී හි කටයුතු කළමනාකරණය පිළිබඳ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන්.

(2) ඕඅයිටී මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමෙන් පසුව ක්‍රියාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය

**131.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ-

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය විෂයය සහ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලයට අදාළ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

## V වන කොටස

## XXVIII වන පරිච්ඡේදය

### ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිහිටුවීම

ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිහිටුවීම

**132.** (1) (මෙහි මින්මතු "ඵලදායිතා කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ඵලදායිතා කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඵලදායිතා කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් ඊට ලබා දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද ඊට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) ඵලදායිතා කොමිෂන් සභාව ස්වාධීන මණ්ඩලයක් විය යුතු අතර, පාර්ලිමේන්තුවට වගවිය යුතු ය.

(4) සෑම විටකදී ම එලදායිතා කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට ගරු කළ යුතු ය.

(5) කිසිම තැනැත්තකු විසින්, මේ කොටස යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එලදායිතා කොමිෂන් සභාවට අයුතු බලපෑමක් සිදු කිරීම හෝ ඊට මැදිහත්වීම කරනු නොලැබිය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාවේ අරමුණ

**133.** තිරසර ආකාරයකින් ජනතාවගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා, වැඩිකරන ලද එලදායිතාව මාර්ගයෙන් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම කොමිෂන් සභාවේ අරමුණ විය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාවේ බලතල

**134.** එලදායිතා කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පරිදි වූ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) 154 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් රාජ්‍ය ආයතනයකින් හෝ තැනැත්තකුගෙන් තොරතුරු, දත්ත, සංඛ්‍යාලේඛන හෝ ලේඛන ඉල්ලීම;

(ආ) එලදායිතා කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයකින් හෝ පර්යේෂණයකින් සොයා දැනගත් කරුණු සහ එලදායිතා කොමිෂන් සභාව විසින් අදාළ බලධරයන් වෙත කරන ලද නිර්දේශ, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් අවසර ලබා දී ඇති තාක් දුරට පළ කිරීම සහ ප්‍රචාරණය කිරීම;

(ඇ) යම් බැංකුවක ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් තැන්පතු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය නම් ඒ ගිණුම් වසා දැමීම;

(ඈ) එලදායිතා කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කොමිෂන් සභාවේ අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් හෝ එකඟතාවලට එළඹීම සහ ඒවා ඉටුකිරීම;

(ඉ) ඵලදායිතා කොමිෂන් සභාවේ යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම; සහ

(ඊ) සාමාන්‍යයෙන් ඵලදායිතා කොමිෂන් සභාවේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා මේ කොටස හෝ ඒ යටතේ සාදනු ලබන රීති මගින් බලය ලබා දී ඇති සියලු ක්‍රියා සහ දේ කිරීම.

ඵලදායිතා කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය

**135.** (1) ඵලදායිතා කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) පහත දැක්වෙන කරුණු ඇතුළුව එහෙත් ඊට සීමා නොවී, ඵලදායිතාව සහ ආර්ථික කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා සාක්ෂි සහ පුළුල් විශ්ලේෂණ මත පදනම්ව අදාළ බලධරයන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම:-

(i) ඵලදායිතාවය නියාමනය කිරීම සුසංවිහිත කිරීම;

(ii) යහපත් තරඟකාරීත්වය සහ තරඟ කළ හැකි වෙළෙඳපොළවල් ප්‍රවර්ධනය කිරීම;

(iii) ව්‍යුහාත්මක පරිවර්තනය උත්ප්‍රේරණය කිරීම; සහ

(iv) ජාත්‍යන්තර තරඟකාරීත්වය දිරිගැන්වීම;

(ආ) ජාතික තරඟකාරීත්වය පිළිබඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සම්බන්ධයෙන් ආණ්ඩුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සහ කලින් කල අවශ්‍ය වන පරිදි වූ පසු ප්‍රතිශෝධන සම්බන්ධයෙන් උපදෙස් දීම;

(ඇ) ඵලදායිතාවයට අදාළ ගැටලු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තුළ හෝ ගිවිසුමක් මත පිටතට ලබා දීමෙන් මහජන විමර්ශන සහ සාක්ෂි මත පදනම් වූ පර්යේෂණ පැවැත්වීම සහ එකී විමර්ශනය හෝ පර්යේෂණය සඳහා භාවිත කළ ක්‍රමවේද හෙළිදරව් කිරීම;

(ඇ) එලදායිතාව සම්බන්ධයෙන් කාර්යසාධනය අධීක්ෂණය කිරීම, තක්සේරු කිරීම සහ මිනුම් ප්‍රමිතිකරණය ක්‍රියාවේ යෙදවීම;

(ඉ) එළඹෙන වර්ෂයේ පළමු මාස හතර ඇතුළත, එලදායිතා ප්‍රවණතා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව වාර්තා කිරීම; සහ

(ඊ) එලදායිතාවය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් අධිවාචනය කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින්-

(අ) අමාත්‍ය මණ්ඩලය හෝ පාර්ලිමේන්තුව විසින් යොමු කරනු ලැබූ පරිදි හෝ ස්වකීය මෙහෙයවීම මත හෝ කටයුතු කිරීම;

(ආ) වෙළෙඳාම් කළ හැකි භාණ්ඩ හා සේවා සහ වෙළෙඳාම් කළ නොහැකි භාණ්ඩ හා සේවා යන දෙවර්ගය ම ඇතුළුව පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය යන අංශ දෙක ම සලකා බැලීම;

(ඇ) ජනතාවගේ හිමිකම් සහ එලදායිතා කොමිෂන් සභාවේ නිර්දේශ මගින් බලපෑමට ලක් වන තැනැත්තන්ගේ හිමිකම් හඳුනා ගැනීම; සහ

(ඈ) තිරසර ආර්ථික සංවර්ධනය සහතික කිරීම.

නිර්දේශ ලබා දීම සඳහා වන කාර්යපටිපාටි

**136.** (1) එලදායිතා කොමිෂන් සභාව විසින්, එය වෙත යොමු කරන ලද සහ මේ කොටස යටතේ වූ අරමුණ යටතට වැටෙන යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ කාරණය ලැබුණු දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත ස්වකීය නිර්දේශ ලබා දෙනු ලැබිය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලය විසින් එලදායිතා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද කාරණයක් සම්බන්ධයෙන් වන විට, එලදායිතා කොමිෂන් සභාව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ස්වකීය නිර්දේශ යොමු කරනු ලැබිය යුතු ය.

(3) (අ) පාර්ලිමේන්තුව විසින් එලදායිතා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද හෝ එලදායිතා කොමිෂන් සභාව විසින් ස්වකීය මෙහෙයවීමෙන් අවධානය යොමු කරන ලද කාරණයක් සම්බන්ධයෙන් වන විට, එලදායිතා කොමිෂන් සභාව විසින්, කථානායකවරයා වෙත ස්වකීය නිර්දේශ යොමු කරනු ලැබිය යුතු ය.

(ආ) කථානායකවරයා විසින්, මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් නිර්දේශ සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා හෝ එකී නිර්දේශවලට සංශෝධන සිදු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තු කාරක සභාවක් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(ඇ) පාර්ලිමේන්තු කාරක සභාව විසින්, එකී නිර්දේශ ලැබුණු දිනයේ සිට දින තිහක් ඇතුළත එකී අදහස් හෝ සංශෝධන කථානායකවරයා වෙත යවනු ලැබිය හැකි ය. කථානායකවරයා විසින්, එකී අදහස් හෝ සංශෝධන එලදායිතා කොමිෂන් සභාව වෙත යවනු ලැබිය යුතු ය.

(ඈ) පාර්ලිමේන්තු කාරක සභාවේ අදහස් සහ සංශෝධන සැලකිල්ලට ගැනීමෙන් පසු, එලදායිතා කොමිෂන් සභාව විසින්, කථානායකවරයා වෙත නිර්දේශ ලබා දෙනු ලැබිය යුතු ය.

(4) එලදායිතා කොමිෂන් සභාව විසින්, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් වන තීරණාත්මක කාරණා පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම සඳහා හෝ ඊට අදාළ යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය මෙහෙයවීමෙන් අවස්ථාවක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

## XXIX වන කොටස

### ඵලදායිතා කොමිෂන් සභාවේ සංයුතිය සහ ඵලදායිතා කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

ඵලදායිතා කොමිෂන් සභාවේ සංයුතිය

137. (1) ඵලදායිතා කොමිෂන් සභාව-

(අ) (මෙහි මින්මතු "නිල බලයෙන් පත්වන සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් (රාජ්‍ය මුදල්); සහ

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස් දෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් පත්කිරීම් සිදු කිරීමේ දී, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, ආයෝජනය, මුදල්, වෙළෙඳාම හෝ වාණිජ්‍යය, නීතිය, තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපාර හෝ ගිණුම්කරණය යන ක්ෂේත්‍රවල දැනුම, විශේෂඥතාව සහ පළපුරුද්ද සහ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීම එකී සාමාජිකයන් සතු වන බව සහතික වීම පිණිස සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

(3) යටත් පිරිසෙයින් ඵලදායිතා කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයින් දෙදෙනකුවත් එහි පූර්ණ කාලීන සාමාජිකයන් විය යුතු ය.

ඵලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු වීම සඳහා වන නුසුදුසුකම්

138. යම් තැනැත්තකු-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ආ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කරගනු ලැබුවහොත් හෝ පත් කරනු ලැබුවහොත්;

(ඇ) දේශපාලන පක්ෂයක සාමාජිකයකු වන්නේ නම්;

(ඈ) 142 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔහු විසින් ඵලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමට හෝ ඉටු කිරීමට අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ ඒ හා සමාන වෙනත් සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් ඔහුට ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් වූවකු ලෙස හෝ බුන්වත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත් වූවකු හෝ බුන්වත් භාවයට පත් වූවකු වන තැනැත්තකු වේ නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු වන්නේ නම්; හෝ

(ඌ) ඵලදායිතා කොමිෂන් සභාව විසින් හෝ ඵලදායිතා කොමිෂන් සභාව වෙනුවෙන් ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ සෘජුව හෝ වක්‍රව යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්,

ඒ තැනැත්තා ඵලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම හෝ තවදුරටත් කටයුතු කරගෙන යාම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා

**139.** (1) ජනාධිපතිවරයා විසින්, පත්කළ සාමාජිකයන් අතරින් පූර්ණ කාලීන සාමාජිකයකු නොවන එක් පත්කළ සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, හේතු දක්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු විසින් එලදායිතා කොමිෂන් සභාවේ ධුරය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවකට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මත තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, වෙනත් යම් පත්කළ සාමාජිකයකු ඒ සාමාජිකයාගේ සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත්කරනු ලැබිය හැකි ය.

පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**140.** එලදායිතා කොමිෂන් සභාවේ සෑම පත්කළ සාමාජිකයකු ම, මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් වන තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත්කිරීමට සුදුස්සකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**141.** (1) තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී එලදායිතා කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත්කළ සාමාජිකයකු ඵලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් ඵලදායිතා කොමිෂන් සභාවට සේවය කිරීම සඳහා හෝ නුසුදුස්සකු විය යුතු ය.

(3) යම් පත්කළ සාමාජිකයකු මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ස්වකීය ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක, 137 වන සහ 138 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින්, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය. තව ද, එකී තැනැත්තා අනුගාමී හෝ අන්‍යාකාරයකින් වන තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

(4) රෝගාතුර වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය සහ කර්තව්‍ය කිරීමට සහ ඉටු කිරීමට ඵලදායිතා කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකු අපොහොසත් වන අවස්ථාවක දී, 137 වන සහ 138 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින්, ඒ සාමාජිකයා නොමැති කාලසීමාව තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) ඵලදායිතා කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකු සභාපතිවරයාගේ පූර්ව අවසරය ලබා ගැනීමෙන් තොරව ඵලදායිතා කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන අවස්ථාවක දී, එකී සාමාජිකයා තුන්වන රැස්වීම අවසානයේ දී ස්වකීය ධුරය හිස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයා විසින්, (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

**142.** (1) ජනාධිපතිවරයා විසින්, යම් තැනැත්තකු එලදායිතා කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙරාතුව, එලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ස්වකීය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාවේ කටයුතු සඳහා අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍යමය හෝ වෙනත් ඒ හා සමාන සම්බන්ධතාවයක් ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ පවුලේ සාමාජිකයන්ට නොමැති බවට හෙළිදරව් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු අතර, එසේ හෙළිදරව් කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සෑහීමට පත්විය යුතු ය. සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතාවය

(2) එලදායිතා කොමිෂන් සභාවට පත්කළ දින සිට එලදායිතා කොමිෂන් සභාවේ කිසිදු පත්කළ සාමාජිකයකුට එවැනි යම් මූල්‍යමය හෝ ඒ හා සමාන වෙනත් සම්බන්ධතාවයක් නොමැති බවට ද ජනාධිපතිවරයා විසින් කලින් කල සෑහීමට පත්විය යුතු ය.

(3) (අ) එලදායිතා කොමිෂන් සභාව විසින් ඇතිකරගත් හෝ ඇතිකර ගැනීමට යෝජිත යම් ගිවිසුමක්, එකඟතාවයක්, ව්‍යාපාරයක් හෝ වෙනත් යම් දෙයක් සඳහා එලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඍජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් දක්වන අවස්ථාවක දී, එකී සාමාජිකයා විසින් වහාම ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය සහ ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි, එලදායිතා කොමිෂන් සභාව වෙත හෝ ජනාධිපතිවරයා වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(ආ) එවැනි සෑම හෙළිදරව් කිරීමක් ම එලදායිතා කොමිෂන් සභාවේ වාර්තාවල වාර්තා කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයා විසින්, ඉන් පසු ඒ ගිවිසුම, එකඟතාවය, ව්‍යාපාරය හෝ වෙනත් දෙය සම්බන්ධයෙන් වන එලදායිතා කොමිෂන් සභාවට අදාළ යම් කාරණාවක් සඳහා සහභාගී නොවිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, එක් එක් කාරණය මත පදනම් වූ සම්බන්ධතා ගැටුම් පිළිබඳ ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාවේ ගණපූරණය සහ රැස්වීම්

**143.** (1) කොමිෂන් සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින් සෑම මසකටම එක් වරක් හෝ මේ කොටස මගින් එලදායිතා කොමිෂන් සභාව වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි හෝ පැවැත්විය යුතු ය.

(2) එලදායිතා කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, ගණපූරණය, වැඩ බලන සභාපතිවරයා ද ඇතුළු ව සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(3) එලදායිතා කොමිෂන් සභාවේ රැස්වීමක්-

(අ) ගණපූරණයක් සංස්ථාපනය වන සාමාජිකයන් සංඛ්‍යාව රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්වීම මගින්; හෝ

(ආ) රැස්වීම පැවැත්වෙන කාලය තුළ දී, ඊට සහභාගී වී සිටින ගණපූරණයක් සංස්ථාපනය වන සියලු සාමාජිකයන්ට සහභාගී වී සිටින සෑම සාමාජිකයකු ම එකවර දැක ගැනීමට සහ සවන් දීමට හැකි පරිදි වූ ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන ක්‍රමයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) සභාපතිවරයා විසින් එලදායිතා කොමිෂන් සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා එලදායිතා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී, 141 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා පත්කරන ලද සාමාජිකයා ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(5) එලදායිතා කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු කාරණා එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(6) එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම නොතකා, එළදායිතා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබිය හැකි අතර, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් එළදායිතා කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය; නැතහොත් බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත් ව, එළදායිතා කොමිෂන් සභාව විසින්, එහි රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

එළදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**144.** එළදායිතා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි අතර, එකී පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

එළදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව

**145.** (1) එළදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව එළදායිතා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) එළදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව-

(අ) එළදායිතා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) එළදායිතා කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

(3) එළදායිතා කොමිෂන් සභාවේ අවසරය ඇතිව සහ එළදායිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර එළදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව,

යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර එසේ පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සභාපතිවරයා සහ ඒ සාමාජිකයා විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට එලදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව තබන අවස්ථාවේ දී, සභාපතිවරයාට පැමිණීමට නොහැකි වන අවස්ථාවක දී, තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද එලදායිතා කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු, මේ උපවගන්තියේ මීට ඉහත විධිවිධානවලට අනුව ඒ සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කිරීමට නිසි බලය තිබිය යුතු ය.

(4) එලදායිතා කොමිෂන් සභාව විසින්, එලදායිතා කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාව විසින් විශේෂඥයන්ට හෝ වෘත්තිකයන්ට රැස්වීම්වලට ආරාධනා කළ යුතු බව

**146.** (1) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන කුමන හෝ අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, සිය කාර්ය සහ කර්තව්‍ය එලදායී ලෙස කිරීම සහ ඉටු කිරීම සඳහා යම් රැස්වීමක දී සාකච්ඡා කරනු ලබන යම් විෂය කරුණක් සම්බන්ධයෙන් ස්වකීය අදහස් ලබාගැනීමේ කාර්යය සඳහා එකී විෂයය සම්බන්ධයෙන් විශේෂඥතාව ඇති විශේෂඥයන්ට හෝ වෘත්තිකයන්ට එලදායිතා කොමිෂන් සභාව විසින් එහි යම් රැස්වීමකට ආරාධනා කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, ඒ විශේෂඥයන්ගේ හෝ වෘත්තිකයන්ගේ අදහස් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය කොමිෂන් සභාව සතු විය යුතු ය.

(2) විශේෂඥයාට හෝ වෘත්තිකයාට එලදායිතා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට යම් පාරිශ්‍රමික ගෙවිය යුතු අතර ඔහුට ඡන්දය ප්‍රකාශය කිරීමේ අයිතියක් නොමැති විය යුතු ය.

(3) එලදායිතා කොමිෂන් සභාව විසින් ආරාධනා කරන ලද සෑම විශේෂඥයකු ම හෝ වෘත්තිකයකු ම, එලදායිතා කොමිෂන් සභාව විසින් ඒ කාර්යයෙහි නියුක්ත කරවීමට පෙර, 154 වන වගන්තිය මගින් නියම කරනු ලැබ ඇති ප්‍රකාශයක් සිදුකරනු ලැබිය

යුතු අතර එලදායිතා කොමිෂන් සභාව විසින් සාකච්ඡා කරන ලද සියලු කාරණා සහ එලදායිතා කොමිෂන් සභා සමග කාර්යයෙහි නියුක්ත වීම ප්‍රකාර ඒ විශේෂඥයා හෝ වෘත්තිකයා විසින් අත්කර ගත් වෙනත් යම් තොරතුරු රහසිගතව තබාගනු ලැබිය යුතු ය. එකී සෑම විශේෂඥයකු හෝ වෘත්තියකු විසින් ම, ඔහුට එලදායිතා කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් මූල්‍ය හෝ වෙනත් ඒ හා සමාන සම්බන්ධතා නොමැති බවට ප්‍රකාශයක් ද කරනු ලැබිය යුතු ය.

## XXX වන පරිච්ඡේදය

### කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය

එලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා

**147.** (1) (මෙහි මින්මතු "විධායක අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයකු එලදායිතා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු අතර ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) විධායක අධ්‍යක්ෂවරයා, එලදායිතා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) එලදායිතා කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයන්ට සහ අධීක්ෂණයට යටත්ව, විධායක අධ්‍යක්ෂවරයා විසින්-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළු එලදායිතා කොමිෂන් සභාවේ කටයුතු පාරිපාලනය භාරව කටයුතු කළ යුතු ය;

(ආ) එලදායිතා කොමිෂන් සභාවේ ගිණුම් නිලධරයා වශයෙන් කටයුතු කළ යුතු ය;

(ඇ) එලදායිතා කොමිෂන් සභාවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඈ) එලදායිතා කොමිෂන් සභාව විසින්, ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ක්‍රියාවට නැංවිය යුතු ය.

(4) විධායක අධ්‍යක්ෂවරයා, කොමිෂන් සභාවේ යම් රැස්වීම්වලට සහභාගී වීම සඳහා සහ එහිදී කතාකිරීම සඳහා හිමිකම් ලැබිය යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) විධායක අධ්‍යක්ෂවරයා විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක දී, ඔහු විසින්, එලදායිතා කොමිෂන් සභාවේ ලිඛිත අනුමතය ඇති ව, ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍යවලින් යමක්, එලදායිතා කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ බලතලය, කාර්යය හෝ කර්තව්‍යය පවරනු ලබන්නේ යම් නිලධරයකුට හෝ යම් සේවා නියුක්තයකුට ද, ඔහු විසින් ඒ බලතලය, කාර්යය හෝ කර්තව්‍යය, එලදායිතා කොමිෂන් සභාවේ විධානයන්ට යටත් ව, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(6) විධායක අධ්‍යක්ෂවරයා-

(අ) ඔහුගේ බලතල, කාර්ය සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීම ස්ථිරව ම අපොහොසත් තත්ත්වයට පත් වේ නම්;

(ආ) එලදායිතා කොමිෂන් සභාවේ මතය අනුව, වංචනික හෝ නීතිවිරෝධී ස්වභාවයෙන් යුතු ක්‍රියාවක් හෝ එලදායිතා කොමිෂන් සභාවේ සම්බන්ධතාවලට අගතියක් වන යම් ක්‍රියාවක් ඔහු විසින් සිදුකර ඇත්නම්; හෝ

(ඇ) එලදායිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලවීමට අපොහොසත් වී ඇත්නම්,

එලදායිතා කොමිෂන් සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) විධායක අධ්‍යක්ෂවරයාගේ ධුරය, මිය යාම, (6) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුරය දරන්නා විසින් සභාව වෙත තත්කාර්යය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම හේතුකොටගෙන හිස් විය යුතු ය.

(8) විධායක අධ්‍යක්ෂවරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් සිදු කරන තෙක් විධායක අධ්‍යක්ෂවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා එලදායිතා කොමිෂන් සභාව විසින්, එලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයකු පත්කරනු ලැබිය හැකි ය.

(9) විධායක අධ්‍යක්ෂවරයාගේ පාරිශ්‍රමික, යම් ලිඛිත නීතියකට සහ ආණ්ඩුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයකට අනුව, එලදායිතා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

**148.** (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, එලදායිතා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවානියුක්තයන් ප්‍රමාණයක් එලදායිතා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය හැකි ය.

(2) යම් ලිඛිත නීතියකට සහ ආණ්ඩුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයකට යටත්ව, එලදායිතා කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිශ්චය කරනු ලැබිය යුතු ය:-

(අ) ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් පිළිබඳ විනය පාලනය හෝ ඔවුන් ඉවත් කිරීම;

(ආ) බඳවා ගැනීමේ පටිපාටිය ඇතුළු ඒ නිලධරයන් සහ සේවානියුක්තියේ සේවා නියම සහ කොන්දේසි; සහ

(ඇ) ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණයන්.

(3) එසේ වුව ද, එලදායිතා කොමිෂන් සභාව විසින්, රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ කලින් දරන ලද යම් තනතුරකින් ඉවත් කරනු

ලැබ ඇති යම් තැනැත්තකු, එලදායිතා කොමිෂන් සභාවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

එලදායිතා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**149.** (1) එලදායිතා කොමිෂන් සභාවේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, එලදායිතා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා එලදායිතා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එලදායිතා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එලදායිතා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත්කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

## XXXI වන පරිච්ඡේදය

## මුදල්

එලදායිතා කොමිෂන් සභාවේ අරමුදල

**150.** (1) එලදායිතා කොමිෂන් සභාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට-

(අ) එලදායිතා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්;

(ආ) එලදායිතා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ

කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සහ එලදායිතා කොමිෂන් සභාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කුමන හෝ මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන ලෙස ඵලදායිතා කොමිෂන් සභාවට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටස යටතේ ඵලදායිතා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඵලදායිතා කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ඵලදායිතා කොමිෂන් සභාවේ ගිණුම් විගණනය

**151.** (1) ඵලදායිතා කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) ඵලදායිතා කොමිෂන් සභාව විසින්, ඵලදායිතා කොමිෂන් සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ඵලදායිතා කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## XXXII වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

කමිටු හෝ මූල මණ්ඩල පිහිටුවීම

**152.** (1) මේ කොටස යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී ඊට සහාය දැක්වීම සඳහා ඵලදායිතා කොමිෂන් සභාව විසින් කමිටු සහ මූල මණ්ඩල පිහිටුවනු ලැබිය හැකි අතර, ඵලදායිතා කොමිෂන් සභාව විසින් එවැනි කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයන් වීමට අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන, ආර්ථික විද්‍යාව, ආයෝජනය, මුදල්, වෙළෙඳාම හෝ වාණිජ්‍ය, නීතිය,

තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු ශිල්පය, ව්‍යාපාර හෝ ගිණුම්කරණය යන ක්ෂේත්‍රයන්හි දැනුම සහ විශේෂඥතාව ඇති තැනැත්තන් එලදායිතා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) කමිටුවක් හෝ මූල මණ්ඩලයක් විසින්, එලදායිතා කොමිෂන් සභාව විසින් ඒ කමිටුවට හෝ මූල මණ්ඩලයට දෙන ලද යොමු කිරීම් අනුදේශයන්හි දක්වා ඇති ස්වකීය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ස්වකීය වගකීම් සපුරාලීම කළ යුතු ය.

(3) එලදායිතා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට, අදාළ කේෂත්‍රයට අවශ්‍ය දැනුම සහ විශේෂඥතාව සතුවන යම් තැනැත්තකු, කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයකු ලෙස කොමිෂන් සභාව විසින් තෝරාගනු ලැබිය හැකි ය.

(4) ඒ කමිටුවල හෝ මූල මණ්ඩලවල සාමාජිකයන්ගේ ගෞරව දීමනාව, යම් ලිඛිත නීතියකට සහ ආණ්ඩුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයකට අනුව එලදායිතා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) ඒ කමිටුවේ හෝ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පැමිණීම අවශ්‍ය වන රැස්වීමකට ඔවුන් පැමිණ සිටිය යුතු අතර එහි දී ඔවුන්ගේ මත පළ කළ යුතු නමුත් ඔවුන්ට ඒ රැස්වීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියක් නොමැති විය යුතු ය.

වාර්ෂික වාර්තා

**153.** (1) එලදායිතා කොමිෂන් සභාව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයෙන් මාස හතරක කාලයක් ඇතුළත එලදායිතා කොමිෂන් සභාව විසින් කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පහත දැක්වෙන ලේඛන ඒ වාර්තාවට අමුණනු ලැබිය යුතු යː-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමග අදාළ වර්ෂය සඳහා එලදායිතා කොමිෂන් සභාවේ විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) ඒ වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම

එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම්වල වාර්තාවක්.

(2) කථානායකවරයා විසින්, වාර්ෂික වාර්තාව ලැබුණු දින සිට මාස තුනක කාලයක් ඇතුළත එය සලකා බැලීම සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන සමඟ ඒ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය

**154.** එලදායිතා කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, එලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා සහ සියලු නිලධරයන් සහ සේවානියුක්තයන් සහ 146 වන වගන්තිය යටතේ එලදායිතා කොමිෂන් සභාව විසින් උපදෙස් ගනු ලබන සියලු ම විශේෂඥයන් සහ වෘත්තිකයන් සහ 152 වන වගන්තිය යටතේ පත් කරනු ලබන කමිටුවල හෝ මූල මණ්ඩලවල සාමාජිකයන් විසින්, ස්වකීය කාර්ය භාරගැනීමට පෙර, මේ කොටස යටතේ තම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන කොමිෂන් සභාවේ කටයුතුවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර ඒ ප්‍රකාශය මගින්-

(අ) අධිකරණයක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට;

(ආ) මේ කොටස යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්ය සඳහා; හෝ

(ඇ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූල වීම සඳහා,

හැර එවැනි යම් කිසිදු කාරණයක් හෙළිදරව් නොකිරීමට ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

තොරතුරු ආදිය සැපයීමට අපොහොසත් වීම වරදක් විය යුතු බව

**155.** (1) මේ කොටස යටතේ එලදායිතා කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, එලදායිතා කොමිෂන් සභාව විසින් හෝ තත්කාර්යය සඳහා එලදායිතා කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන එලදායිතා කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින්, ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව ඇතුළත ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය යුතු තොරතුරු, දත්ත, සංඛ්‍යාලේඛන හෝ ලේඛන, එලදායිතා කොමිෂන් සභාව වෙත හෝ එලදායිතා කොමිෂන් සභාවේ නිලධරයා හෝ සේවානියුක්තයා වෙත ඉදිරිපත් කරන ලෙස යම් රාජ්‍ය ආයතනයකට හෝ යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අවසර දී ඇති තාක් දුරට, ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත යම් තොරතුරු, දත්ත, සංඛ්‍යාලේඛන හෝ ලේඛන ඉදිරිපත් කිරීම, (1) වන උපවගන්තිය යටතේ දැන්වීමෙන් නියම කරනු ලබන ඒ රාජ්‍ය ආයතනයේ ප්‍රධානයාගේ හෝ ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) (අ) මේ වගන්තිය යටතේ එසේ කිරීමට නියම කරනු ලැබ ඇති විට යම් තොරතුරු, දත්ත, සංඛ්‍යාලේඛන හෝ ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ආ) අසත්‍ය හෝ නොමග යවන සුලු බව දනිමින් ම යම් ප්‍රකාශයක් කරන හෝ තොරතුරු, දත්ත, සංඛ්‍යාලේඛන හෝ ලේඛන ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු මේ කොටස යටතේ වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි

**156.** මේ කොටස යටතේ යම් පුද්ගල මණ්ඩලයක් වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සංස්ථාවක් හෝ සංස්ථාවක් වේ නම් එහි සෑම

අධ්‍යක්ෂවරයකු ම හෝ නිලධරයකු ම හෝ අනුයෝජිතයකු ම; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එහි යම් නිලධරයකු හෝ සාමාජිකයකු ම,

අදාළ වරද සඳහා නිශ්චිතව දක්වනු ලබන දඬුවමකට යටත් විය යුතු ය:

එසේ වුව ද, ඒ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ අනුයෝජිතයකු හෝ ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු විසින් වරදක් සිදු කරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

**157.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ඵලදායිතා කොමිෂන් සභාවේ සියලු ම සාමාජිකයන්, ඵලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා, නිලධරයන් සහ සේවානියුක්තයන්, රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඵලදායිතා කොමිෂන් සභාවේ සාමාජිකයන්, ඵලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා, නිලධරයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**158.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ඵලදායිතා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

ඵලදායිතා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

යම් සිවිල් හෝ අපරාධ නඩුවක වියදම් අරමුදලින් ගෙවිය යුතු බව

**159.** (1) යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් ඉදිරියේ දී එලදායිතා කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එලදායිතා කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම්, එලදායිතා කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එලදායිතා කොමිෂන් සභාවට ගෙවන ලද හෝ එලදායිතා කොමිෂන් සභාව විසින් අයකර ගන්නා ලද ගාස්තු එලදායිතා කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටසේ විධිවිධාන යටතේ හෝ එලදායිතා කොමිෂන් සභාවේ විධානය මත, එලදායිතා කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, එලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා හෝ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරනු ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් ඉදිරිපිට දී ඒ තැනැත්තාට එරෙහිව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ ක්‍රියාව, ඒ තැනැත්තා විසින් ඒ ක්‍රියාව සිදු කරනු ලැබුවේ සද්භාවයෙන් බවට ඒ අධිකරණය හෝ විනිශ්චයාධිකාරය තීරණය කරන්නේ නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්, ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී අයකරගෙන ඇත්නම් මිස, එකී වියදම එලදායිතා කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

රීති

**160.** (1) එලදායිතා කොමිෂන් සභාව විසින්, මේ කොටසේ විධිවිධානවලට යටත්ව, මේ කොටස යටතේ රීති සෑදීම සඳහා බලය දෙන ලද යම් කාරණාවක් සම්බන්ධයෙන් සහ පහත දැක්වෙන සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) එලදායිතා කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම;

(ආ) ඵලදායිතා කොමිෂන් සභාව වෙත, 155 වන වගන්තිය යටතේ තොරතුරු සපයනු ලැබිය යුතු ආකෘතිය;

(ඇ) මහජන පරීක්ෂණ සහ ඵලදායිතාව පිළිබඳ සාක්ෂි මත පදනම් කොටගත් පර්යේෂණ පැවැත්වීමට යොදාගනු ලබන ක්‍රමවේදයන්; සහ

(ඈ) ඵලදායිතා කොමිෂන් සභාවේ කටයුතු කළමනාකරණය කිරීම හා සම්බන්ධ වෙනත් යම් කාරණා.

(2) ඵලදායිතා කොමිෂන් සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**161.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ- අර්ථ නිරූපණය

"තැනැත්තා" යන්නට සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් හෝ තැනැත්තකු ඇතුළත් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නට ආණ්ඩුවේ අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ මූල්‍යමය දායකත්වය සහිතව යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් නියෝජ්‍යායතනයක් ඇතුළත් වේ; සහ

"අදාළ අධිකාරීන්" යන්නට අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුව ඇතුළත් වේ.

## VI වන කොටස

### XXXIII වන පරිච්ඡේදය

### ශ්‍රී ලංකා ආර්ථීක විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම

ශ්‍රී ලංකා ආර්ථීක විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම

**162.** (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආර්ථීක විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද, ඊට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ආයතනයේ අරමුණු

**163.** ආයතනයේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) ආර්ථීක විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ වන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා වේදිකාවක් සේ ක්‍රියා කිරීම;

(ආ) ආර්ථීක විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම යන ක්ෂේත්‍රවලට අදාළ වැදගත් පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සැපයීම;

(ඇ) ආර්ථීක විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ප්‍රතිපත්ති සහ සංකල්ප ප්‍රබෝධමත් කිරීම සඳහා අදහස් සැපයීම; සහ

(ඈ) ඵලදායී ජාත්‍යන්තර වෙළෙඳාම සහ කලාපීය වෙළෙඳාම ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ කිරීම.

ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**164.** ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ රජයේ නිලධරයන් සහ

පෞද්ගලික අංශයේ නියෝජිතයන් අතර, ආර්ථික විද්‍යා, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳ අධ්‍යයන කටයුතුවල දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා වූ පියවර ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන් අතර, ආර්ථික විද්‍යා, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා සම්මන්ත්‍රණ, දේශන, මුහුණට මුහුණලා සිදු කෙරෙන පුහුණු, අධ්‍යයන චාරිකා, වෘත්තිකයන් හුවමාරු කිරීම්, සමපදස්ථ අධ්‍යයනය සහ වෙනත් ක්‍රම පිළියෙල කිරීම;

(ඇ) දේශපාලන නායකයන්, රජයේ නිලධරයන්, ශාස්ත්‍රඥ සමාජය, ව්‍යාපාර නායකයන්, දායක නියෝජ්‍යායතන සහ ගෝලීය ආයතනවල සාමාජිකයන් අතර, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම යන අධ්‍යයන ක්ෂේත්‍රවල සංවාදය සහ හවුල්කාරීත්වය අභිවර්ධනය කිරීම;

(ඈ) උපදෙස් ලබා දීම සඳහා සහ පුහුණු ක්‍රියාකාරකම්වලට සහභාගි වීම සඳහා ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම යන ක්ෂේත්‍රවල දේශීය සහ ගෝලීය වශයෙන් කීර්තියක් ලද බුද්ධි මණ්ඩලවල නායකයන්, විශේෂඥයන්, ශාස්ත්‍රඥයන් සහ ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත සම්පත් දායකයන් සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම;

(ඉ) දේශීය බුද්ධි මණ්ඩල සමඟ සහයෝගිතාවයෙන් යුතුව ඇතුළුව පාර්ලිමේන්තුව සහ රාජ්‍ය ආයතන වෙනුවෙන් පුහුණු කිරීම් සහ පර්යේෂණ සිදු කිරීම සහ පර්යේෂණ

ප්‍රතිඵල, ආණ්ඩුවේ පාර්ශ්වකරුවන්ගේ සැලසුම් අභ්‍යාසවලට ඇතුළත් කරනු ලැබිය හැකි පරිදි, ඉටු කරගනු ලැබිය හැකි ක්‍රියා සැලසුම් බවට පරිවර්තනය කිරීම;

(ඊ) මුදල් ලෙස හෝ ද්‍රව්‍යමය ලෙස ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම:

එසේ වුව ද, ආයතනය වෙත සිදු කරනු ලබන සියලුම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් ආයතනය විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(උ) ආයතනය විසින් උචිත යයි සලකනු ලබන යම් බැංකුවක යම් ගිණුමක් විවෘත කර පවත්නා ගෙන යාම සහ එකී ගිණුම, පවත්නා අදාළ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු වීම;

(ඌ) ආයතනයේ අරමුදල කළමනාකරණය කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(එ) ආයතනයට හිමි, මේ කොටසේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ යම් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීම;

(ඒ) යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඔ) ඍජුව හෝ ආයතනයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් වක්‍ර ලෙස ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ම යම් ගිවිසුම් හෝ එකඟතාවලට එළඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ඕ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ඣ) ආයතනය විසින් සපයන ලද යම් සේවාවක් සඳහා ගාස්තු හෝ අය කිරීම් පැනවීම;

(ග) ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම, පාරිශ්‍රමික ලබා දීම සහ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ච) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම; සහ

(ජ) මේ කොටසේ අරමුණු ඉටු කර ගැනීම සඳහා හෝ මේ කොටස යටතේ ආයතනය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආනුෂංගික හෝ හේතු විය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

XXXIV වන පරිච්ඡේදය

## ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

ආයතනය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

**165.** (1) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ කොටසේ "ආයතන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, ආයතන මණ්ඩලය විසින්, මේ කොටස මගින් ආයතනය වෙත පිරිනමනු ලැබ ඇති, පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

ආයතන මණ්ඩලය පිහිටුවීම

**166.** ආයතන මණ්ඩලය-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම්:-

(i) භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවක අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක නිලධරයකු විය යුතු, ඔහුගේ නාමිකයකු, ;

(ii) ආර්ථික කොමිෂන් සභාවේ නාමිකයකු;

(iii) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ තානාපතිවරයා; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳ අධ්‍යයනය යන ක්ෂේත්‍රයන්ගෙන් එකක හෝ වැඩි ගණනක අධ්‍යාපනික සහ වෘත්තීමය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත සාමාජිකයන් තිදෙනකුගෙන්; සහ

(ඇ) පහත දැක්වෙන නම් කරන ලද සාමාජිකයන්:-

(i) (289 වන අධිකාරය වූ) ලංකා වාණිජ මණ්ඩල ආඥාපනත මගින් පිහිටුවන ලද ලංකා වාණිජ මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයකුගෙන්;

(ii) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් නම් කරනු ලබන සාමාජිකයකුගෙන්; සහ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකුගෙන්,

සමන්විත විය යුතු ය.

**167.** (1) අමාත්‍යවරයා විසින්, පත් කරන ලද සාමාජිකයන් අතරින් එක් අයකු ආයතන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

ආයතන මණ්ඩලයේ සභාපතිවරයා

(2) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, ලිඛිතව හේතු දක්වා සභාපතිවරයා, සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු විසින් ආයතන මණ්ඩලයේ සාමාජිකත්වය දරනු ලබන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය තාවකාලිකව ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් වෙනත් යම් පත් කළ සාමාජිකයකු ඒ පත් කළ සාමාජිකයාගේ සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

**168.** යම් තැනැත්තකු -

ආයතන මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තුවේ හෝ යම් පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ බලාත්මකව පවතින යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ, වස්තු භංගත්වයෙන් හෝ බුන්වත් භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු වන්නේ නම්;

(ඉ) අන්තරායදායක ඖෂධ, මාදක හෝ මනෝ වර්තක හෝ වංචා සම්බන්ධයෙන් වන වරදකට අදාළව පවත්වාගෙන යනු ලබන විමර්ශනයකට යටත්ව සිටින්නකු වන්නේ නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද මාස හයකට වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(උ) ආයතනය විසින් හෝ ආයතනය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඌ) ආයතන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ඔහු විසින් ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවයක් ඇත්නම්,

ඒ තැනැත්තා ආයතන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගට ම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

ධුර කාලය

**169.** ආයතන මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම, ධුරයෙන් ඉල්ලා අස්වීම, මිය යාම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම මගින් ඔහු විසින් කලින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අනුගාමී හෝ අනන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

**170.** (1) ආයතන මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකුට, රෝගාතුර වීම, අශක්නුතාවකට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 166 වන සහ 168 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයකු, ලිඛිතව හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු ආයතන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් ආයතන මණ්ඩලයට සේවය කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(4) යම් පත් කළ සාමාජිකයකු මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සිදුවන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 166 වන සහ 168 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කළ තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවා ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

ආයතන මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම්

**171.** (1) ආයතන මණ්ඩලයේ රැස්වීම්, සෑම මසකට ම වරක්වත් පවත්වනු ලැබිය යුතු අතර, ආයතන මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය.

(2) සභාපතිවරයා විසින් ආයතන මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. ආයතන මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාපත් කරගනු ලබන සාමාජිකයකු එකී රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(3) ආයතන මණ්ඩලයේ රැස්වීමක් -

(අ) රැස්වීම සඳහා නියම කර ගනු ලැබූ ස්ථානයේ, දිනයේ සහ වේලාවේ දී රැස්ව සිටින, ගණපූරණය සංස්ථාපනය කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) රැස්වීමට සහභාගී වන සහ ගණපූරණය සංස්ථාපනය කරන සියලු සාමාජිකයන්හට, රැස්වීම පවත්වනු ලබන කාලසීමාව තුළ රැස්වීමට සහභාගී වන එක් එක් සාමාජිකයා සමගාමීව දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන ක්‍රම මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) ආයතන මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එකී රැස්වීමට සහභාගී වී සිටින සාමාජියකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ මුලසුන දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, ආයතන මණ්ඩලයේ රැස්වීම් සහ එකී රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය ආයතන මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත ආයතනයේ ක්‍රියා හෝ කටයුතු බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු බව

**172.** ආයතන මණ්ඩලය විසින්, ස්වකීය සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද, එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, ආයතන මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් බලරහිත නොවිය යුතු ය; නැතහොත් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

**173.** අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත ආයතන මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. ආයතන මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**174.** (1) ආයතනයේ මුද්‍රාව - ආයතනයේ මුද්‍රාව

(අ) ආයතන මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) ආයතන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) ආයතන මණ්ඩලයේ අවසරය නොමැතිව සහ සභාපතිවරයා සහ ආයතන මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මණ්ඩලයේ මුද්‍රාව තබන විට සභාපතිවරයාට පැමිණීමට නොහැකි වන අවස්ථාවක දී, තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ආයතන මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුහට, මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට අනුව ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කිරීමට නිසි බලය තිබිය යුතු ය.

(2) ආයතනය විසින්, ආයතනයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

## XXXV වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය

ආයතනයේ අධ්‍යක්ෂවරයා පත් කිරීම

**175.** (1) අමාත්‍යවරයා විසින්, ආයතන මණ්ඩලය විමසා පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂවරයකු සිටිය යුතු ය. අධ්‍යක්ෂවරයා මිය යාම, නීතිය ක්‍රියාත්මක වීම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ඔහු විසින් කලින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, වසර පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, අනුගාමී හෝ අනන්‍යාකාරයකින් වූ යම් උපරිම ධුර කාල දෙකකට යටත්ව ඒ ධුරය සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තාගේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ අධ්‍යක්ෂවරයාගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ආයතන මණ්ඩලයේ සාමාන්‍ය විධිවිධානයන්ට සහ අධීක්ෂණයට යටත්ව අධ්‍යක්ෂවරයා විසින්-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව ආයතනයේ කටයුතු පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය;

(ආ) ආයතන මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) ආයතන මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ක්‍රියාවට නැංවිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතන මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීම සහ කතා කිරීම කළ යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයා විසින්, ආයතන මණ්ඩලයේ අනුමතය ඇතිව, එසේ කිරීමට අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටක දී, මේ කොටස මගින් ඔහු වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලබන්නේ යම් නිලධරයකුට හෝ යම් සේවානියුක්තයකුට ද,

ඔහු විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂවරයාගේ විධානයකට යටත්ව ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා-

(අ) ස්වකීය කාර්ය කිරීමට ඔහු ස්ථිරව ම අපොහොසත් වන්නේ නම්;

(ආ) ආයතන මණ්ඩලය විසින්, වංචනිකව හෝ නීති විරෝධී ක්‍රියාවක් යයි තීරණය කරනු ලැබ ඇති යම් ක්‍රියාවක් හෝ ආයතනයේ සම්බන්ධතාවලට අගතියක් වන යම් ක්‍රියාවක් සිදු කර ඇත්නම්; හෝ

(ඇ) ආයතන මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූල වීමට අපොහොසත් වී ඇත්නම්,

අමාත්‍යවරයා විසින් ආයතන මණ්ඩලයේ නිර්දේශය මත ඔහුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමික

**176.** (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවානියුක්තයන් ආයතනය විසින් සේවයේ නියුක්ත කරවීම හෝ පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලයට, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, එසේ නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**177.** (1) ආයතනයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී තැනැත්තා විසින් ආයතනයේ සේවය කරනු ලබන යම් කාලසීමාවක්, එකී ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු ආයතනයට පත් කිරීම

178. (1) ආයතනයේ ඉල්ලීම පරිදි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු, ඒ නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එකී පත් කිරීම, ආයතනය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් සඳහා විය යුතු ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, ආයතනය විසින් සහ එකී ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවනු ලැබිය හැකි පරිදි විශ්‍රාම වැටුප් සහ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව යම් නියම සහ කොන්දේසි මත, එකී කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) යම් නිලධරයකු, (1) වන උපවගන්තිය යටතේ ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මෙන් එවැනි ම විනය පාලනයකට යටත් විය යුතු ය.

අනුශාසක කමිටුවක් පත් කිරීම

**179.** (1) ආයතන මණ්ඩලය විසින්-

(අ) මේ කොටස යටතේ ආයතන මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට සහාය දැක්වීම සඳහා අවශ්‍ය හෝ සුදුසු යයි සලකනු ලැබිය හැකි පරිදි අධ්‍යාපනික හෝ වෘත්තීමය සුදුසුකම් සහිත හෝ වෘත්තීයමය ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් නියෝජනය කරනු ලබන තැනැත්තන් අතරින් තෝරාගත් තැනැත්තන්ගෙන් සමන්විත අනුශාසක කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) ආයතන මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලයෙන් පරිබාහිරව උපදේශකවරුන් හෝ අනුශාසකවරයන් වශයෙන් යම් විශේෂඥයකුගේ සේවාව ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අනුශාසක කමිටුවට අවශ්‍ය යයි ආයතන මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි පරිදි වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ආයතන මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි නමුත්, ආයතන මණ්ඩලය විසින් එසේ පවරන ලද එකී බලතල, කාර්ය හෝ කර්තව්‍ය අහිමි කර ගැනීම සිදු නොකළ යුතු ය. ආයතන මණ්ඩලයට, අනුශාසක කමිටුව විසින් සාදන ලද යම් තීරණයක් සංශෝධනය කිරීමේ හෝ නිශ්ප්‍රභ කිරීමේ බලතල තිබිය යුතු ය.

(3) (අ) සම්බන්ධතා අතර ගැටුමක් ඇති තැනැත්තකු හෝ මේ කොටස යටතේ ආයතන මණ්ඩලය විසින් ගනු ලැබිය යුතු යම් තීරණයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතීන් කෙරෙහි අයුතු බලපෑමක් ක්‍රියාත්මක කිරීමට හැකි තත්ත්වයක සිටින

තැනැත්තකු, (1) වන උපවගන්තිය යටතේ අනුශාසක කමිටුවේ සාමාජිකයකු ලෙස හෝ විශේෂඥයකු ලෙස පත් නොකරන බවට සහතික වීම ආයතන මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ කාර්යය සඳහා "අයුතු බලපෑම" යන්නෙන්, සාමාන්‍ය තත්ත්ව යටතේ ආයතන මණ්ඩලය විසින් ස්වකීය කැමැත්තෙන් ගනු නොලබන ආකාරයේ තීරණයක් ගැනීමට ආයතන මණ්ඩලය මෙහෙයවීම හෝ ආයතන මණ්ඩලයට බල කිරීම අදහස් වේ.

(4) (1) වන උපවගන්තිය යටතේ වන අනුශාසක කමිටුවේ සාමාජිකයන්ට සහ යම් විශේෂඥයකුට, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දීමනාවක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) ආයතන මණ්ඩලය විසින් අනුශාසක කමිටුවේ රැස්වීම්වලට අදාළ ක්‍රියාපටිපාටිය, සහ එකී රැස්වීම්වල කටයුතු සඳහා රීති සාදනු ලැබිය යුතු ය.

උපදේශක කණ්ඩායම සහ මෙහෙයුම් කණ්ඩායම

**180.** (1) මේ කොටසේ කාර්ය සඳහා ආයතන මණ්ඩලය විසින් ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දැනුම ලබාදෙන විශ්වවිද්‍යාල හෝ රාජ්‍ය ආයතනවලින් සහ පෞද්ගලිකව අරමුදල් සපයාගනු ලබන ස්වාධීන බුද්ධි මණ්ඩලවලින් උපදේශක කණ්ඩායමක් සහ මෙහෙයුම් කණ්ඩායමක් ද්විතීයනය පදනම මත පත් කරනු ලැබිය හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි, උපදේශක කණ්ඩායමට සහ මෙහෙයුම් කණ්ඩායමට පත් කරන ලද යම් තැනැත්තකු මේ කොටසේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණ මත උපදේශක කණ්ඩායමේ සහ මෙහෙයුම් කණ්ඩායමේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

## XXXVI වන පරිච්ඡේදය

### මුදල්

181. (1) ආයතනයට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල

(2) (අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ කොටස යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනයට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කුමන හෝ යම් මූලාශ්‍රයකින් ආදායම්, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලෙස ආයතනයට ලැබිය හැකි සියලු ම මුදල් ප්‍රමාණයන්:

එසේ වුව ද, ආයතනය විසින්, ආයතනය වෙත කරන ලද සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය,

අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (අ) මේ කොටස යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ කොටස මගින් හෝ මේ කොටස යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට අවශ්‍ය සියලු මුදල්,

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**182.** (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආයතන මණ්ඩලය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

(4) ආයතන මණ්ඩලය විසින්, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය, විගණකවරයාගේ වාර්තාව සමඟ එකී වාර්තාව අදාළ වන මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින එකසිය පනහක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින්, එකී ප්‍රකාශය සහ වාර්තාව ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත එකී ප්‍රකාශය සහ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## XXXVII වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

මේ කොටස යටතේ ගනු ලැබූ නඩු කටයුතුවලින් ආරක්ෂාව

**183.** ආයතන මණ්ඩලයේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂවරයා, ආයතනයේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ අනුශාසක කමිටුවේ, උපදේශක කණ්ඩායමේ සහ මෙහෙයුම් කණ්ඩායමේ යම් සාමාජිකයකු මේ කොටස යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි, ආයතනයේ හෝ ආයතන මණ්ඩලයේ විධානය යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක්, එකී ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් සිදු කරන ලද බව සහ නිසි උද්‍යෝගයෙන්, සාධාරණ සැලකිල්ලෙන් සහ නිපුණතාවයෙන් ඉටු කරන ලදැයි ඔප්පු කරනු ලැබුවහොත් ඔහුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

රහස්‍යභාවය පවත්වාගෙන යාමේ වගකීම

**184.** (1) ආයතන මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, අධ්‍යක්ෂවරයා සහ ආයතනයේ සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් ම හෝ අනුශාසක කමිටුවේ, උපදේශක කණ්ඩායමේ හෝ මෙහෙයුම් කණ්ඩායමේ සෑම සාමාජිකයකු ම, සිය ධුරයේ කාර්ය ආරම්භ කිරීමට පෙරාතුව මේ කොටස යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමා වෙත ලැබුණු හෝ තමා වෙත දැන ගැනීමට ලැබුණු යම් තොරතුරු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ අවකාශ සලසා ඇති ප්‍රමාණයට, මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හැර හෙළිදරව් නොකරන බවට වන ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරනු ලබන යම් තැනැත්තකු විසින් මේ කොටස යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

දත්ත සමුදායයන්

**185.** (1) ආයතනය විසින්, මේ කොටසේ විධිවිධාන යටතේ රැස්කරනු ලැබූ සියලු තොරතුරුවල දත්ත සමුදායයක් නිර්මාණය කර, කළමනාකරණය කර පවත්වාගෙන යා යුතු ය.

(2) ආයතනය විසින්, එහි සියලු දත්ත පද්ධතියන්හි සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන තාක්ෂණික ආරක්ෂණ පියවර ඇතුළු අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**186.** ආයතනය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

සාමාජිකයන්, අධ්‍යක්ෂවරයා, ආයතනයේ නිලධරයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**187.** ආයතන මණ්ඩලයේ, අනුශාසක කමිටුවේ, උපදේශක කණ්ඩායමේ සහ මෙහෙයුම් කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්, ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ සියලු ම නිලධරයන් සහ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන

**188.** අමාත්‍යවරයා විසින්, කලින් කලට, ආයතන මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන ආයතන මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

රීති

**189.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතන මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලු ම හෝ යම් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දෙන ලද හෝ නියම කරන ලද සියලු කාරණා;

(ආ) ආයතන මණ්ඩලයේ සහ උපදේශක කමිටුවේ රැස්වීම්වල සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියාපටිපාටිය; සහ

(ඇ) නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික සහ විනය පාලනය සහ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට නිවාඩු සහ වෙනත් වේතන ලබා දීම.

(2) ආයතනය විසින් සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

**190.** (1) අමාත්‍යවරයා විසින්, මේ කොටසේ ප්‍රතිපත්ති සහ විධිවිධාන සිදු කරගෙන යාමේ සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**191.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ- අර්ථ නිරූපණය

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ආයතනයේ විෂයය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

"බුද්ධි මණ්ඩලය" යන්නෙන්, ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළෙඳාම යන ක්ෂේත්‍රවල පර්යේෂණ සහ උපදේශනය සිදු කරනු ලබන ප්‍රතිපත්ති ආයතනයක් හෝ පර්යේෂණ ආයතනයක් අදහස් වේ.

## VII වන කොටස

## XXXVIII වන පරිච්ඡේදය

### විවිධ

**192.** (1) අමාත්‍යවරයා විසින් ආර්ථික කොමිෂන් සභාව විමසා මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීමේ දින සිට හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම ඒ යටතේ සාදන ලද කිසිවකට අගතියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම්

**193.** (1) (මේ පනතේ "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත ඉවත් කිරීම නොතකා-

(අ) වෙනත් යම් ලිඛිත නීතියක ඉවත් කරන ලද පනත සඳහා හෝ එහි යම් විධිවිධානයක් සඳහා කරන ලද සෑම සඳහනක් ම, අවස්ථාවෝචිත පරිදි, II වන කොටස, III වන කොටස හෝ මේ කොටස සඳහා වූ සඳහනක් හෝ II වන කොටසේ, III වන කොටසේ, හෝ මේ කොටසේ අන්තර්ගත අනුරූප විධිවිධානවලට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක බීඕඅයි සඳහා කරන ලද සෑම සඳහනක් ම, අවස්ථාවෝචිත පරිදි, II වන කොටසේ හෝ III වන කොටසේ අනුරූප විධිවිධානවල ආර්ථික කොමිෂන් සභාව හෝ සෝන්ස් එස්එල් සඳහා කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනත යටතේ බීඕඅයි හි මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරමින් සිටි සාමාජිකයන්, ආර්ථික කොමිෂන් සභාවේ මණ්ඩලයට II වන කොටස යටතේ නව මණ්ඩලයක් පත් කරන තෙක්, මේ පනතේ II වන කොටසේ, III වන කොටසේ සහ මේ කොටසේ කාර්ය සඳහා ආර්ථික කොමිෂන් සභාවේ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) බීඕඅයි විසින් නිකුත් කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සියලු අනුමතයන්, බලපත්‍ර, බලය ලබාදීම් සහ අවසර ලබා දීම්, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාව හෝ සෝන්ස් එස්එල් සහ ආයෝජකයා අතර එකඟ වූ පරිදි වන වෙනස් කිරීම්වලට යටත්ව දිගටම වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය;

(ඉ) ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ඊට පහසුකම් සැලසීම සඳහා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති අනුමතයන්, බලපත්‍ර, බලය ලබා දීම් සහ අවසර ලබා දීම් මෙන්ම එසේ එළඹෙන ලද සහ එසේ බලාත්මකව පවතින ගිවිසුම්, එකඟතාවයන් හෝ වෙනත් සාධන පත්‍ර, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාව හෝ සෝන්ස් එස්එල් සහ ආයෝජකයා අතර එකඟ වූ පරිදි වන වෙනස් කිරීම්වලට යටත්ව දිගට ම වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය;

(ඊ) ඉවත්කරන ලද පනත යටතේ සාදන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සියලු නියෝග, රීති, විධාන සහ නියම, ඒ නියෝග, රීති, විධාන සහ නියම මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ පනත යටතේ සාදනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර ඒ නියෝග, රීති, විධාන සහ නියම, මේ පනත යටතේ සාදනු ලබන නියෝග, රීති, විධාන සහ නියම මගින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය;

(උ) ඉවත් කරන ලද පනත ප්‍රකාරව බීඕඅයි හට අයත්ව පැවති හෝ බීඕඅයි හි සන්තකයේ පැවති-

(i) සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සියලු චංචල දේපළ සහ නිශ්චල දේපළ, (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාවේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය; නැතහොත් ආර්ථික කොමිෂන් සභාව සන්තකයේ පවතින බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ii) බලපත්‍රලත් කලාප සම්බන්ධයෙන් වූ සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සියලු චංචල සහ නිශ්චල දේපළ, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි සෝන්ස් එස්එල්හි දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය; නැතහොත් සෝන්ස් එස්එල් සන්තකයේ පවතින බවට සලකනු ලැබිය යුතු ය;

(ඌ) ඉවත් කරන ලද පනත යටතේ බීඕඅයි විසින් හෝ බීඕඅයි සමඟ එළඹෙන ලද-

(i) සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සියලු ගිවිසුම්, එකඟතාවයන් සහ වෙනත් සාධන පත්‍ර, (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, ආර්ථික කොමිෂන් සභාව විසින් හෝ ආර්ථික කොමිෂන් සභාව සමඟ එළඹෙන ලද ගිවිසුම්, එකඟතාවයන් සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති බීඕඅයි හි අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම්, II වන කොටස යටතේ ආර්ථික කොමිෂන් සභාවේ අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) බලපත්‍රලත් කලාප සහ ඒ තුළ පවතින ව්‍යාවසායයන් සම්බන්ධයෙන් වූ සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සියලු ගිවිසුම්, එකඟතාවයන් සහ වෙනත් සාධන පත්‍ර, සෝන්ස් එස්එල් විසින්

හෝ සෝන්ස් එස්එල් සමග එළඹෙන ලද ගිවිසුම්, එකඟතාවයන් සහ සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා සම්බන්ධයෙන් නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති බීඕඅයි හි සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම්, III වන කොටස යටතේ සෝන්ස් එස්එල් හි අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඵ) ඉවත් කරන ලද නීතියේ විධිවිධාන යටතේ-

(i) කරන ලද ඉල්ලීමක්, (ii) අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, II වන කොටස යටතේ පිහිටුවන ලද ආර්ථික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කළ යුතු ය; සහ

(ii) බලපත්‍රලත් කලාප සහ ඒ තුළ පිහිටි සහ ව්‍යවසායන්ට අදාළ ව කරන ලද ඉල්ලීමක්, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ III වන කොටස යටතේ පිහිටුවන ලද සෝන්ස් එස්එල් වෙත කරන ලද ඉල්ලීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඒ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බීඕඅයි හි අරමුදලේ බැරට පැවති සියලු මුදල් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ II වන කොටස යටතේ පිහිටුවන ලද ආර්ථික කොමිෂන් සභාවේ අරමුදල වෙත මාරු කරන ලද බවට සලකනු ලැබිය යුතු ය.

(ඔ) බීඕඅයි විසින් හෝ බීඕඅයිට එරෙහිව පවරා ඇති-

(i) සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලු සිවිල් නඩු, අපරාධ නඩු හෝ වෙනත් නීති කෘත්‍ය, (ii) වන අනුඡේදයේ විධිවිධානවලට, යටත්ව, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පවරන ලද සිවිල් නඩු, අපරාධ නඩු හෝ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ii) සෝන්ස් එස්එල් හි විෂයය පථය තුළට අයත් වන්නා වූ කාරණාවලට අදාළ සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, බලපත්‍රලත් කලාප හෝ ඒ තුළ පිහිටි ව්‍යාපාරයන් සම්බන්ධයෙන් පැවති සියලු සිවිල් නඩු, අපරාධ නඩු, හෝ වෙනත් නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ III වන කොටස යටතේ සෝන්ස් එස්එල් විසින් හෝ එයට එරෙහිව පවරන ලද සිවිල් නඩු, අපරාධ නඩු හෝ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ආර්ථික කොමිෂන් සභාවේ සහ සෝන්ස් එස්එල් යන දෙකෙහි ම විෂයය පථයට අයත් වන කාරණාවලට අදාළව බීඕඅයි විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබුවා වූ ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවතියා වූ ද යම් සිවිල් නඩුවක්, අපරාධ නඩුවක්, හෝ නීති කෘත්‍යයක් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ආර්ථික කොමිෂන් සභාව සහ සෝන්ස් එස්එල් යන දෙක ම විසින් හෝ ඒවාට එරෙහිව පවරන ලද සිවිල් නඩු , අපරාධ නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඕ) (i) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බීඕඅයි හි සම්බන්ධතා, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය හා බැරකම්, (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික කොමිෂන් සභාවේ සම්බන්ධතා, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති බලපත්‍රලත් කලාප සහ ව්‍යවසායයන් හි සම්බන්ධතා අයිතිවාසිකම්, වත්කම්, බැරකම්, ණය, සහ බැඳීම් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සෝන්ස් එස්එල් හි සම්බන්ධතා, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම් ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) (i) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද බීඕඅයි හි නිලධරයන් සහ සේවා නියුක්තයන්, ඔවුන් විසින් හිමිකම් කියන ලද සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි මත, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවානියුක්තයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය; සහ

(ii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද, බලපත්‍රලත් කලාපවලට අනුයුක්තව සිටි බීඕඅයි හි නිලධරයන් සහ සේවානියුක්තයන්, ඔවුන් විසින් හිමිකම් කියන ලද සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි මත නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සෝන්ස් එස්එල් හි නිලධරයන් සහ සේවානියුක්තයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සේවානියුක්තයාට ගෙවිය යුතු ව්‍යස්ථාමය ගෙවීම් ගණනය කිරීමේ දී, බීඕඅයි සමග ඒ සේවානියුක්තයා සේවය කරන ලද කාලසීමාව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ග) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද, ආර්ථික කොමිෂන් සභාවේ හෝ සෝන්ස් එස්එල් හි සේවයට සම්බන්ධ වීම තෝරා නොගන්නා බීඕඅයි හි නිලධරයන්ට සහ සේවානියුක්තතයන්ට, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු පරිදි වන ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් අනුව ගෙවිය යුතු යම් වන්දියක් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය නියමිත දිනයට පසු මාසයකට නොවැඩි දිනක දී පළ කරනු ලැබිය යුතු අතර, (ක) ඡේදය යටතේ ආර්ථික කොමිෂන් සභාවේ හෝ සෝන්ස් එස්එල් හි නිලධරයකු හෝ සේවානියුක්තයකු වශයෙන් සලකනු ලබන සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් ම, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය පළ කිරීමේ දිනයේ සිට මාසයක් ඇතුළත ඔහුගේ තෝරා ගැනීම සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ආර්ථික කොමිෂන් සභාව වෙත හෝ සෝන්ස් එස්එල් වෙත පැවරී ඇති බලතලවලට අගති විරහිතව, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාව විසින් හෝ සෝන්ස් එස්එල් විසින්, ඉවත් කරන ලද පනතේ අධිකාරි බලය ප්‍රකාරව පිහිටුවන ලද බල ප්‍රදේශ, බලපත්‍රලත් කලාප, බලපත්‍රලත් ව්‍යවසායයන් සහ ප්‍රාදේශීය ව්‍යවසායයන් සම්බන්ධයෙන් සහ ඊට අදාළව බීඕඅයි විසින් ක්‍රියාත්මක කරන ලද සියලු බලතල දිගට ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන් සභාව හෝ සෝන්ස් එස්එල් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සාමාන්‍ය බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව ඉවත් කරන ලද පනතේ 5, 16, 17, 18, 20, 20අ, 21, 22, 22අ සහ 24 වන වගන්ති යටතේ සඳහන් බලතල පූර්ණ බලය සහිතව දිගට ම ක්‍රියාත්මක කළ යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි, බල ප්‍රදේශ, බලපත්‍රලත් කලාප, බලපත්‍රලත් ව්‍යවසාය සහ ප්‍රාදේශීය ව්‍යවසාය කළමනාකරණය කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට අදාළව ආර්ථික කොමිෂන් සභාව හෝ සෝන්ස් එස්එල් විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන බලතල හෝ කර්තව්‍යක, මේ උපවගන්තියේ විධිවිධාන මගින් අඩු කිරීමක් සිදු නොවිය යුතු ය.

(4) බීඕඅයි විසින් සාදන ලදැයි සැලකෙන සියලු අතුරු නීති සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සහ ඉවත් කරන ලද පනතේ 21 වන සහ 22 වන වගන්ති යටතේ බීඕඅයි විසින් සාදන ලද සියලු අතුරු නීති සංශෝධනය කිරීමෙන්, පරිච්ඡින්න කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය සඳහා අතුරු නීති සෑදීමේ බලය ආර්ථික කොමිෂන් සභාවට තිබිය යුතු ය.

194. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ- අර්ථ නිරූපනය

"බල ප්‍රදේශය" යන්නෙන්, ඉවත් කරන ලද පනතේ 5 වන වගන්තියේ සඳහන් බල ප්‍රදේශය අදහස් වේ;

"ප්‍රාදේශීය ව්‍යවසාය" යන්නෙන්, ඉවත් කරන ලද පනතේ 17 වන වගන්තිය යටතේ බීඕඅයි විසින් ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ද, බල ප්‍රදේශය තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නා වූ ද, නැතහොත් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට යෝජනා කර ඇත්තා වූ ද ව්‍යවසායයක් අදහස් වේ;

"බීඕඅයි" යන්නෙන්, ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන් සමාගම්වලට, සමුපකාර සමිතිවලට, ව්‍යාපාරවලට අදාළව බලපවත්නා

යම් නීතියක් යටතේ කුමන හෝ ස්ථානයක ලියාපදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සහ බීඕඅයි හි මතය අනුව බීඕඅයි හි අරමුණු ඉටු කරගත හැකි හෝ ඉටු කර ගැනීමට සහාය වනු ඇති යම් ව්‍යාපාරයක නියැලී සිටින හෝ නියැලීමට යෝජනා කරන තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ සමුපකාර සමිතියක් අදහස් වේ;

"බලපත්‍රලත් කලාප" යන්නෙන්, ඉවත් කරන ලද පනතේ 5 වන වගන්තියේ සඳහන් බලපත්‍රලත් කලාප අදහස් වේ;

"බලපත්‍රලත් ව්‍යවසාය" යන්නෙන්, ඉවත් කරන ලද පනතේ 5 වන වගන්තියේ සඳහන් බලපත්‍රලත් ව්‍යවසාය අදහස් වේ;

II වන සහ III වන කොටස්වල සහ මේ කෙටසේ කාර්යය සඳහා "අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ ආර්ථික කොමිෂන් සභාවට සහ සෝන්ස් එස්එල්ට අදාළ වන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"කලාප සංවර්ධකයා" යන්නෙන්, ආයෝජන කලාපයක සංවර්ධනය පවරා ඇති තැනැත්තකු අදහස් වේ; සහ

"කලාප ක්‍රියාකරු" යන්නෙන්, සංවර්ධනය කරන ලද ආයෝජන කලාපයක් කළමනාකරණය කරනු ලබන තැනැත්තකු අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**195.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.